# වාර්ෂික වාර්තාව

# 2023

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

අංක 117, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල,

නුගේගොඩ

# පටුන


- සභාපතිතුමාගේ පණිවුඩය 03
- ආයතනයේ දර්ශනය හා මෙහෙවර ප්‍රකාශය 05
- අධ්‍යක්ෂ මණ්ඩලය 06
- ආයතනයේ සංවිධාන ව්‍යුහය 07
- පෙරවදන 08

අංශභාර අධ්‍යක්ෂවරුන්ගේ වාර්තා

- මෙහෙයුම් අංශය 10
- රක්ෂණ අංශය 15
    - කෘෂිකාර්මික රක්ෂණ කටයුතු සහ පශු සම්පත් රක්ෂණ කටයුතු
- විශ්‍රාම වැටුප් අංශය 18
    - ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය හා
    - ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- පරිපාලන හා මානව සම්පත් අංශය 25
- අභ්‍යන්තර විගණන අංශය 34
- සැලසුම් අංශය 37
- තොරතුරු තාක්ෂණ අංශය 44
- මුදල් අංශය 48

ගිණුම්

- පෙර වසර පහක මූල්‍ය තොරතුරු 50
- සමස්ථ යෝජනා ක්‍රම සඳහා ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශන හා කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය 54
- ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය 81
- ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය 100

විගණකාධිපති වාර්තා 119

- කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය
- ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

විගණකාධිපති වාර්තා සඳහා පිළිතුරු 147

- කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය
- ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

## ගරු සභාපතිතුමාගේ පණිවිඩය

පසුගිය වර්ෂයේදී ගොවි හා ධීවර ජනතාවගේ රක්‍ෂණ හා ආරක්‍ෂණ පහසුකම් ඉහල නැංවීම සම්බන්ධයෙන් ආරම්භ කරන ලද ක්‍රියාවලිය 2023 වර්ෂයේදී වඩාත් ප්‍රශස්ත මට්ටමින් මෙහෙයවීම හරහා අනිකුත් රක්ෂණ ආයතන සමඟ තරඟකාරීත්වයක් ඇති කිරීම තුලින් මණ්ඩලයේ නාමය ඉහල මට්ටමකට ගෙන ඒම සඳහා විවිධ වැඩසටහන් හා සැලසුම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව 1999 අංක 20 දරණ කෘෂිකාර්මික හා ගොවිජන රක්‍ෂණ පනත, 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්‍ෂණ ප්‍රතිලාභ පනත සහ 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්‍ෂණ පනත මඟින් ලබාදී ඇති ප්‍රතිපාදන අනුව තවදුරටත් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී.

ඉහත කටයුතු විධිමත් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා නව තාක්ෂණය ඔස්සේ මණ්ඩලයේ කටයුතු ඩිජිටල්කරණය කිරීමේ අත්‍යාවශ්‍යතාවය පිළිබඳව මූලික වශයෙන් සැලකිල්ලට භාජනය කර වසර ගණනාවක් මුළුල්ලේ එම අවශ්‍යතාවය සම්පූර්ණ කරගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග වල ප්‍රතිඵලයක් ලෙස යුරෝපීය සංගමය සහ GIZ ජර්මානු සංවිධානය විසින් ලබා දුන් මූල්‍ය දායකත්වය මගින් එම කටයුතු ආරම්භ කර ගැනීමට හැකිවූ අතර එය මණ්ඩලය ලැබූ විශාල ජයග්‍රහණයක් ලෙස දැක්විය හැක.

මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන රක්‍ෂණ යෝජනා ක්‍රම වඩාත් පහසුවෙන් ගොවිජනතාව වෙත ලබාදීම සඳහා තෙවන පාර්ශව රක්‍ෂණ පහසුකම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ක්‍රියාත්මක කිරීමේ කටයුතු වඩාත් පුළුල් කිරීමට කටයුතු කිරීම හා තවදුරටත් ඒ පිළිබඳව අවධානය යොමුකර තැපැල් කාර්යාල මඟින්ද තෙවන පාර්ශව රක්‍ෂණ පහසුකම් ලබාදීමේ පහසුකම් 2023 වර්ෂයේදී ආරම්භ කරන ලදී.තවද, ජීවිත රක්‍ෂණ යෝජනා ක්‍රමයක් ආරම්භ කිරීම සම්බන්ධයෙන් මූලික අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ගැනීමේ කටයුතු මෙම වසරේදී ආරම්භ කරන ලදී.

කාර්ය මණ්ඩල පුහුණු අවශ්‍යතා හදුනාගෙන පසුගිය වර්ෂයේදී සකස්කරන ලද පුහුණු කැලැන්ඩරයකට අනුව සියළුම සේවා ගණයන්ට අදාල කාර්ය මණ්ඩල සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම 2023 වර්ෂය මුළුල්ලේම ක්‍රියාවට නැංවීමට කටයුතු කරන ලදී.

ගොවි හා ධීවර විශ්‍රාම වැටුප් ගෙවීම් සම්බන්ධයෙන් ගත්කල 1987 දී ක්‍රියාත්මක කරන ලද ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ 2023 වර්ෂය අවසාන වන විට විශ්‍රාම ලාභීන් 175,006 වෙනුවෙන් රු. 4,375,215,623/- ක මුදලක් විශ්‍රාම වැටුප් වශයෙන් ගෙවන ලදී. 2022.10.31 දින ආරම්භ කරන ලද නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ 2023.12.31 දින වන විට ගොවීන් 2166 ප්‍රමාණයක් දායකත්වය ලබාගෙන ඇති අතර ඔවුන් වාරික වශයෙන් ගෙවා ඇති මුදල රු. 20,730,787 කි.

මීට අමතරව මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන තෙවන පාර්ශවීය රක්ෂණ යෝජනා ක්‍රමය ඇතුළු අනෙකුත් රක්ෂණ යෝජනා ක්‍රමයන්ගෙන් පෙර වර්ෂයට සාපේක්ෂව 29% ක වර්ධනයක් එනම් රු.මිලියන 502 ක් 2023 වර්ෂයේදී උපයා ගැනීමට මණ්ඩලයට හැකිවිය. ඒ අනුව මණ්ඩලය වැටුප් හා දීමනා, පරිපාලන වියදම් ආදී කටයුතු සිදුකරමින් තවදුරටත් ස්වයං මූල්‍ය පදනමක් යටතේ පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.

කෘෂිකාර්මික හා ගොවිජන රක්‍ෂණ මණ්ඩලය විසින් 2023 වර්ෂයේදී කෘෂි රක්‍ෂණ යෝජනා ක්‍රමය මඟින් රු.මිලියන 769 ක ශුද්ධ ලාභයක් උපයාගෙන ඇති අතර, මෙම වර්ෂයේ උපයාගෙන ඇති මෙහෙයුම් ලාභය රු.මි. 1,268 කි. 2021/22 මහ කන්නයේ, 2022 යල කන්නයේ සහ 2023 මහකන්නයේ සිදුවූ වගා හානි වෙනුවෙන් 2023 වර්ෂයේදී අනිවාර්යය වගා රක්‍ෂණ වන්දි රු.මිලියන 2,116./- ක වන්දි මුදලක් වගා හානි ලෙස ගොවීන් වෙත නිදහස් කර ඇත.

2023 වර්ෂය පිළිබඳව සළකා බැලීමේදී පෙර වර්ෂ වලට වඩා මණ්ඩලයේ කටයුතු වල සැලකිය හැකි වර්ධනයක් ලබාගැනීමට හැකිවූ අතර නව තාක්‍ෂණයට අනුව කටයුතු කිරීමේ මූලාරම්භය සනිටුහන් කිරීමට හැකිවූ සාර්ථක වසරක් ලෙස දැක්විය හැක.

සභාපති,

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

# කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

## ➢ දැක්ම ..

**දේශීය කෘෂිකර්මාන්තයේ අග්‍රගන්‍ය රැකවලා වීම තුළින් දකුණු ආසියාවේ පරමාදර්ශී කෘෂි රක්ෂණ ආයතනය වීම.**

## ➢ මෙහෙවර ..

**කෘෂිකාර්මික රක්ෂණය සහ ආරක්ෂණය සැලසීම සඳහා සාමූහික ප්‍රයත්නයන් හා අදාල ආයතන සම්බන්ධීකරණය තුළින් ජාත්‍යන්තරව පිළිගත හැකි විශිෂ්ඨ සේවාවක් සැපයීම.**

## අධ්‍යක්ෂ මණ්ඩලය - 2023

| | නම | තනතුර |
|---|---|---|
| 01 | ඩබ්. එම්.එම්.බී. වීරසේකර මහතා<br>සභාපති<br>කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | සභාපති |
| 02 | පී. මාලතී<br>අධ්‍යක්ෂ ජනරාල්<br>කෘෂිකර්ම දෙපාර්තමෙන්තුව | සාමාජික |
| 03 | ආර්.එම්.ඩී.කේ.ජී.එන්.ඩී. රණතුංග<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)<br>භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | සාමාජික |
| 04 | ආචාර්ය සී.එන්.එස්. ගමගේ මහතා<br>අධ්‍යක්ෂ (පශු සම්පත් දෙපාර්තමේන්තුව) (රාජ්‍ය අමාත්‍යාංශය)<br>පශු සම්පත් රාජ්‍ය අමාත්‍යාංශය, සත්ව පාලනය<br>ප්‍රවර්ධනය සහ කිරි සහ බිත්තර ආශ්‍රිත කර්මාන්ත | සාමාජික |
| 05 | ඒ.එච්.එම්.එල්. අබේරත්න මහතා<br>කොමසාරිස් ජනරාල්<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | සාමාජික |
| 06 | ආර්.ඒ.ඩී.එස්. රණතුංග මහතා<br>අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණික)<br>ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය<br>නව ලේකම් කාර්යාලය | සාමාජික |
| 07 | ජී.ජී. ධනංජය නන්දසිරි මහතා<br>සහකාර උප සභාපති<br>ශාඛා කළමනාකරු, මාතර ශාඛාව<br>ලංකා බැංකුවේ සංවර්ධන මූල්‍ය සංස්ථාව | සාමාජික |
| 08 | තිලක්ෂි එන්. ගුණසේකර මහත්මිය<br>අතිරේක ලේකම් (පාලන හා මානව සම්පත්)<br>කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය<br><br>කේ.සී. නිරෝෂන් මහතා<br>අතිරේක ලේකම් (සංවර්ධන)<br>පොහොර අංශය<br>කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | සාමාජික |
| 09 | එස්. එම්.ජී. සමරකෝන්<br>120, හුරුල්මීගහපිටිය,<br>මෙගොඩවැව,<br>අනුරාධපුර | සාමාජික |

# ආයතනික ව්‍යුහය

## කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය



# පෙරවදන

කෘෂිකර්මාන්තයේ තිරසර සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක වන්නා වූ ජාතික වැඩපිළිවෙලේදී කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය දැවැන්ත කාර්ය භාරයක් ඉටු කරනු ලබයි.

එහි ප්‍රමුඛතම කාර්යය ලෙස අවදානම් කළමණාකරණයේදී කෘෂිකාර්මිකයා වෙනුවෙන් මැදිහත් පාර්ශවකරුවෙකු ලෙස සම්බන්ධ වීම විශේෂයෙන් වැදගත් වේ. මෙහිදී කෘෂිකාර්මිකයාගේ බෝගවල අවදානම භාරගැනීමට අමතරව කෘෂිකාර්මිකයින්ගේ රථවාහන, උපකරණ හා ගබඩා වෙනුවෙන්ද ආවරණය සලසමින් කෘෂිකාර්මිකයාගේ සමාජ ආරක්ෂණය උදෙසා කටයුතු කිරීමද විශේෂ වේ.

කෘෂිකාර්මිකයාගේ මෙන්ම කෘෂිකර්මාන්තයේ තිරසර ප්‍රවර්ධනය උදෙසා රටේ ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය වඩාත් ස්ථාවර සහ වේගවත් කිරීමේ අරමුණින් කෘෂිකර්ම අමාත්‍යාංශය මූලික කරගනිමින් රජය මඟින් කෘෂිකාර්මිකයින් උදෙසා ක්‍රියාත්මක කළ පොහොර සහනාධාරය වැනි ගොවීන් උදෙසා ක්‍රියාත්මක කළ පහසුකම් දිරි ගැන්වීම් යටතට දිවයිනේ වගා කරන ප්‍රධාන බෝග වර්ග 06ක් සඳහා 2018 යල කන්නයේ ආරම්භ කරන ලද නොමිලයේ ලබාදුන් අනිවාර්ය රක්ෂණ ක්‍රමය 2023 වර්ෂය තුළද ක්‍රියාත්මක විය.

**වාර්ෂික වාරික ආදායම 2019 සිට 2023 දක්වා**

| රක්ෂණ ක්‍රමය | 2019 (රු.මිලි.) | 2020 (රු.මිලි.) | 2021 (රු.මිලි.) | 2022 (රු.මිලි.) | 2023 (රු.මිලි.) |
|---|---|---|---|---|---|
| වගා රක්ෂණ යෝජනා ක්‍රම | 61.11 | 45.89 | 74.24 | 55.71 | **100.70** |
| පශු සම්පත් රක්ෂණ යෝජනා ක්‍රමය | 7.87 | 5.78 | 11.07 | 5.25 | **15.59** |
| ගබඩා/ කෘෂි උපකරණ හා තෙවන පාර්ශවීය රක්ෂණ යෝජනා ක්‍රම | 220.15 | 278.94 | 296.50 | 311.04 | **353.44** |
| සුවසෙත හා හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රම | 9.42 | 13.78 | 9.04 | 18.55 | **32.30** |
| එකතුව | 298.55 | 344.39 | 390.85 | 390.55 | **502.03** |

**වාර්ෂික ශුද්ධ ලාභය 2019 සිට 2023 දක්වා**

| **කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය (සමූහය)** | | | | | |
|---|---|---|---|---|---|
| | **2019 (රු.මිලි.)** | **2020 (රු.මිලි.)** | **2021 (රු.මිලි.)** | **2022 (රු.මිලි.)** | **2023 (රු.මිලි.)** |
| මුළු ආදායම | 3,603.98 | 3,724.63 | 3,655.16 | 3,676.44 | **3,848.42** |
| මෙහෙයුම් වියදම | (5,825.46) | (6,800.28) | (5,550.40) | (9,493.46) | **(11,775.60)** |
| මෙහෙයුම් අතිරික්තය | (2,221.49) | (3,075.65) | (1,895.24) | (5,817.01) | **(7,927.18)** |
| රාජ්‍ය ප්‍රදාන හා අනෙකුත් අදායම | 3,215.52 | 4,661.08 | 4,011.14 | 4,167.82 | **4,619.45** |
| අනෙකුත් වියදම් (වෙන් කිරීම්ද ඇතුළත්ව) | (4,499.33) | (4,667.95) | (4,816.70) | (694.02) | **(682.12)** |
| වාර්ෂික ශුද්ධ ලාභය/ අලාභය | (3,505.30) | (3,083.72) | (2,700.79) | (2,343.21) | **(3,989.87)** |

| කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය | | | | | |
|---|---|---|---|---|---|
| | 2019 (රු.මි.) | 2020 (රු.මි.) | 2021 (රු.මි.) | 2022 (රු.මි.) | 2023 (රු.මි.) |
| මුළු ආදායම | 3,365.07 | 3,530.41 | 3,456.90 | 3,432.32 | **3,488.25** |
| මෙහෙයුම් වියදම | (2,487.01) | (2,129.08) | (1,704.90) | (769.18) | **(2,220.02)** |
| මෙහෙයුම් අතිරික්තය | 878.06 | 1,401.34 | 1,752.00 | 2,663.14 | **1,268.23** |
| රාජ්‍ය ප්‍රදාන හා අනෙකුත් අදායම් | 9.14 | 8.30 | 8.16 | 6.75 | **14.35** |
| අනෙකුත් වියදම් (වෙන් කිරීම්ද ඇතුළුව) | (234.86) | (255.96) | (265.81) | (462.08) | **(405.30)** |
| වාර්ෂික ශුද්ධ ලාභය/ අලාභය | 652.34 | 1,153.68 | 1,494.36 | 2,207.80 | **877.28** |

2023 වර්ෂය තුළදී මණ්ඩලයේ ආදායමේ කැපී පෙනෙන ප්‍රගතියක් අත්පත් කර ගැනීමට සියළුම රක්‍ෂණ ක්‍රම සමත් වී ඇත. 2022 වර්ෂයේ රුපියල් මිලියනක් 390.55 වූ ආදායම 2023 වර්ෂය අවසානයේදී රුපියල් මිලියන 502.03 දක්වා වර්ධනය කර ගැනීම මෙම වර්ෂයේ විශේෂ විය. දිස්ත්‍රික් මට්ටමින් පුළුල් අලෙවි සහ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළ සියළුම යෝජනා ක්‍රම සම්බන්ධයෙන් විශ්වාසය කෘෂිකාර්මිකයින් තුළ ඇති කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම ප්‍රගතිය අත්පත් කරගත හැකිවිය. මේ මඟින් උපයාගත් ආදායම මණ්ඩලයේ මූල්‍ය ස්ථාවරත්වය වර්ධනය කර ගැනීම සඳහා බෙහෙවින් ඉවහල් විය.

GIZ (Deutsche Gesellschaft für Internationale Zusammenarbeit) ආයතනයෙහි මූල්‍ය ආධාර යටතේ මණ්ඩලයෙහි අභ්‍යන්තර පරිපාලන හා මෙහෙයුම් ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීම සඳහා ERP (Enterprise Resource Planning) පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තාක්‍ෂණික ක්‍රියාවලින් සිදු කිරීම හා සැලසුම් සකස් කරන ලදි.

තොරතුරු තාක්‍ෂණ අංශය ස්ථාපනය කිරීමත් සමඟ මණ්ඩලයෙහි ප්‍රචාරණ කටයුතු හා දැනුවත් කිරීමේ කටයුතු සිදු කිරීම සඳහා e -SMS සේවාවක් එනම් කෙටි පණිවිඩ සේවාවක් ආරම්භ කරන ලද අතර එමඟින් සියළුම දිස්ත්‍රික් කාර්යාල හා ප්‍රධාන කාර්යාලය තුළ සිදුවන පාරිභෝගික දැනුවත් කිරීම් හා අනෙකුත් ප්‍රවර්ධන වැඩසටහන් මෙම කෙටි පණිවිඩ සේවාව ඔස්සේ සිදු කරමින් පවතී.

කෘෂිකාර්මික හා ගොවිජන රක්‍ෂණ මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරන ප්‍රධානතම සමාජ ආරක්‍ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය වන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්‍ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ 2023 වර්ෂය අවසානයේදී නව යෝජනා ක්‍රමයට දායක වී ඇති සමස්ත දායකයින් ප්‍රමාණය 2,166ක් වන අතර, මෙම වර්ෂය තුළදී මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ සපයන ගොවීන් සංඛ්‍යාව 175,006කි.

මෙයට අමතරව ධීවර ප්‍රජාවගේ යහපත උදෙසා ක්‍රියාත්මක වන ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්‍ෂණ යෝජනා ක්‍රමය යටතේ 2023 වර්ෂය අවසානයේදී 69,049ක් වන ධීවරයින් සාමාජිකත්වය දරණ අතර, ධීවර විශ්‍රාම වැටුප්ලාභීන් 5,839 දෙනෙකු වෙත මාසිකව විශ්‍රාම වැටුප් ගෙවීම සිදුකර තිබුණි.

රටෙහි පැවති ආර්ථික අස්ථාවරත්වය තුළ වුවද ජාතික කෘෂිකාර්මික, පශු සම්පත් නිෂ්පාදන ක්‍රියාවලියේදී පුළුල් දායකත්වයක් ලබා දෙමින් අවදානම් අවම කිරීම සඳහා වන ශක්තිය කෘෂිකාර්මියා ප්‍රමුඛ ජාතික කෘෂිකාර්මික නිෂ්පාදන ක්‍රියාවලියට ලබා දෙමින්, රටේ සමස්ත ආර්ථික නිෂ්පාදන ක්‍රියාවලියේ ප්‍රමුඛ කාර්ය කොටසක් ඉටුකරනු ලබන ආයතනයක් ලෙස කෘෂිකාර්මික හා ගොවිජන රක්‍ෂණ මණ්ඩලය සිය වගකීම 2023 වර්ෂය තුළදී ද ඉටුකරන ලදී.

# මෙහෙයුම් අංශය

## මෙහෙයුම් අංශය

අවදානම් කළමනාකරණ ක්‍රමවේදයක් වශයෙන් දේශීය කෘෂිකාර්මික ක්ෂේත්‍රයට කෘෂිකාර්මික රක්ෂණය හඳුන්වාදී දේශීය කෘෂි නිෂ්පාදනය ඉහළ නැංවීම හා කෘෂිකාර්මිකයා සුරක්ෂිත කිරීම මුඛ්‍ය කර්තව්‍යය කරගනිමින් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය ක්‍රියාත්මක වේ. නියඟය, ගංවතුර, වන අලි හානි ඇතුළු ස්වභාවික ආපදා තත්ත්වයන් තුළදී ගොවීන් මුහුණ දෙන ආර්ථික ගැටළුවලට මනා විසඳුමක් ලෙස කෘෂි රක්ෂණ ක්‍රමවේදය වැදගත් වේ. එමෙන්ම, කෘෂි ආර්ථික රටාවක් තුළින් දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමේදී කෘෂි කාර්මික අවදානම් කළමනාකරණය වඩාත් ප්‍රායෝගික අයුරින් යොදා ගැනීම දේශීය කෘෂි ආර්ථික හා ජීවන රටාව ස්ථායී මට්ටමක පවත්වාගෙන යාමට මහඟු පිටිවහලක් වී ඇත. විශේෂයෙන් ගොවීන්ට වඩාත් සමීප වගා රක්ෂණ යෝජනා ක්‍රමය, පශු රක්ෂණ යෝජනා ක්‍රමය, සුවසෙත හා හදිසි අනතුරු රක්ෂණය, කෘෂි උපකරණ රක්ෂණය, ගබඩා රක්ෂණය හා තෙවන පාර්ශවීය රථවාහන රක්ෂණය වැනි වැඩි ප්‍රතිලාභ සහිත රක්ෂණ යෝජනා ක්‍රම රාශියක් ගොවිජනතාව වෙනුවෙන් මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වේ.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සේවාවන් ගොවිජනතාව අතර ව්‍යාප්ත කිරීමේදී වඩාත් වැදගත් කාර්යභාරයක් ඉටු කිරීමට මෙහෙයුම් අංශයට පැවරී ඇත. මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලබන ඉදිරි වැඩපිළිවෙල ඇතුළත් සංයුක්ත සැලැස්මට අනුකූලව සියළුම ආයතනික සැලසුම් සකස් කිරීම, එම සැලසුම් ක්‍රියාත්මක කරවීම සඳහා දීප ව්‍යාප්තව පැතිරී ඇති දිස්ත්‍රික් කාර්යාල මෙහෙයවීම, ඒ සඳහා වූ මානව හා භෞතික අවශ්‍යතා පූරණය කිරීම ඇතුළු සුවිශේෂී වූ කාර්යභාරයක් මෙහෙයුම් අංශය මඟින් ඉටු කරනු ලබයි.

- කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ රක්ෂණ සේවා සපයන ප්‍රධාන රාජ්‍ය ආයතනය වශයෙන් දේශීය කෘෂිකර්මාන්තය නංවාලීමේ හා කෘෂිකාර්මිකයාගේ ආර්ථිකය ස්ථායී කිරීමෙහිලා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත පැවරී ඇති වගකීම උපරිම ආකාරයෙන් ඉටුකිරීම අරමුණු කරගනිමින්, 2023 වර්ෂයේදීද රක්ෂණ යෝජනා ක්‍රම රාශියක් දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කිරීමට මෙහෙයුම් අංශය කටයුතු කර ඇත.

    1. වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - වී වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - බඩ ඉරිඟු වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - ලොකු ළූණු වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - අර්තාපල් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - මිරිස් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - සෝයා වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - අතිරේක බෝග වගා රක්ෂණ යෝජනා ක්‍රමය (තල, කුරක්කන්, කොල්ලු, මුංඇට, කව්පි, උඳු)
        - උක් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - අපනයන බෝග වගා රක්ෂණ යෝජනා ක්‍රමය (ගම්මිරිස්, කුරුඳු)
        - වැවිලි බෝග වගා රක්ෂණ යෝජනා ක්‍රමය (තේ වගාව)

- පොල් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
- මල් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
- ඉඟුරු වගා රක්ෂණ යෝජනා ක්‍රමය
- එළවළු වගා රක්ෂණ යෝජනා ක්‍රමය
- කෙසෙල් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
- පළතුරු වගා රක්ෂණ යෝජනා ක්‍රමය

2. ගබඩා රක්ෂණ යෝජනා ක්‍රමය
3. කෘෂි උපකරණ රක්ෂණ යෝජනා ක්‍රමය
4. පශු රක්ෂණ යෝජනා ක්‍රමය
   - ගව
   - එළු
5. හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රමය
6. සුවසෙත සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය
7. තෙවන පාර්ශවීය රථවාහන රක්ෂණ යෝජනා ක්‍රමය
8. සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම
   - ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය
   - ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

නියඟය, ගංවතුර හා වන අලින්ගෙන් සිදුවන ආපදාවලින් වගා කටයුතුවලට ඇති විය හැකි හානි නිසා ගොවි ප්‍රජාවට මුහුණ දීමට සිදුවන දුෂ්කරතාවලට පිළියමක් වශයෙන් වී, බඩ ඉරිඟු, අර්තාපල්, ලොකුළුණු, සෝයා හා මිරිස් වගාවන් සඳහා ගොවීන්ගේ සහ රජයේ දායකත්වය සහිත අනිවාර්ය රක්ෂණ යෝජනා ක්‍රමයකට ගොවීන් දායක කරගැනීම සිදුවූ අතර, 2018 යල කන්නයේ සිට ගොවීන්ගෙන් වාරික මුදල් අය කිරීමෙන් තොරව රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත අක්කරයක් සඳහා උපරිමය රු.40,000/-ට යටත්ව රක්ෂණ ආවරණයක් ලබා දීමට රජය විසින් කටයුතු කරන ලදී. කෘෂිකර්ම අමාත්‍යාංශය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, මහවැලි සංවර්ධන අධිකාරිය, රාජ්‍ය හා රාජ්‍ය නොවන බැංකු ඇතුළු අදාල සියළු ආයතන සම්බන්ධීකරණයෙන් මෙම රක්ෂණ යෝජනා ක්‍රමය 2018 යල කන්නයේ සිට මණ්ඩලය විසින් දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කරනු ලැබේ.

**මෙහෙයුම් අංශය මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් :**

- කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සියළුම කාර්යාල එකම ආකෘතියක් යටතට ගැනීමේ මූලික අරමුණ ඇතිව එකම ආකෘතියක් සහිතව නාම පුවරු සකස් කර සවි කිරීම.
- 2023 වර්ෂයේ අලුත් සහල් මංගල්‍යය අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් 2022.04.01 සහ 02 දිනයන්හි අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අභියස පවත්වන ලදී. ඒ සඳහා අනුග්‍රාහකත්වය දැක්වීම හා ක්‍රියාකාරකම් සිදු කිරීම.
- රට තුළ පැවති දැඩි නියඟ තත්ත්වය හේතුවෙන් කොළඹ, අභයාරාම විහාරස්ථානයේ පවත්වන ලද වැසි පිරිත් සජ්ඣායනා කිරීමේ පිංකම වෙනුවෙන් සංග්‍රහ කටයුතු වෙනුවෙන් හා පිරිකර ලබා දීම් ආදිය වෙනුවෙන් අනුග්‍රහකත්වය සැපයීම.

- 2023.04.20 දින ජාතික පැළ සිටුවීමේ දිනය සම්බන්ධයෙන් මුද්‍රිත මාධ්‍ය මඟින් පූර්ව ප්‍රචාරණයක් සිදු කිරීම හා ඊට සමගාමීව දිස්ත්‍රික් කාර්යාලයන්ගේ පැළ සිටුවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ වීම මඟින් (2023.09.27 දින සිට) තෙවන පාර්ශව රථ වාහන රක්‍ෂණ කටයුතු තැපැල් කාර්යාල හරහා සිදු කිරීම.
- සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා තෙවන පාර්ශව රථවාහන රක්‍ෂණ කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් මූලික පියවර දිස්ත්‍රික් කීපයක් කේන්ද්‍ර කර ගනිමින් සිදු කිරීම.
- තෙවන පාර්ශව රථවාහන රක්‍ෂණ යෝජනා ක්‍රමය සම්බන්ධ 02/2023 චක්‍රලේඛය සකස් කිරීම.
- මණ්ඩලීය රක්‍ෂණ යෝජනා ක්‍රම පිළිබඳ දැනුවත් කිරීම සඳහා කෑගල්ල දිස්ත්‍රික්කය තුළ අලෙවි ප්‍රවර්ධන වැඩසටහනක් පැවත්වීම හා එම දිනයන් තුළ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මඟින් ඒ පිළිබඳව ප්‍රචාරණ කටයුතු සිදු කිරීම.
- ගම්පහ දිස්ත්‍රික් ගොවි සංවිධාන බල මණ්ඩල නියෝජිතයින් සමඟ රක්‍ෂණ ක්‍රමවේද, වන්දි ගෙවීම් ක්‍රමවේද පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.
- නුවරඑළිය, රත්නපුර, කුරුණෑගල, ගම්පහ, කෑගල්ල, කිලිනොච්චිය, මහව, තඹුත්තේගම, මහනුවර, යාපනය, ගම්පහ යන දිස්ත්‍රික්කයන්හි අලෙවි ප්‍රවර්ධන කටයුතු යාවත්කාලීන කිරීම සඳහා බැනර් හා අත් පත්‍රිකා දිස්ත්‍රික් අවශ්‍යතාවයන් අනුව මුද්‍රණය කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන හා මුද්‍රණ ආකෘතීන් සපයාදීම හා උපදෙස් ලබා දීම.
- වෙළඳපොල විභවයන්ට සරිලන ආකාරයෙන් පාරිභෝගික ජනතාවගේ පහසුව ඇතුළු කරුණු සළකා බලා හම්බන්තොට, රත්නපුර, මහව, මහනුවර, මුලතිව් යන දිස්ත්‍රික් කාර්යාල නව ගොඩනැඟිලිවල ස්ථාපිත කිරීම.
- දිස්ත්‍රික් කාර්යාල ගොඩනැඟිලි හා මණ්ඩලය සතු නිල නිවාස අවශ්‍යතාවය අනුව අළුත්වැඩියා කිරීම හා පාරිභෝගික ආකර්ෂණය ඇතිවන පරිදි සකස් කිරීම (අනුරාධපුරය, කුරුණෑගල, මාතර, යාපනය, මහව, මහනුවර, හම්බන්තොට, ඇඹිලිපිටිය, ගාල්ල, පොළොන්නරුව, බදුල්ල, නුවරඑළිය, මන්නාරම, කළුතර, තඹුත්තේගම)
- මණ්ඩලීය දිස්ත්‍රික් කාර්යාලයන්හි යටිතල පහසුකම් දියුණු කිරීම වෙනුවෙන් අඩුපාඩුව පැවති ලීබඩු ලබා දීම. (කොළඹ, යාපනය, ගම්පහ, කෑගල්ල, මහනුවර, කිලිනොච්චිය, අම්පාර, රත්නපුර, ඇඹිලිපිටිය, මුලතිව්, මන්නාරම, ගාල්ල, පුත්තලම)
- කෘෂිකාර්මික හා ගොවිජන රක්‍ෂණ මණ්ඩලය වෙනුවෙන් ලේඛනාගාරයක් සහ පුහුණු මධ්‍යස්ථානයක් මණ්ඩලය වෙනුවෙන් ලබා ගැනීම. (2023.03.14)
- මණ්ඩලීය රක්‍ෂණ අලෙවි කටයුතු විධිමත් කිරීම සඳහා නව බාහිර නියෝජිතයින් 969 දෙනෙකු බඳවා ගැනීම සහ රක්‍ෂණ ක්‍රමවේද පිළිබඳව දීප ව්‍යාප්තව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- කෘෂිකාර්මික හා ගොවිජන රක්‍ෂණ මණ්ඩලීය බාහිර අලෙවි නියෝජිතයින් ලෙස බඳවා ගනු ලැබූ නියෝජිතයින් සමඟ නියෝජිත හමු පැවැත්වීම. (කෑගල්ල, මොණරාගල, බදුල්ල, අම්පාර, මහව, මාතර, මනම්පිටිය, කළුතර, කොළඹ, කෑගල්ල, මඩකලපුව, මහනුවර)

- ගාල්ල දිස්ත්‍රික්කයේ ලබුදූව ගොවිපල පරිශ්‍රය කේන්ද්‍ර කරගනිමින් පැවත් වූ “දක්ෂිණ කෘෂි නවෝදය” වෙළඳ ප්‍රදර්ශනයෙහි ප්‍රදර්ශන කුටියක් පවත්වාගෙන යාම සිදු කිරීම.
- මහනුවර දිස්ත්‍රික්කයේ කුණ්ඩසාල, ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ 75 වන සංවත්සරයට සමගාමීව පැවති ප්‍රදර්ශනයෙහි ප්‍රදර්ශන කුටියක් පවත්වාගෙන යාම සිදු කිරීම.
- මණ්ඩලීය රක්ෂණ යෝජනා ක්‍රම පිළිබඳ දැනුවත් කිරීම සඳහා රත්නපුර දිස්ත්‍රික්කය තුළ ප්‍රධාන වශයෙන් මහජන පොළ, මැණික් පොළ, ප්‍රධාන බස් නැවතුම්පොළ ඇතුළු පරිශ්‍රවල අත්පත්‍රිකා බෙදා දීම හා දැනුවත් කිරීම මඟින් අලෙවි ප්‍රවර්ධන වැඩසටහනක් පැවත්වීම.
- වාරිමාර්ග අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලැබූ CRIWM ව්‍යාපෘතියට අදාලව පවත්වන ලද දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් සඳහා උතුරුමැද සහ උතුරු පළාත්වල දිස්ත්‍රික් කාර්යාලයකින් එක් නිලධාරියෙකු බැගින් සහභාගී කරවීම.
- කොළඹ විශ්ව විද්‍යාලයීය ආදි විද්‍යාර්ථයින්ගේ සංගමයේ 31 වන වාර්ෂික මහා සභා රැස්වීම හා සුහද හමුව අවස්ථාවේ ප්‍රදර්ශනය සඳහා මණ්ඩලීය රක්ෂණ ක්‍රම සම්බන්ධ බැනරයක් ලබා දීම හා අනුග්‍රාහකත්වය ලබා දීම.
- ගම්පහ දිස්ත්‍රික්කයේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් සංවිධානය කළ “ගොවිජන බැංකු අභිමන්” ප්‍රවර්ධන වැඩසටහන සඳහා මණ්ඩලය මඟින් අනුග්‍රාහකත්වයක් ලබා දීම.
- කෘෂිකර්ම අමාත්‍යතුමා ඇතුළු රාජ්‍ය අංශයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් වගා හානි වන්දි චෙක්පත් බෙදාදීමේ උත්සව පැවැත්වීම (2022 යල, 2022/23 මහ කන්නය - ගාල්ල, ඇඹිලිපිටිය, තඹුත්තේගම, මොණරාගල, මහව, මඩකලපුව / 2023 යල කන්නය - ඇඹිලිපිටිය, මහව, හම්බන්තොට)
- 2023 යල කන්නයේ විශාල වශයෙන් වගා හානි සිදුවූ ඇඹිලිපිටිය, හම්බන්තොට දිස්ත්‍රික්කයන්ගේ වගා හානි පරීක්ෂා කිරීමේ කටයුතු කටුකුරුන්ද ගුවන් හමුදා කඳවුරෙහි නිලධාරීන් සමඟ සම්බන්ධීකරණයෙන් ඩ්‍රෝන කැමරා තාක්ෂණය භාවිතයෙන් සිදු කිරීම.
- හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගම්මාන 18ක් මූලික කරගනිමින් තරුණ කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන පිහිටුවීමේ නියමු ව්‍යාපෘති සිදු කිරීම.

# රක්ෂණ අංශය

## කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය

## හා

## පශු සම්පත් රක්ෂණ යෝජනා ක්‍රමය

## රක්‍ෂණ අංශය

කෘෂිකාර්මික හා ගොවිජන රක්‍ෂණ මණ්ඩලයේ රක්‍ෂණ අංශය මඟින් සිදු කෙරෙන ප්‍රධාන කාර්ය වනුයේ රක්‍ෂණ යෝජනා ක්‍රම සකස් කිරීම, ඒවා පිලිබඳව දැනුවත් කිරීම මෙන්ම ක්‍රියාත්මක රක්‍ෂණ යෝජනා ක්‍රම යටතේ පැන නගින හිමිකම් සඳහා වන්දි මුදල් නිදහස් කිරීමට අදාළ රාජකාරි සිදු කිරීම වේ. ඒ අනුව අංශයේ රාජකාරීන් පහත සඳහන් අයුරින් සිදු කරන ලදී. එනම්, පෙර වර්ෂ වලදී මෙන්ම වගා හානි සඳහා වන්දි මුදල් නිදහස් කිරීමේ කාර්යයට මුල් තැන දී රාජකාරි කිරීමට කටයුතු කරන ලදී.

එසේම 2023 වර්ෂය තුලදී අනිවාර්ය භෝග වගා 06 සඳහා පැවති රක්ෂණ යෝජනා ක්‍රමය යාවත්කාලීන කරන ලදී.

එයට අමතරව අංශ සමඟ සම්බන්ධ වී වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත්, විගණන කටයුතු සඳහා අදාල පිළිතුරු සපයමින් ලැබෙන උපදෙස් පරිදි ක්‍රමවේදයන් සකස් කර ගැනීමට කටයුතු කිරීමත් මූලිකවම සිදු කරන ලදී.

2023 වර්ෂයේදී අනිවාර්ය බෝග වගා රක්ෂණයට අමතරව බෝග වර්ග 20ක් සඳහා පැවති රක්ෂණ යෝජනා ක්‍රම යාවත්කාලීන කිරීමට කටයුතු කරන ලදී. එසේම බිම් මල් වගා රක්ෂණය යාවත්කාලීන කර විභවතාවයක් පවතින දිස්ත්‍රික්කයන්ට එය අලෙවි කිරීම සඳහා ලබා දීමටද කටයුතු කර ඇත.

පොල් වගාව හා පැෂන් වගාව සඳහා රක්ෂණ යෝජනා ක්‍රම සකස් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලද අතර ඉදිරි වර්ෂයේදී අලෙවි කිරීම සඳහා දිස්ත්‍රික්කවලට යොමු කිරීමට කටයුතු සැලසුම් කර ඇත.

එසේම වගා රක්ෂණ කටයුතු සඳහා නව දිරි දීමනා ක්‍රමවේදයක් සකස් කර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගත් අතර 2023 අවසන් කාර්තුවේ සිට එය ක්‍රියාත්මක කිරීමටද කටයුතු කර ඇත.

එසේම පශු රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ එළුවන් සඳහා පැවති රක්ෂණය යාවත්කාලීන කිරීමට කටයුතු කරන ලද අතර දිරි දීමනා ගෙවීම්ද සංශෝධනය කරන ලදී.

තවද 2022/23 මහ කන්නයේ ඇති වූ වගා හානි තත්වයන් පරීක්ෂා කිරීම සඳහා සියලු දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි වගා හානි පරීක්ෂා කිරීමේ විශේෂ වැඩසටහන් 9ක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී. මේ සඳහා රු. මිලියන 3ක පමණ මෙහෙයුම් වියදමක් දැරීමට සිදු විය.

එසේම ආයතනයේ පවතින සෙසු අංශ සමඟ ඒකාබද්ධව කටයුතු කිරීමත් දිස්ත්‍රික් කාර්යාල සඳහා අවශ්‍ය උපදෙස් ලබාදෙමින් රක්‍ෂණ කටයුතු මෙහෙයවීමත් රක්‍ෂණ අංශය මඟින් සිදු කරන ලදී.

2023 වර්ෂය තුලදී රක්‍ෂණ අංශය මඟින් **2020** යල කන්නය, **2020/21** මහ කන්නය, **2021** යල කන්නය, 2021/22 මහ කන්නය, **2022** යල කන්නය, 2022/23 මහ කන්නය මෙන්ම **2023** යල කන්නයේ වගා හානි ලෙස දිස්ත්‍රික්ක මගින් නිර්දේශිතව ඉදිරිපත් තිබූ ලේඛන සඳහා වන්දි මුදල් නිදහස් කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව 2023 වර්ෂය තුළදී පහත පරිදි වන්දි මුදල් නිදහස් කිරීමට කටයුතු කරන ලදී.

| කන්නය | ගොවීන් ගණන | අක්කර ගණන | වන්දි මුදල (රු.) |
|---|---|---|---|
| 2022 යල | 04 | 10 | 152,100.00 |
| 2020/21 මහ | 22 | 32 | 433,900.00 |
| 2021 යල | 333 | 348 | 4,625,091.00 |
| 2021/22 මහ | 1,211 | 1,747 | 27,602,297.00 |
| 2022 යල | 6,813 | 6,665 | 131,683,423.00 |
| 2022/23 මහ | 38,264 | 60,172 | 896,113,956.00 |
| 2023 යල | 12,023 | 15,690 | 398,862,142.00 |

2022/23 මහ කන්නයේ වන්දි මුදල් නිදහස් කිරීමේ රාජකාරි සඳහා ජංගම වැඩසටහන්ද ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී.

ඒ අනුව 2023 වර්ෂය තුලදී රක්ෂණ අංශයේ ප්‍රධාන කාර්යයක් ලෙස රක්ෂණ යෝජනා ක්‍රම යටතේ වන්දි ගෙවීම්හි සමස්ථ සාරාංශය පහත පරිදි වේ.

| ගොවීන් සංඛ්‍යාව | අක්කර ගණන | වන්දි මුදල (රු) |
|---|---|---|
| 58,670 | 84,664 | 1,459,427,909.00 |

එසේම මේ වන විට 2022 යල හා 2022 /23 මහ කන්නයන්ට අදාලව අභියාචනා සලකා බැලීම සිදු කිරීම ආරම්භ කර ඇත.

තවද තෙවන පාර්ශවීය රක්ෂණය යටතේ නිකුත් කරනු ලබන හදිසි අනතුරු රක්ෂණ ඔප්පුව සකස් කර ක්‍රියාත්මක කරන ලදී.

තවද 2024 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කෙරෙන රක්ෂණ යෝජනා ක්‍රම සකස් කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කෙරෙමින් පවතී.

එසේම පශු රක්ෂණය, හදිසි අනතුරු රක්ෂණය හා සුවසෙත රක්ෂණය ආදී සාමාන්‍ය රක්ෂණය යටතේ මිලියන 6ක පමණ වන්දි මුදලක් නිදහස් කිරීමට 2023 වර්ෂය තුලදී කටයුතු කර ඇත. 2023 වර්ෂයේදී පශු රක්ෂණ අදායම හා වන්දි ගෙවීම් පහත පරිදි වේ.

| | මුදල (රු.) | සතුන් ගණන |
|---|---|---|
| පශු රක්ෂණ වාරික අදායම | 14,303,167.01 | 5,317 |
| පශු රක්ෂණ වන්දි ගෙවීම් | 5,040,508.75 | 87 |

# විශ්‍රාම වැටුප් අංශය

## ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

## සහ

## ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

# විශ්‍රාම වැටුප් අංශය

**ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය.**

කෘෂිකාර්මික කටයුතුවල නිරත වී රටේ ආර්ථිකය බල ගන්වන ගොවි ජනයාගේ කාර්යභාරය හඳුනාගනිමින් එම ක්‍රියාවලිය තුල ඔවුන්ගේ සදෑ සමය ශක්තිමත් කිරීමේ අරමුණින් 1987 දී ක්‍රියාත්මක කරන ලද ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයේ මූලික පරමාර්ථය මුදුන් පමුණුවාලමින් 2023 වසර අවසාන වන විට ගොවි විශ්‍රාම වැටුප් ලාභීන් 175,006ක් වෙනුවෙන් රු. 4,375,215,623ක මුදලක් ඔවුන්ගේ ජීවිත සුරක්ෂිතතාවය වෙනුවෙන් විශ්‍රාම වැටුප් වශයෙන් ගෙවන ලදී.

2010 වර්ෂයේ ජූලි මස අගභාගය වන විට ගොවි විශ්‍රාම වැටුප් අරමුදල ශූන්‍ය බවට පත්වීම නිසා ඇති වූ මූල්‍ය අර්බුදයට ස්ථිරසාර විසඳුමක් ලබා දී යෝජනා ක්‍රමය අකර්මණ්‍ය නොවී පවත්වා ගෙන යාම සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ උපදෙස් මත යෝජනා ක්‍රමය ප්‍රතිසංවිධානය කර 2014 වර්ෂයේ ගොඩනගන ලද නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය 2022 වර්ෂයේ ඔක්තෝම්බර් මස ආරම්භ කරන ලදී. එම නව යෝජනා ක්‍රමයට 2023 වර්ෂයේ අවසානය වන විට දායකයින් 2166 ක් දායක වී ඇත.

**මරණ ප්‍රතිලාභ ගෙවීම්**

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වී විශ්‍රාම වැටුප් ලැබීමට පෙර හදිසි අනතුරුවලට ලක් වීමෙන් සහ අනපේක්ෂිත රෝගාබාධවලට ගොදුරු වී ජීවිතයෙන් සමුගත් ගොවි විශ්‍රාම වැටුප් දායකයින් 294 දෙනෙකුගේ උරුමකරුවන් සහ පවුල් වෙත ගෙවූ ප්‍රතිලාභ මුදල රු. 6,415,581කි.

**බෙලහීන ප්‍රතිලාභ ගෙවීම්**

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායකත්වය ලබා සිට පූර්ණ බෙලහීනතාවයට පත්වූ දායකයින් 110 දෙනෙකු වෙනුවෙන් පූර්ණ බෙලහීනතාවයට පත්වූ දින සිට ජීවිතාන්තය දක්වා ගෙවන දීමනාව, 2023 වර්ෂය සඳහා රු. 1,109,329.00 ක් ගෙවන ලදී.

### ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

### ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම

### 2023 ජනවාරි - දෙසැම්බර්

| අනු අංකය | දිස්ත්‍රික් කාර්යාලය | විශ්‍රාම වැටුප් ලබන දායකයින් සංඛ්‍යාව | ගෙවූ මුදල (රු.) |
|---|---|---|---|
| 1 | අම්පාර | 4,445 | 104,846,710 |
| 2 | අනුරාධපුරය | 8,962 | 200,215,224 |
| 3 | බදුල්ල | 7,879 | 189,366,544 |
| 4 | මඩකලපුව | 1,351 | 30,526,934 |
| 5 | කොළඹ | 5,781 | 160,487,968 |
| 6 | ගාල්ල | 15,060 | 417,215,706 |
| 7 | ගම්පහ | 12,230 | 314,739,253 |
| 8 | හම්බන්තොට | 9,770 | 229,476,919 |
| 9 | යාපනය | 2,747 | 66,747,214 |
| 10 | කලුතර | 9,101 | 265,600,890 |
| 11 | මහනුවර | 17,654 | 454,104,582 |
| 12 | කෑගල්ල | 10,743 | 263,968,187 |
| 13 | කුරුණෑගල | 21,432 | 506,633,352 |
| 14 | මන්නාරම | 112 | 2,222,030 |
| 15 | මාතලේ | 5,600 | 130,112,109 |
| 16 | මාතර | 10,450 | 275,144,002 |
| 17 | මොණරාගල | 6,144 | 142,566,404 |
| 18 | මුලතිව් | 145 | 3,931,774 |
| 19 | නුවරඑළිය | 3,473 | 84,793,527 |
| 20 | පොලොන්නරුව | 5,888 | 140,579,289 |
| 21 | පුත්තලම | 6,021 | 142,445,232 |
| 22 | රත්නපුරය | 8,352 | 211,107,152 |
| 23 | ත්‍රිකුණාමලය | 999 | 23,764,264 |
| 24 | වව්නියාව | 667 | 14,620,357 |
| | **එකතුව** | **175,006** | **4,375,215,623** |

- කිලිනොච්චි දිස්ත්‍රික්කයට අදාළ විශ්‍රාම වැටුප් ගෙවීම් වවුනියා දිස්ත්‍රික්කය හරහා කරනු ලබයි.

**ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**මරණ පාරිතෝෂික ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**2023 -ජනවාරි-දෙසැම්බර්**

| අනු අංකය | දිස්ත්‍රික්කය | මරණ පාරිතෝෂික ගෙවූ දායකයින් සංඛ්‍යාව | 2023 ගෙවූ මුදල(රු.) |
|---|---|---|---|
| 1 | ගාල්ල | 20 | 408,876.00 |
| 2 | මාතර | 12 | 237,968.00 |
| 3 | හම්බන්තොට | 19 | 427,342.00 |
| 4 | මොණරාගල | 17 | 412,275.00 |
| 5 | ගම්පහ | 35 | 709,728.00 |
| 6 | බදුල්ල | 19 | 430,603.00 |
| 7 | රත්නපුර | 26 | 559,979.00 |
| 8 | කළුතර | 8 | 174,188.00 |
| 9 | අම්පාර | 4 | 76,276.00 |
| 10 | කොළඹ | 6 | 141,880.00 |
| 11 | ඇඹිලිපිටිය | 1 | 27,809.00 |
| 12 | මනම්පිටිය | 1 | 21,726.00 |
| 13 | කෑගල්ල | 16 | 344,155.00 |
| 14 | මහනුවර | 15 | 310,647.00 |
| 15 | කුරුණෑගල | 10 | 186,542.00 |
| 16 | මහව | 16 | 361,118.00 |
| 17 | අනුරාධපුරය | 19 | 439,015.00 |
| 18 | පොලොන්නරුව | 7 | 145,295.00 |
| 19 | පුත්තලම | 13 | 319,483.00 |
| 20 | තඹුතතේගම | 2 | 54,836.00 |
| 21 | නුවරඑළිය | 6 | 148,470.00 |
| 22 | යාපනය | 5 | 96,050.00 |
| 23 | ත්‍රිකුණාමලය | 4 | 92,782.00 |
| 24 | මාතලේ | 8 | 183,544.00 |
| 25 | වව්නියාව | 1 | 17,346.00 |
| 26 | මඩකලපුව | 1 | 19,598.00 |
| 27 | දෙහිඅත්තකණ්ඩිය | 3 | 68,050.00 |
| | එකතුව | **294** | **6,415,581.00** |

**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ වැඩපිළිවෙලක් ලෙස ක්‍රියාත්මක කරනු ලබන ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ 2023.12.31 දින වන විට ධීවරයින් 69,049 ක් දායකත්වය ලබා තිබුණි.

2023 වර්ෂයේ ධීවරයින් 5839 ක් මාසික විශ්‍රාම වැටුප් ලැබූ අතර රු. 87,271,077 ක් විශ්‍රාම වැටුප් වශයෙන් ගෙවා ඇත. එම වැඩපිළිවල යටතේ අදාළ වර්ෂයේදී මරණයට පත් දායකයින් 19 ක් වෙනුවෙන් රු. 196,000ක මුදලක් මරණ පාරිතෝෂික ප්‍රතිලාභ වශයෙන් ගෙවන ලදී.

**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**
**විශ්‍රාම වැටුප් ගෙවීම 2023 වර්ෂය**

| දිස්ත්‍රික් ධීවර ව්‍යාපෘති කොට්ඨාශය | විශ්‍රාම වැටුප් ගෙවීම දායක සංඛ්‍යාව | ජනවාරි-දෙසැම්බර් මුදල (රු.) |
|---|---|---|
| කළුතර | 136 | 2,056,801.00 |
| ගාල්ල | 136 | 2,017,906.00 |
| මහවැලි | 467 | 7,004,234.00 |
| මාතර | 356 | 5,321,014.00 |
| කොළඹ | 70 | 1,044,707.00 |
| තංගල්ල | 314 | 4,559,795.00 |
| පුත්තලම | 74 | 1,108,175.00 |
| මීගමුව | 668 | 9,906,866.00 |
| මඩකලපුව | 581 | 9,174,879.00 |
| ත්‍රිකුණාමලය | 145 | 2,348,474.00 |
| මන්නාරම | 580 | 8,634,991.00 |
| කල්මුනේ | 395 | 5,926,774.00 |
| මුලතිව් | 89 | 1,261,095.00 |
| කිලිනොච්චි | 456 | 6,831,802.00 |
| යාපනය | **1291** | **18,809,441.00** |
| **මිරිදිය ධීවර ජලාශ** | | |
| නුවරඑළිය | 8 | 107,004.00 |
| පොළොන්නරුව | 4 | 72,489.00 |
| රත්නපුර | 5 | 67,824.00 |
| මොණරාගල | 1 | 15,804.00 |
| කුරුණෑගල | 3 | 41,400.00 |
| අනුරාධපුර | 3 | 43,248.00 |
| මාතලේ | 7 | 114,686.00 |
| මහනුවර | 10 | 209,879.00 |
| බදුල්ල | 7 | 98,604.00 |
| වව්නියා | 2 | 29,208.00 |
| මඩකලපුව මිරිදිය | 31 | 463,977.00 |
| එකතුව | **5,839** | **87,271,077.00** |

**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**
**2023.12.31දිනට බඳවා ගැනීම්**

| දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති | වයස අනුව දායක සංඛ්‍යාව | | | | | | 2023 |
|---|---|---|---|---|---|---|---|
| කොට්ඨාශය | 18-29 | 30-35 | 36-45 | 46-50 | 51-54 | 55-59 | මුළු දායක සංඛ්‍යාව |
| කළුතර | 1,213 | 721 | 772 | 197 | 105 | 59 | 3,067 |
| ගාල්ල | 1,082 | 676 | 840 | 221 | 118 | 95 | 3,032 |
| මහවැව | 3,253 | 1,702 | 2,036 | 613 | 256 | 240 | 8,100 |
| මාතර | 1,750 | 980 | 1,232 | 346 | 201 | 164 | 4,673 |
| කොළඹ | 576 | 360 | 478 | 140 | 63 | 38 | 1,655 |
| තංගල්ල | 2,514 | 1,389 | 1,629 | 412 | 201 | 169 | 6,314 |
| පුත්තලම | 2,167 | 1,156 | 1,222 | 255 | 107 | 61 | 4,968 |
| මීගමුව | 2,538 | 1,599 | 2,167 | 735 | 419 | 378 | 7,836 |
| මඩකලපුව | 2,248 | 1,390 | 1,630 | 555 | 272 | 266 | 6,361 |
| ත්‍රිකුණාමලය | 654 | 516 | 550 | 129 | 81 | 78 | 2,008 |
| මන්නාරම | 2,066 | 1,227 | 1,343 | 429 | 222 | 257 | 5,544 |
| කල්මුනේ | 1,565 | 1,109 | 1,515 | 479 | 244 | 207 | 5,119 |
| මුලතිව් | 88 | 79 | 141 | 50 | 27 | 44 | 429 |
| කිලිනොච්චි | 519 | 340 | 540 | 250 | 185 | 183 | 2,017 |
| යාපනය | 2185 | 1,117 | 1,444 | 668 | 402 | 617 | 6,433 |
| **මිරිදිය ධීවර ජලාශ** | | | | | | | |
| නුවරඑළිය | 29 | 28 | 47 | 7 | 1 | 3 | 115 |
| පොළොන්නරුව | 45 | 35 | 27 | 11 | 2 | 1 | 121 |
| රත්නපුර | 27 | 15 | 9 | 1 | 3 | - | 55 |
| මොණරාගල | 17 | 14 | 10 | 1 | - | - | 42 |
| කුරුණෑගල | 45 | 24 | 24 | 1 | - | 2 | 96 |
| අනුරාධපුර | 169 | 81 | 84 | 17 | 7 | 5 | 363 |
| මාතලේ | 31 | 14 | 23 | 5 | 2 | 3 | 78 |
| මහනුවර | 13 | 12 | 25 | 5 | 3 | 3 | 61 |
| කෑගල්ල | 1 | 1 | 2 | - | - | - | 4 |
| බදුල්ල | 59 | 33 | 33 | 3 | - | 3 | 131 |
| වව්නියා | 59 | 33 | 41 | 15 | 4 | - | 152 |
| මඩකලපුව මිරිදිය | 84 | 52 | 67 | 27 | 20 | 25 | 275 |
| **මුළු එකතුව** | **24,997** | **14,703** | **17,931** | **5,572** | **2,945** | **2,901** | **69,049** |

**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**
**මරණ හා බෙලහීන පාරිතෝෂික ගෙවීම් -2023 වර්ෂය**

| දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති කොට්ඨාශය | මරණ හා බෙලහීන පාරිතෝෂික ගෙවීම් | |
|---|---|---|
| | දායක සංඛ්‍යාව | මුදල (රු.) |
| මහවැව | 4 | 32,000.00 |
| මාතර | 2 | 23,000.00 |
| මීගමුව | 1 | 15,000.00 |
| මඩකලපුව | 1 | 10,000.00 |
| ත්‍රිකුණාමලය | 1 | 8,000.00 |
| මන්නාරම | 1 | 8,000.00 |
| කල්මුනේ | 3 | 26,000.00 |
| යාපනය | 6 | 74,000.00 |
| **එකතුව** | **19** | **196,000.00** |

# පරිපාලන හා මානව සම්පත් අංශය

## පරිපාලන හා මානව සම්පත් අංශය

කාර්ය මණ්ඩලය

2023.12.31 දිනට කෘෂිකාර්මික හා ගොවිජන රක්‍ෂණ මණ්ඩලයේ කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදි විය.

කාර්ය මණ්ඩල සංයුතිය

| සේවාගණය | තනතුරු නාමය | අනුමත සේවක සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ | | | | |
| **HM** | අධ්‍යක්‍ෂ ජනරාල් | 1 | 1 | - |
| **HM** | අධ්‍යක්‍ෂ | 5 | 1 | 4 |
| කළමනාකරණ | | | | |
| **MM** | නියෝජ්‍ය අධ්‍යක්‍ෂ/ සහකාර අධ්‍යක්‍ෂ | 45 | 39 | 6 |
| කනිෂ්ඨ කළමනාකරණ | | | | |
| **JM** | පරිපාලන නිලධාරි | 2 | - | 2 |
| | පද්ධති පරිපාලක | 1 | - | 1 |
| | මූල්‍ය නිලධාරි | 1 | - | 1 |
| | සැලසුම් නිලධාරි | 1 | - | 1 |
| ආශ්‍රිත නිලධාරි | | | | |
| **ASS.O** | සංවර්ධන නිලධාරි | 55 | 47 | 8 |
| | සැපයුම් නිලධාරි | 1 | - | 1 |
| | අභ්‍යන්තර විගණන නිලධාරි | 1 | - | 1 |
| කළමනාකරණ සහකාර (තාක්‍ෂණික) | | | | |
| **MA - Tech** | ප්‍රවාහන සහකාර | 1 | 1 | - |
| | ලේකම් | 1 | 1 | - |
| | පොත් තබන්නා | 4 | 1 | 3 |
| | දෘඩාංග හා ජාලකරණ ශිල්පී | 1 | 1 | - |
| | කාර්මික ශිල්පී (ශ්‍රව්‍ය/දෘශ්‍ය) | 1 | - | 1 |
| කළමනාකරණ සහකාර (තාක්‍ෂණික නොවන) | | | | |
| **MA – Non Tech** | කළමනාකරණ සහකාර | 220 | 192 | 28 |
| ප්‍රාථමික (ශිල්පීය) | | | | |
| **PL - Skilled** | රියදුරු | 38 | 21 | 17 |
| ප්‍රාථමික (ශිල්පීය නොවන) | | | | |
| **PL - Non Skilled** | කාර්යාල සහායක | 42 | 30 | 12 |
| | | **421** | **335** | **86** |

මණ්ඩලයේ කාර්යභාරය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා නිලධාරීන් බඳවා ගන්නා තෙක් පවතින පුරප්පාඩු වලින් අත්‍යාවශ්‍යම තනතුරු කිහිපයක් සඳහා ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල සඳහා පහත සඳහන් තනතුරු වෙනුවෙන් කොන්ත්‍රාත් පදනමින් හා අනියම් පදනමින් නිලධාරීන් යොදවාගෙන ඇත.

**කොන්ත්‍රාත් පදනම**

| | | |
|---|---|---|
| **ASS.O** | සංවර්ධන නිලධාරි | 4 |
| **MA - NonTech** | කළමනාකරණ සහකාර/ක්ෂේත්‍ර | 15 |
| **PL - Skilled** | රියදුරු | 9 |
| **PL - Non Skilled** | කාර්යාල සහායක | 8 |
| | **එකතුව** | **36** |

**අනියම් පදනම**

| | | |
|---|---|---|
| **MA - NonTech** | කළමනාකරණ සහකාර | 12 |

## 2023.12.31 දිනට කාර්ය මණ්ඩල විශ්ලේෂණය

**කාර්ය මණ්ඩලයේ ස්ත්‍රී /පුරුෂ විශ්ලේෂණය**

පුරුෂ -163

ස්ත්‍රී - 172

එකතුව - 335

**සේවා කාලය අනුව විශ්ලේෂණය**

| අවුරුදු | සේවක සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 30 ට වැඩි | 17 | 5% |
| 26 - 30 | 11 | 3% |
| 21 - 25 | 9 | 3% |
| 16 - 20 | 35 | 10% |
| 15 ට අඩු | 263 | 79% |
| එකතුව | 335 | 100% |

**වයස් විශ්ලේෂණය**

| වයස් කාණ්ඩය | සේවක සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 56 - 60 | 23 | 7% |
| 51 - 55 | 30 | 9% |
| 46 - 50 | 55 | 16% |
| 41 - 45 | 53 | 16% |
| 36 - 40 | 35 | 10% |
| 31 - 35 | 35 | 10% |
| 30 ට අඩු | 104 | 31% |
| එකතුව | 335 | 100% |

**2023 වර්ෂය තුළ විශ්‍රාම යාම්, මිය යාම් හා සේවයෙන් ඉවත්වීම්**

2023 වර්ෂය තුළදී මණ්ඩලයේ සේවයේ නියුතු නිලධාරීන්ගෙන් පහත සඳහන් හේතූන් මත නිලධාරීන් 22 දෙනෙකු සේවයෙන් ඉවත්ව ගොස් ඇත.

| | තනතුරු නාමය | සංඛ්‍යාව | සේවය අවසන් කිරීමට හේතුව |
|---|---|---|---|
| 1 | සංවර්ධන නිලධාරි | 01<br>01 | විශ්‍රාම යාම<br>සේවයෙන් ඉල්ලා අස්වීම |
| 2 | කළමනාකරණ සහකාර | 07<br>07<br>01<br>02 | විශ්‍රාම යාම<br>සේවයෙන් ඉල්ලා අස්වීම<br>සේවය හැර යාම<br>සේවය තහනම් කිරීම |
| 3 | කාර්යාල සහයක | 02 | සේවයෙන් ඉල්ලා අස්වීම |
| 4 | රියදුරු | 01 | විශ්‍රාම යාම |

**2023 වර්ෂය තුළ බඳවා ගැනීම් හා උසස් කිරීම්**

මෙම වර්ෂයේදී සහකාර අධ්‍යක්ෂ තනතුරු පුරප්පාඩු සඳහා නිලධාරීන් 06 දෙනෙකුද, සංවර්ධන නිලධාරී තනතුරු පුරප්පාඩු සඳහා නිලධාරීන් 19 දෙනෙකුද, කළමනාකරණ සහකාර තනතුරු පුරප්පාඩු සඳහා නිලධාරීන් 65 දෙනෙකුද බඳවා ගැනීමට කටයුතු කරන ලදී. තවද සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා නිලධාරින් 02 දෙනෙකුද, සංවර්ධන නිලධාරී තනතුර සඳහා නිලධාරින් 05 දෙනෙකුද, කළමනාකරණ සහකාර තනතුර සඳහා නිලධාරින් 04 දෙනෙකුද උසස් කිරීම් කරන ලදී.

**<u>සේවක පුහුණු හා අධ්‍යාපන කටයුතු</u>**

2023 වර්ෂයේ පහත පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීමට හැකි විය.

| අනු අංකය | කණ්ඩායම් පුහුණු/ පෞද්ගලික පුහුණු | වැඩසටහන | තනතුර | අභ්‍යන්තර පුහුණු/ බාහිර පුහුණු | කාල සීමාව | නිලධාරී සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 1 | කණ්ඩායම් පුහුණු | නව ගොවි විශ්‍රාම වැටුප් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන. | සංවර්ධන නිලධාරී, කළමණාකරන සහකාර | අභ්‍යන්තර පුහුණු | **3** | **25** |
| 2 | කණ්ඩායම් පුහුණු | නව ගොවි විශ්‍රාම වැටුප් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන. | සංවර්ධන නිලධාරී, කළමණාකරන සහකාර | අභ්‍යන්තර පුහුණු | **2** | **20** |
| 3 | කණ්ඩායම් පුහුණු | නව ගොවි විශ්‍රාම වැටුප් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන. | සංවර්ධන නිලධාරී, කළමණාකරන සහකාර | අභ්‍යන්තර පුහුණු | **2** | **20** |
| 4 | කණ්ඩායම් පුහුණු | නව ගොවි විශ්‍රාම වැටුප් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන. | සංවර්ධන නිලධාරී, කළමණාකරන සහකාර | අභ්‍යන්තර පුහුණු | **3** | **35** |
| 5 | කණ්ඩායම් පුහුණු | කොළඹ දිස්ත්‍රික් කාර්යාලයේ බාහිර නියෝජිත පුහුණු වැඩසටහන. | නියෝජිත | අභ්‍යන්තර පුහුණු | **1** | **25** |
| 6 | කණ්ඩායම් පුහුණු | කොළඹ දිස්ත්‍රික් කාර්යාලයේ බාහිර නියෝජිත පුහුණු වැඩසටහන. | නියෝජිත | අභ්‍යන්තර පුහුණු | **1** | **27** |
| 7 | කණ්ඩායම් පුහුණු | නව බඳවාගත් සහකාර අධ්‍යක්ෂ සහ සංවර්ධන නිලධාරී මූලික පුහුණු වැඩසටහන | සහකාර අධ්‍යක්ෂ, සංවර්ධන නිලධාරී | අභ්‍යන්තර පුහුණු | **7** | **26** |
| 8 | කණ්ඩායම් පුහුණු | නව ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන. | සංවර්ධන නිලධාරී, කළමණාකරන සහකාර | අභ්‍යන්තර පුහුණු | **2** | 48 |
| 9 | කණ්ඩායම් පුහුණු | තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලික පුහුණු වැඩසටහන | සහකාර අධ්‍යක්ෂ, සංවර්ධන නිලධාරී, කළමණාකාර සහකාර | අභ්‍යන්තර පුහුණු | 2 | 31 |
| 10 | කණ්ඩායම් පුහුණු | රැකියා ජීවිතය සහ පුද්ගලික ජීවිතය සමබර කරගැනීමේ වැඩසටහන | සහකාර අධ්‍යක්ෂ, සංවර්ධන නිලධාරී | අභ්‍යන්තර පුහුණු | 1 | 27 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 11 | කණ්ඩායම් පුහුණු | උපරිම කාර්ය සාධනය සඳහා ආකල්පමය වෙනස් කිරීම,ආචාර ධර්ම,ඵලදායීතාව වැඩි දියුණු කිරීම, සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී හා උපායමාර්ගික සැලැස්ම මෙන් නායකත්ව සංවර්ධනය, අභිප්‍රේරණය හා කණ්ඩායම් ගොඩනැගීම පිළිබඳ වැඩමුළුව. | සහකාර අධ්‍යක්ෂ, සංවර්ධන නිලධාරී | අභ්‍යන්තර පුහුණු | 1 | 27 |
| 12 | කණ්ඩායම් පුහුණු | නව කළමණාකරණ සහකාර නිළධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන | කළමණාකරන සහකාර | අභ්‍යන්තර පුහුණු | 5 | 30 |
| 13 | කණ්ඩායම් පුහුණු | කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන | සංවර්ධන නිලධාරී, කලමණාකරන සහකාර | බාහිර පුහුණු | 1 | 19 |
| 14 | කණ්ඩායම් පුහුණු | කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන | සංවර්ධන නිලධාරී, කලමණාකරන සහකාර | බාහිර පුහුණු | 2 | 20 |
| 15 | කණ්ඩායම් පුහුණු | රැකියා ජීවිතය සහ පුද්ගලික ජීවිතය සමබර කරගැනීම. | සහකාර අධ්‍යක්ෂ, සංවර්ධන නිලධාරී | අභ්‍යන්තර පුහුණු | 1 | 23 |
| 16 | කණ්ඩායම් පුහුණු | නව කළමණාකරණ සහකාර නිළධාරීන් සඳහාවන දැනුවත් කිරීමේ වැඩසටහන(දෙවන කණ්ඩායම) | කළමණාකරන සහකාර | අභ්‍යන්තර පුහුණු | 4 | 33 |
| 17 | පුද්ගලික පුහුණු | ප්‍රවාහන කළමණාකරණය | සහකාර අධ්‍යක්ෂ (පාලන) | බාහිර (SDFL) | 1 | 1 |
| 18 | පුද්ගලික පුහුණු | Advancd Certificate in Acturial Science | අධ්‍යක්ෂ (විශ්‍රාම වැටුප්) | බාහිර (The Institute of Chartered Accountants) | මාස 06 | |
| 19 | පුද්ගලික පුහුණු | Advancd Certificate in Acturial Science | අධ්‍යක්ෂ (මුදල්) වැ.බ. | බාහිර (The Institute of Chartered Accountants) | මාස 06 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 20 | පුද්ගලික පුහුණු | Advancd Certificate in Acturial Science | සහකාර අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) | බාහිර (The Institute of Chartered Accountants) | මාස 06 | |
| 21 | පුද්ගලික පුහුණු | Advancd Certificate in Acturial Science | සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | බාහිර (The Institute of Chartered Accountants) | මාස 06 | |
| 22 | පුද්ගලික පුහුණු | Advancd Certificate in Acturial Science | සහකාර අධ්‍යක්ෂ (ගම්පහ දිස්ත්‍රික්) | බාහිර (The Institute of Chartered Accountants) | මාස 06 | |
| 23 | පුද්ගලික පුහුණු | Advancd Certificate in Acturial Science | සහකාර අධ්‍යක්ෂ (රක්ෂණ) | බාහිර (The Institute of Chartered Accountants) | මාස 06 | |


31

**සේවක සුභසාධනය**

වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය, යතුරු පැදි හිමි නිලධාරීන්ට යතුරුපැදි ණය ලබාදීම පෙර වර්ෂයේ දී මෙන් මෙම වර්ෂය තුළ ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

**ප්‍රසම්පාදන හා ප්‍රවාහන ක්ෂේත්‍රය**

**සැපයුම් අංශය**

මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන රක්ෂණ යෝජනා ක්‍රම වලට අදාළ පහත ලිපිලේඛන රජයේ ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් බාහිරින් මුද්‍රණය කිරීමට කටයුතු කරන ලදී.

01. තෙවන පාර්ශව රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ - තෙවන පාර්ශව අයදුම්පත් තෙවන පාර්ශව කුවිතාන්සි හා ආවරණ පොත්, තෙවන පාර්ශව කාඩ්පත්

02. වගා රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ - වගා රක්ෂණ අයදුම්පත්‍ර - *වී වගා රක්ෂණ අයදුම්පත් (සිංහල, දෙමළ)
*අතිරේක බෝග හානි අයදුම්පත් (සිංහල, දෙමළ)
*හානි වාර්තා කිරීමේ ලේඛන
* හානි වාර්තා කිරීමේ පොත්

03. පැරණි ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ - ගොවි විශ්‍රාම ගෙවීමේ පොත්, ගොවි විශ්‍රාම වැටුප් ලාභියා හඳුනාගැනීමේ කාඩ්පත්

04. නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - * සහතික ඔප්පු ( F.P.N.3(I) )
* කොන්දේසි අත්පොත් ( F.P.N.3(II) )
* ෆයිල් ඩොකට්

05. ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ - ධීවර විශ්‍රාම වැටුප් ගෙවීමේ පොත්, ධීවර විශ්‍රාම වැටුප් ලාභියා හඳුනාගැනීමේ කාඩ්පත්
මුදල් අංශය මඟින් භාවිතා කරන - පොදු කුවිතාන්සි පොත්

06. මීට අතිරේකව ප්‍රධාන කාර්යාලයට හා දිස්ත්‍රික් කාර්යාලවලට අවශ්‍ය පොදු 35, නිවාඩු ඉල්ලුම් පත්‍ර, පශු රක්ෂණ අයදුම්පත්, පශු රක්ෂණ ඔප්පු, සුවසෙත අයදුම්පත්, සුවසෙත ඔප්පු හා ප්‍රවාහන රාජකාරි සඳහා අවශ්‍ය ලිපි ලේඛන මණ්ඩලීය ඩුප්ලෝ මුද්‍රණ යන්ත්‍රය මඟින් මුද්‍රණය කිරීම ද සිදු කරන ලදී.

07. දිස්ත්‍රික් කාර්යාල හා ප්‍රධාන කාර්යාලයට අවශ්‍ය තාක්ෂණික උපකරණ මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රමවේදයක් අනුව කටයුතු කළ අතර, ඒ අනුව දිස්ත්‍රික් කාර්යාල සඳහා කාර්යාල උපකරණ (මේස, පුටු, කබඩ්) මිලදී ගැනීම ද සිදු කරන ලදී.

08. ප්‍රධාන කාර්යාලයේ අංශවලින් ඉල්ලුම් කරන ලිපිද්‍රව්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදයන් අනුගමනය කරමින් මිලට ගෙන ගබඩාව වෙත ලබාදීම සිදුකරන ලදී.

කාර්යාල ගොඩනැගිලි

මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය මෙම වසර තුල දී ද නො:117, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල, නුගේගොඩ ලිපිනයේ පිහිටි පුද්ගලික ගොඩනැගිල්ලේ කුළී පදනම මත පවත්වාගෙන යන ලදී. මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල 30 ක් පවත්වාගෙන යන අතර, මින් මණ්ඩලයට අයත් ගොඩනැගිලි 06කි. අනෙකුත් දිස්ත්‍රික් කාර්යාල මාසික කුලී පදනම මත රාජ්‍ය හා පෞද්ගලික ගොඩනැගිලි තුළ තවදුරටත් පවත්වාගෙන යනු ලැබේ.

ප්‍රවාහන සංචිතය

මණ්ඩලයේ කාර්යභාරය ඉටුකිරීම සඳහා ප්‍රධාන කාර්යාලය සහ දිස්ත්‍රික් කාර්යාල සතුව වාහන 34 ක් ඇත. මෙම වාහන වලින් වෙන් කළ වාහන 02 ක් ඇති අතර, අනෙකුත් වාහන ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් කාර්යාලවල සංචිත රාජකාරිවල යොදා ඇත. එම වාහන පහත පරිදි වේ.

| අනු අංකය | වාහන අංකය | වර්ගය | ලියාපදිංචි වර්ෂය | ආයු කාලය |
|---|---|---|---|---|
| 01 | 32-1427 | Mitsubishi Pajero | 1985 | 39 |
| 02 | 32-4880 | Toyota (Land Crusir) | 1988 | 36 |
| 03 | 32-4850 | Toyota (Land Crusir) | 1988 | 36 |
| 04 | 32-4852 | Toyota (Land Crusir) | 1988 | 36 |
| 05 | 32-4938 | Mitsubishi Pajero | 1988 | 36 |
| 06 | 32-4920 | Mitsubishi Pajero | 1988 | 36 |
| 07 | 32-5210 | Mitsubishi Pajero | 1988 | 36 |
| 08 | 51-2423 | Nissan (Cab) | 1990 | 34 |
| 09 | 32-7718 | Dihasthu (Jeep) (Rocky) | 1990 | 34 |
| 10 | 32-7719 | Dihasthu (Jeep) (Rocky) | 1990 | 34 |
| 11 | 32-8016 | Dihasthu (Jeep) (Rocky) | 1990 | 34 |
| 12 | 53-9447 | Mitsubishi (L200) | 1992 | 32 |
| 13 | 53-9446 | Mitsubishi (L200) | 1992 | 32 |
| 14 | 58-4436 | Mitsubishi (L200) | 1996 | 28 |
| 15 | 58-4437 | Mitsubishi (L200) | 1996 | 28 |
| 16 | HH-6105 | Bolero (Jeep) | 2003 | 21 |
| 17 | KD-3476 | Toyota (121) | 2006 | 18 |
| 18 | KF-2280 | Mitsubishi Pajero | 1992 | 32 |
| 19 | QM-4647 | Bajaj (Threewheel) | 2007 | 17 |
| 20 | KH-5041 | Chevrolet (Aveo) | 2008 | 16 |
| 21 | KI-2554 | Nissan (Sunny) | 2008 | 16 |
| 22 | KP-8706 | Maruti (800) | 2011 | 13 |
| 23 | KP-8723 | Maruti (800) | 2011 | 13 |
| 24 | KQ-0253 | Maruti (800) | 2011 | 13 |
| 25 | NC-4104 | Toyota (Hiace) | 2015 | 9 |
| 26 | NC-4096 | Toyota (Hiace) | 2015 | 9 |
| 27 | CAL-6100 | Micro(Rexton) | 2015 | 9 |
| 28 | CAL-6101 | Micro(Rexton) | 2015 | 9 |
| 29 | TVS | Champ බයිසිකල් - 48cc | 2008 | 16 |
| 30 | 32-3295 | Dual purpose Vehicle | 1987 | 39 |
| 31 | 32-1187 | Dual purpose Vehicle | 1984 | 40 |
| 32 | KG-0356 | Motor car | 2001 | 22 |
| 33 | KJ-3879 | Dual purpose Vehicle | 2010 | 14 |
| 34 | 301-0462 | Motor car | 1998 | 26 |

# අභ්‍යන්තර විගණන අංශය

## අභ්‍යන්තර විගණන අංශය

2023 වර්ෂය සඳහා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ක්‍රියාත්මක රක්ෂණ සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සඳහා ඒ ඒ අංශ සහ දිස්ත්‍රික් කාර්යාල අනුව පිලියෙල කරන ලද වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩසටහනට අනුකූලව අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කරන ලදි.

ඒ අනුව, අභ්‍යන්තර විගණන අංශයේ සහකාර අධ්‍යක්ෂ, සංවර්ධන නිලධාරි හා කළමණාකාර සහකාර නිළධාරීන් තිදෙනෙකුගේ සේවය සහිතව 2023 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන පරීක්ෂණ 33 ක් ප්‍රධාන කාර්යාලයීය එක් එක් අංශ සහ භූගෝලීය මට්ටමින් ව්‍යාප්ත වී ඇති දිස්ත්‍රික් කාර්යාල 30 පදනම් කොටගෙන සිදුකරන ලදි.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය සඳහා පවතින අවදානම් කලමනාකරණය කිරීමේ අරමුණ මූලික කොටගෙන එක් එක් අංශ සහ දිස්ත්‍රික් කාර්යාල වල කටයුතු කාර්යක්ෂමව හා සඵලදායිව ඉටු කිරීම සඳහා ක්‍රියාත්මක කර ඇති අභ්‍යන්තර පාලන ක්‍රමවල ප්‍රමාණාත්මකභාවය, නිරවද්‍යභාවය හා ඒවායේ ක්‍රියාකාරිත්වය ඇගයීම සඳහා පහත එක් එක් ක්ෂේත්‍ර යටතේ අභ්‍යන්තර විගණන පරීක්ෂණ සැලසුම් කොට ක්‍රියාත්මක කරන ලදි.

පාලන අංශය ආවරණය වන පරිදි භෞතික තොග ශේෂ පරීක්ෂාව, මිශ්‍ර අත්තිකාරම් පරීක්ෂාව, වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම පරීක්ෂා කිරීම, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ නිලධාරින්ගේ පුද්ගලික ලිපිගොනු පරීක්ෂා කිරීම යන ක්ෂේත්‍ර ආවරණය වන පරිදි විගණන පරීක්ෂණ සිදු කර ඇත.

මුදල් අංශයේ කටයුතු වලට අදාලව සුළු මුදල් ශේෂ පරීක්ෂාව, දිස්ත්‍රික් කාර්යාල පරිපාලන ගිණුම පරීක්ෂාව, මිශ්‍ර අත්තිකාරම් පරීක්ෂාව, නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා දායකයින් බඳවා ගැනීම, මුදල් බැංකුගත කිරීම, දත්ත පද්ධතිය යාවත්කාලින කිරීම හා කේවල ගිණුම් යාවත්කාලින කිරීම පරීක්ෂාව, නව ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයේ වාර මුදල් රැස්කිරීම සහ බැංකු ගත කිරීම පරීක්ෂාව, ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයේ වාර මුදල් රැස් කිරීම සහ බැංකුගත කිරීම පරීක්ෂාව යන ක්ෂේත්‍ර වලට අදාලව විගණන පරීක්ෂණ සිදු කොට ඇත.

රක්ෂණ අංශයේ කටයුතු වලට අදාලව වී වගා හා බඩ ඉරිඟු වන්දි ගෙවීම් පරීක්ෂාව, අර්තාපල්, මිරිස් හා වී වගා හානි වන්දි ගෙවීම් පරීක්ෂාව - යල කන්නය යන පරීක්ෂණ සිදු කොට ඇත.

ගොවි විශ්‍රාම වැටුප් අංශයට අදාලව නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා දායකයින් බඳවා ගැනීම, මුදල් බැංකුගත කිරීම, දත්ත පද්ධතිය යාවත්කාලින කිරීම හා කේවල ගිණුම් යාවත්කාලින කිරීම පරීක්ෂාව, ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය - ශුද්ධ වාරික මුදල් හා පොලි මුදල් ගෙවීම පරීක්ෂාව, ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය - ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම පරීක්ෂාව යන විගණන පරීක්ෂාවන් සිදු කොට ඇත.

දිස්ත්‍රික් කාර්යාල කටයුතු පරීක්ෂාවන් යටතේ කළුතර, බදුල්ල, මහව, නුවරඑළිය, වව්නියාව හා රත්නපුර යන දිස්ත්‍රික් කාර්යාලවල කටයුතු පරීක්ෂාව කරන ලදි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව, කෘෂිකාර්ම අමාත්‍යාංශය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කටයුතු පවත්වාගෙන යාම අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදුකොට ඇත.

➢ **විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.**

2023 වර්ෂයට අදාලව විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් පවත්වා ඇති අතර, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ විගණන කළමනාකරණ කමිටුව පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් තිදෙනාගෙන් සමන්විත විය.

1. ආර්.එම්.ඩී.කේ.ජී.එන්.ඩී.රණතුංග - කමිටු සභාපති - අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව.
2. ඒ.එම්.එල්.අබේරත්න - කමිටු සාමාජික - ගොවිජන සේවා කොමසාරිස් ජනරාල් - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව.
3. කේ.සී.නිරෝෂන් - අතිරේක ලේකම් (පොහොර) - කෘෂිකර්ම අමාත්‍යාංශය.

වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සහ අභ්‍යන්තර විගණන අංශය සිදුකර ඇති විගණන පරීක්ෂණ වාර්තා සමාලෝචනය කිරීම, රජයේ විගණන විමසුම් සමාලෝචනය කිරීම සහ මූල්‍ය වාර්තා වලට අදාල විගණකාධිපති වාර්තා සමාලෝචය කිරීම ආදිය පසුගිය විගණන කළනාකරණ කමිටු රැස්වීම් වාර වලදි සිදු කර ඇත.

# සැලසුම් අංශය

## සැලසුම් අංශය

2023 වර්ෂය තුළ සැලසුම් අංශය විසින් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ දැක්ම හා මෙහෙවර අනුව ක්‍රියාත්මක වෙමින්, මණ්ඩලයේ සියලු අංශයන් සම්බන්ධීකරණය කොට අරමුණු හා ඉලක්ක කරා ළඟා වීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම, ව්‍යාපෘති හා යෝජනා ක්‍රම සැලසුම් කිරීම, දත්ත හා සංඛ්‍යාත කාල ක්‍රමනුගතව රැස් කිරීම, විශ්ලේෂණය කිරීම, නිගමන හා නිර්දේශ ඉදිරිපත් කිරීම, පර්යේෂණ කටයුතු සිදු කිරීම ආදී කර්තව්‍යන්හි නිරත විය.

### ඉදිරි වර්ෂ පහ සඳහා සැලසුම් සකස් කිරීම

- **2024 වර්ෂය සඳහා ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීම**

2024 වර්ෂය තුළ ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා එක් එක් විෂය පථයන්ට අදාලව අංශ මට්ටමින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාකාරකම් හා වැඩසටහන් සඳහා යෝජනා හා සැලසුම් රැස් කරන ලදී. එම යෝජනා හා සැලසුම් ආයතනයේ විධායක නිලධාරීන්, විෂය ප්‍රධානින් හා අනෙකුත් අත්‍යවශ්‍ය නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් රැස්වීම් හා හමු පවත්වමින් ආයතනික උපායමාර්ග යටතේ තව දුරටත් සකච්ඡා කරමින් ගොනු ගත කරන ලදී.

අංශයන්හි වගකිව යුතු නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් උක්ත ක්‍රියාකාරකම් සඳහා කාලරාමු හා අයවැය සකස් කිරීමේ කටයුතු සිදු කෙරුණු අතර ඒවා ආයතනික මූලික අරමුණු යටතේ ගොනුගත කෙරිණි. ඒ අනුව, කෙටුම්පත් කරනු ලබන, 2024 ආයතනික ක්‍රියාත්මක සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය.

- **2024 – 2028 උපාය මාර්ගික සංයුක්ත සැලැස්ම**

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය සඳහා සකස් කර තිබූ 2023 – 2025 සංයුක්ත සැලැස්ම, 2024 ක්‍රියාත්මක සැලැස්මට සමගාමීව සංශෝධනය කරන ලදී. එහිදී ඉදිරි වර්ෂ 5 තුළ ආයතනය විසින් යොදා ගනු ලබන උපාය මාර්ග ඇතුලත් කරමින් උපායමාර්ගික සැලැස්ම හා එහි එක් එක් අරමුණු හා පරමාර්ථ සඳහා මූලික කාර්ය සාධන දර්ශක (KPI) සකස් කරන ලදී.

ඒ අනුව, පස් අවුරුදු උපාය මාර්ගික සංයුක්ත සැලැස්ම හා ක්‍රියාත්මක සැලැස්ම, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව එහි පිටපත් කෘෂිකර්ම අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය ඇතුළු අනෙකුත් ආයතන වලට යොමු කිරීමට අපේක්ෂා කෙරේ.

### ප්‍රගති සමාලෝචනය

- **2023 ක්‍රියාත්මක සැලැස්ම අනුව ආයතනික ප්‍රගතිය සමාලෝචනය**

2023 වාර්ෂික ක්‍රියාත්මක සැලැස්මට අනුව අංශ මට්ටමින් ආයතනික ප්‍රගතිය සමාලෝචනය සිදුකරන ලදී. ඒ අනුව 2023 වර්ෂය සඳහා අර්ධ වාර්ෂිකව ප්‍රගති සමාලෝචන රැස්වීමක්ද කාර්තුමය වශයෙන් ලිඛිතව ප්‍රගතිය විමසීම ද සිදුකරන ලදී. මෙසේ සිදුකරන ලද ප්‍රගති සමාලෝචනයේ සංක්ෂිප්ත විස්තර විගණන කළමනාකරණ කමිටුව වෙතද ඉදිරිපත් කරන ලදී. 2023 වර්ෂය ක්‍රියාත්මක සැලැස්මෙහි අවසන් වාර්ෂික

ප්‍රගතිය විමසීම 2024 වර්ෂයේ ජනවාරි මාසයේදී සිදුකරන ලද අතර, එය මීළඟ විගණන කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කිරීමට නියමිතය.

- **දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචනය**

දිස්ත්‍රික් කාර්යාල මඟින් කාලානුරූපිව අත් කර ගනු ලබන ප්‍රගතිය සමාලෝචනය කිරීමේ අරමුණින්, 2023 වර්ෂය සඳහා කාර්තුමය වශයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් 4ක් පවත්වන ලදී. මෙහිදී 2023 ජනවාරි මාසයේදී, 2022 වාර්ෂික අවසන් ප්‍රගති සමාලෝචන රැස්වීම පවත්වනු ලැබූ අතර, එහිදී 2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් පිළිබඳව දිස්ත්‍රික් ප්‍රධානීන්ගෙන් අදහස් ලබා ගන්නා ලදී.

2023 දෙවන හා තෙවන කාර්තු සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලද අතර, එහිදී අදාල දිස්ත්‍රික් ඉලක්කවලට සාපේක්ෂව අත් කර ගන්නා ලද ප්‍රගතිය සමාලෝචනය කරන ලදී. 2023 වාර්ෂික අවසන් ප්‍රගති සමාලෝචනය 2024/01/08 හා 2024/01/09 යන දින වලදී පවත්වන ලදී. 2023 වර්ෂයේ අවසන් ප්‍රගති සමාලෝචනය හා 2024 වර්ෂය සඳහා නව යෝජනා හා සැලසුම් ලබා ගැනීමද එහිදී සිදු විය.

**<u>රාජ්‍ය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් සඳහා සැලසුම් සකස් කිරීම හා ප්‍රගතිය විමසීම.</u>**

රාජ්‍ය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහන් වලට අදාළව, 2023 වර්ෂය සඳහා වූ ක්‍රියාත්මක සැලසුම් සකස් කිරීමේ කටයුතු සැලසුම් අංශයේ මූලිකත්වයෙන් සිදු කරන ලදී.
ඒ යටතේ අනිවාර්ය වගා රක්ෂණ යෝජනා ක්‍රමය , විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය හා ප්‍රාග්ධන අවශ්‍යතාවයට අදාලව, 2023 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් කරවා ගැනීම සඳහා වූ ක්‍රියාත්මක සැලැසුම් සකස් කර යොමු කරන ලදී.

තවද, 2023 වර්ෂය තුළ උක්ත යෝජනා ක්‍රම වලට අදාළව ප්‍රගතිය මාසිකව හා අර්ධ වාර්ෂිකව අදාළ ආකෘතින් අනුව සකස් කර කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී.

**<u>අංශ අතර සම්බන්ධීකරණය, දත්ත හා තොරතුරු රැස්කිරීම හා බාහිර ආයතන සම්බන්ධීකරණය</u>**

- **අංශ අතර සම්බන්ධීකරණය, දත්ත හා තොරතුරු රැස්කිරීම**

සැලසුම් අංශය විසින් 2023 වර්ෂය පුරා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සියලුම අංශ සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින්, එක් එක් අංශයන්ගේ යාවත්කාලීන දත්ත හා සංඛ්‍යාත තොරතුරු ක්‍රමානුකූලව රැස් කිරීම සිදු කරන ලද අතර, එම සංඛ්‍යාලේඛන විශ්ලේෂණය මඟින් මාසික, කාර්තුමය හා වාර්ෂික ප්‍රගති වාර්තා සකස් කර අවශ්‍ය අවස්ථාවන්හි, අදාල කටයුතු සඳහා ඉහල කළමනාකාරීත්වය වෙත ඉදිරිපත් කරන ලදී.

මෙය වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව සිදුකිරීම සඳහා 2024 වර්ෂයේ සිට දත්ත හා තොරතුරු රැස්කිරීමේ නව ආකෘතීන් හඳුන්වා දීමට සැලසුම් කර ඇති අතර එහි මූලික ආකෘතින් සකස් කිරීමේ කටයුතු 2023 දෙසැම්බර් මාසයේ ආරම්භ විය.

- **බාහිර ආයතන සම්බන්ධීකරණය**

රේඛිය අමාත්‍යාංශය වන කෘෂිකර්ම අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහා බැංකුව ඇතුළු කෘෂිකාර්මික ක්ෂේත්‍රය හා සම්බන්ධ අනෙකුත් සියලු ආයතන සම්බන්ධීකරණය කරමින්, 2023 වර්ෂයට අදාලව එම ආයතන විසින් ඉල්ලුම් කරන ලද සියළු වාර්තා සකස් කර ආයතන ප්‍රධානී මඟින් අදාළ ආයතන වෙත කඩිනමින් යොමු කිරීමට කටයුතු කරන ලදී.

- **කාර්ය සාධන වාර්තා සකස් කිරීම**

2023 වර්ෂය ආරම්භයේදී 2022 වර්ෂය තුළ මෙම මණ්ඩලය විසින් අත්කරගන්නා ලද ප්‍රගතිය පිළිබඳ දත්ත හා තොරතුරු අංශ මට්ටමෙන් රැස් කර, ඒ අනුව 2022 වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තාව සකස් කර, රේඛිය අමාත්‍යාංශය වෙත යැවීමට කටයුතු කරන ලදී. තවද 2023 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව සකස් කිරීමට අදාළ මූලික දත්ත රැස් කරන ලදී. එය 2024 වර්ෂය ආරම්භයේදී අවසන් කර අදාළ අමාත්‍යාංශය වෙත යොමු කිරීමට නියමිතය.

<u>ව්‍යාපෘති හා පර්යේෂණ කටයුතු ක්‍රියාත්මක කිරීම</u>

- **කෘෂිකාර්මික තොරතුරු කළමනාකරණ පද්ධතිය (AIMS) හා වෙබ්/ජංගම යෙදවුම (Web/Mobile Application) ක්ෂේත්‍ර වෙත හඳුන්වා දීම**

ලෝක බැංකුවට අනුබද්ධ, ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාවේ තාක්ෂණික දායකත්වය යටතේ සකස් කර අවසන් කරන ලද, කෘෂිකාර්මික තොරතුරු කළමනාකරණ පද්ධතිය (AIMS), ක්ෂේත්‍ර මට්ටමෙන් ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් කාර්යාල වෙත හඳුන්වා දීමේ කටයුතු 2023 වසරේදී ආරම්භ කරන ලදී.

2022/23 මහ කන්නයේ ආරම්භයත් සමඟ කෘෂිකාර්මික තොරතුරු කළමනාකරණ පද්ධතිය (AIMS) අනුරාධපුර දිස්ත්‍රික්කය මූලික කර ගනිමින් දිවයින පුරා දිස්ත්‍රික් කාර්යාල වෙත හඳුන්වා දීමේ කටයුතු ආරම්භ කරන ලදී. එහිදී වාරික අය කිරීමක් සහිතව රක්ෂණයට දායක වන ගොවීන්ගේ තොරතුරු, වගා බිම්වල තොරතුරු, මෙම පද්ධතියට ඇතුලත් කර ගැනීම සඳහා දිස්ත්‍රික් කාර්යාල මෙහෙයවන ලදී.

ඒ අනුව, 2023/10/03 වන දින සිට ඉදිරියට වගා රක්ෂණ හා මෙහෙයුම් ක්‍රියාවලිය, AIMS පද්ධතිය යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා සියළුම දිස්ත්‍රික්කයන් වෙත හඳුන්වා දෙන ලද අතර ඊට අදාල උපදෙස් හා මඟපෙන්වීම් ලබා දෙන ලදී. තවද මීට සමගාමීව උක්ත පද්ධතියට, දත්ත ඇතුලත් කිරීම සඳහා සකස් කර තිබූ දිරිදීමනා ක්‍රමවේදය ක්ෂේත්‍ර මට්ටමින් හඳුන්වා දීම ද සිදු විය.

- **පුහුණු වැඩමුළු හා ක්ෂේත්‍ර ගත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

2023 වර්ෂය තුළ, දිවයිනේ සියළුම දිස්ත්‍රික්ක සඳහා කෘෂිකාර්මික තොරතුරු කළමනාකරණ දත්ත පද්ධතියට (AIMS), දත්ත ඇතුලත් කිරීම හා එහි භාවිතයන් පිලිබඳ විවිධ ක්‍රමෝපායන් යටතේ, අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම් ලබා දෙන ලදී.

මේ යටතේ දිස්ත්‍රික් කාර්යාලයන්හි ක්ෂේත්‍ර භාරව කටයුතු කරනු ලබන දිස්ත්‍රික් අධ්‍යක්‍ෂවරුන්, සංවර්ධන නිලධාරීන්, ක්ෂේත්‍ර නිලධාරීන් හා දත්ත ඇතුලත් කිරීමේ කටයුතුවලට සම්බන්ධවන අනෙකුත් නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් මාලාවක් ආරම්භ කරන ලදී. එහි දෙවන වැඩසටහන, 2023/02/01 දින, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලීය, පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්විණි. මෙහිදී මහනුවර, නුවරඑළිය, කෑගල්ල, බදුල්ල හා මාතලේ යන දිස්ත්‍රික් කාර්යාලයන්හි නිලධාරීන් 27 දෙනෙකු සඳහා කෘෂිකාර්මික තොරතුරු කළමනාකරණ පද්ධතිය (AIMS) හැසිරවීම, දත්ත ඇතුලත් කිරීම, සිතියම් ගත කිරීම, ඡායාරූප උඩුගත කිරීම ආදී ක්‍රියාවලින් පිලිබඳ විස්තරාත්මක හා ප්‍රයෝගික පුහුණුවක් ලබා දෙන ලදී.

තව ද, අනුරාධපුර දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂගේ ඉල්ලීම පරිදි, එම දිස්ත්‍රික්කයේ 2022/23 මහා කන්නය තුළ වාරික ගෙවීමක් සහිතව රක්ෂණයට දායක වී ඇති ගොවින් හා ගොවිබිම් වල දත්ත හා තොරතුරු AIMS දත්ත පද්ධතියට ඇතුලත් කිරීමේ කටයුතු සඳහා සහය දැක්වීමට, ප්‍රධාන කාර්යාලයේ තාක්ෂණික දැනුම සහිත නිලධාරීන් යොදාගනිමින් 2023/02/06 සිට, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍රගත වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

2023 වර්ෂය අවසානයේ AIMS පුහුණු වැඩසටහනෙහි දෙවන අදියර ක්ෂේත්‍ර මට්ටමින් ක්‍රියාත්මක වූ අතර ඒ අනුව මහව දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍ර භාරව කටයුතු කරනු ලබන දිස්ත්‍රික් අධ්‍යක්‍ෂ, සංවර්ධන නිලධාරීන් හා ක්ෂේත්‍ර නිලධාරීන් පුහුණු කිරීමේ කටයුතු, ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ක්ෂේත්‍රය තුළ ප්‍රයෝගික පුහුණු වැඩසටහනක් ලෙස 2023/12/15 දින මහව දිස්ත්‍රික් කාර්යාල පරිශ්‍රයේදී සිදු කරන ලදී.

- **පරිශීලක ගිණුම් සකස් කිරීම**

2023 වර්ෂය තුල සැලකිය යුතු ස්ථාන මාරුවීම් හා නව බඳවා ගැනීම් සිදු වූ බැවින් AIMS දත්ත පද්ධතියෙහි සකස් කර ඇති ගිණුම් සංශෝධනය හා නව ගිණුම් සකස් කිරීමේ වැඩසටහන් ද සිදුකරන ලදී. එහිදී සියලුම නිලධාරීන්ගේ ගිණුම් විස්තර නැවත සමාලෝචනය කරමින් යාවත්කාලීන කිරීම සිදු විය.

- **කෘෂිකාර්මික තොරතුරු කළමණාකරන පද්ධතිය (AIMS) වැඩිදුරටත් සංවර්ධනය**

මෙම පද්ධතිය, 2022/23 මහ කන්නය තුල පර්යේෂණ මට්ටමින් අනුරාධපුර දිස්ත්‍රික්කය මුලික කර ගනිමින් ක්ෂේත්‍ර වෙත හඳුන්වාදීමේදී, පැන නැගුණු ගැටළු හා හඳුනාගන්න ලද ගැටළු/ නව අවශ්‍යතා අනුව AIMS පද්ධතිය තව දුරටත් සංවර්ධනය කෙරිණි. එහිදී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය හා ඒකාබද්ධව, ඔවුන්ගේ මූල්‍ය දායකත්වය යටතේ, GeoEdge ආයතනය විසින් සංවර්ධන කටයුතු සිදුකරන ලදී.

- **කෘෂිකාර්මික තොරතුරු කළමනාකරණ පද්ධතිය (AIMS) හා වෙබ්/ජංගම යෙදවුම (Web/Mobile Application) ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික මෙවලම් ලබා දීම සඳහා නව වැඩපිළිවෙලක් සකස් කිරීම.**

AIMS පද්ධතිය ක්ෂේත්‍රය තුළ වඩාත් කාර්යක්ෂමව භාවිතය සඳහා මණ්ඩලීය අදාළ සියළුම කාර්ය මණ්ඩලය සතුව ප්‍රශස්ත මට්ටමේ තාක්ෂණික මෙවලම් (ස්මාර්ට් ජංගම දුරකථන /ටැබ් යන්ත්‍ර) පැවතිය යුතු වේ. ඒ අනුව මණ්ඩලීය මුල්‍ය දායකත්වයන් සහිතව, නිලධාරීන් වෙත තාක්ෂණික මෙවලම් ලබා ගැනීමට ණය මුදලක් ලබා දීමට අදාළව මූලික කටයුතු 2023 වර්ෂයේ අවසාන භාගයේ සිට සිදු කරමින් පවතී. ඒ අනුව අදාළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කිරීමට නියමිතයි.

**<u>වගා හානි අධික්ෂණය සඳහා නව තාක්ෂණික ක්‍රමවේද හදුන්වාදීම.</u>**

2023 යල කන්නයේ පැවති දැඩි නියඟය හේතුවෙන්, වගා හානි වැඩි වශයෙන් වාර්තා වූ රත්නපුර - උඩවලව යන ප්‍රදේශ ආශ්‍රිතව, වගා හානි ඇස්තමේන්තු කටයුතු කඩිනමින් සිදු කරගැනීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ඩ්‍රෝන තාක්ෂණ ඒකකයේ සහය ඇතිව මණ්ඩලීය ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලයන්හි නිලධාරීන් කණ්ඩායමකගේද සහභාගිත්වයෙන් ඩ්‍රෝන මෙහෙයුම් සිදු කරන ලදී. එසේ ලබා ගන්න ලද ඡායාරූප, වගා හානි තක්සේරු කටයුතු සඳහා යොදා ගන්න ලදී.

තවද ඩ්‍රෝන තාක්ෂණ සහය වඩාත් කාර්යක්ෂමව ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීමට අදාල කටයුතු අවසන් කර ඇති අතර. 2024 වර්ෂය ආරම්භයේ සුදුසු දිනයකදී ගිවිසුම් අත්සන් කිරීමේ කටයුතු සිදු කිරීමට නියමිතව පවතී

**<u>කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කිරීම.</u>**

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය සඳහා මෙතෙක් පැවති වෙබ් අඩවිය වෙනුවට, නව මුහුණුවරක් සහිත නව වෙබ් අඩවියක් සකස් කිරීමේ කටයුතු 2023 වර්ෂයේදී ආරම්භ කරන ලදී. ඒ අනුව නිසි ක්‍රියාවලියක් යටතේ තෝරාගත් වෙබ් අඩවි සංවර්ධන ආයතනයක සහය ඇතිව මණ්ඩලය සඳහා නව වෙබ් අඩවියක් නිර්මාණය කිරීමේ කටයුතු සැලසුම් අංශයේ මුලිකත්වයෙන් සිදු කරන ලදී. එසේ සකස් කර අවසන් කරන ලද වෙබ් අඩවිය, යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා මණ්ඩලීය තොරතුරු තාක්ෂණ අංශය වෙත භාර දෙන ලදී.

**<u>ලිපි ශීර්ෂ සකස් කිරීම.</u>**

දැනට ප්‍රධාන කාර්යාලය විසින් භාවිතා කරනු ලබන ලිපි ශීර්ෂය යාවත්කාලීන කිරීම හා දිස්ත්‍රික් කාර්යාල 30 සඳහා නව ආකෘතියක් යටතේ ලිපි ශීර්ෂ සකස් කරන ලද අතර, ඒවා අවශ්‍ය කටයුතු සඳහා පාලන අංශය වෙත භාර දෙන ලදී.

## සම්පත් පැතිකඩ සකස් කිරීම.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සියළුම මූලික තොරතුරු ඇතුළත් කරමින් සම්පත් පැතිකඩ පොත නමින් පොතක් සකස් කර එළිදක්වන ලදී. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයට අදාළව මූලික පරිපාලන, රක්ෂණ හා මෙහෙයුම් තොරතුරු වඩාත් සංක්ෂිප්තව මෙහි ඇතුළත් කර ඇති අතර එම පොත මණ්ඩලය හා සෘජුව සම්බන්ධ වන බාහිර නිලධාරීන් වෙත හා මණ්ඩලීය දිස්ත්‍රික් කාර්යාල හා ප්‍රධාන කාර්යාලයේ අංශ වෙත මුද්‍රණය කර බෙදා හරින ලදී.

## රැස්වීම් කැලැන්ඩරය සකස් කිරීම

2024 වර්ෂය තුළ ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාලවල පැවැත්වීමට නියමිත රැස්වීම් හා සමාලෝචන පැවැත්වීමට අපේක්ෂිත දින ඇතුලත් කර 2024 වාර්ෂික රැස්වීම් කැලැන්ඩරය සකස් කරන ලද අතර, එය දිස්ත්‍රික් ප්‍රධානීන් හා අංශ ප්‍රධානීන් වෙත යොමු කරන ලදී.

# තොරතුරු තාක්ෂණ
# අංශය

## තොරතුරු තාක්‍ෂණ අංශය

2023-06-13 දින අප මණ්ඩලයේ ප්‍රථම වරට තොරතුරු තාක්‍ෂණය පෙර දැරි කර ගනිමින් ආරම්භ කරන ලද තොරතුරු තාක්‍ෂණ අංශය කෘෂිකාර්මික හා ගොවිජන රක්‍ෂණ මණ්ඩලයේ දැක්ම හා මෙහෙවර අනුව යමින්, මණ්ඩලයෙහි මෙහෙයුම් ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීම තුළින් වඩාත් ඵලදායී හා කාර්යක්ෂම සේවාවක් ලබා දීම වෙනුවෙන් අවශ්‍ය තාක්‍ෂණික සැලසුම් සකස් කිරීම, ඒ සඳහා අවශ්‍ය තොරතුරු රැස් කිරීම හා විශ්ලේෂණය කිරීම , එම සැලසුම් ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම ආදී කටයුතු වල නිරත විය.

## ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාලයන් ජාලගතකරණය සිදු කිරීම.

- ප්‍රධාන කාර්යාලය ජාලගතකරණය

2023 වර්ෂය අවසාන වන විට ප්‍රධාන කාර්යාලයේ ජාලගතකරණ කටයුතු සඳහා අවශ්‍ය බිම් සැලසුම් සියල්ල, එක් එක් අංශයන්ට අනුකූලව නිර්මාණය කර අවසන් කර ඇති අතර, කාර්යාලයෙහි පාලන අංශය, මුදල් අංශය, රක්‍ෂණ අංශය, සංවර්ධන අංශය, සැලසුම් අංශය, තොරතුරු තාක්‍ෂණ අංශය හා අධ්‍යක්‍ෂ ජනරාල්වරයාගේ කාර්යාලයෙහි ජාලගතකරණ ක්‍රියාවලිය මේ වන විට අවසන් කර ඇත.

- දිස්ත්‍රික් කාර්යාල ජාලගතකරණය

2021 වර්ෂය තුළ ආරම්භ කරනු ලැබූ දිස්ත්‍රික් කාර්යාල ජාලගතකරණ ක්‍රියාවලිය තොරතුරු තාක්‍ෂණ අංශය ස්ථාපනය කිරීමත් සමඟ එම ක්‍රියාවලියේ යාවත්කාලීන කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. ඒ අනුව 2023-08-08 දින Zoom තාක්‍ෂණ ඔස්සේ දිස්ත්‍රික් කාර්යාලයන් හා ප්‍රධාන කාර්යාලයේ එම අදාළ නිලධාරීන් සම්බන්ධ කර ගනිමින් රැස්වීමක් පැවැත් වූ අතර, එහි දී ප්‍රසම්පාදන ක්‍රමවේදයන්ට අනුකූලව මිල ගණන් කැඳවීමේ ලේඛනයන් ලබා ගනිමින් ජාලගතකරණ කටයුතු සිදු කිරීම හා 2021 වර්ෂය තුළ ජාලගතකරණය සිදු කර අවසන් කර ලද දිස්ත්‍රික් කාර්යාලයන්හි යම් අලුත්වැඩියා කටයුතු පවතින්නේ නම් එම අලුත්වැඩියා කටයුතු ද සිදු කරන මෙන් දැනුම් දෙන ලදී.
ඒ අනුව දිස්ත්‍රික් කාර්යාල විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් කැඳවීමේ ලේඛනයන්හි පවතින මිල ගණන් වර්තමාන වෙළෙඳ පොළ මිල ගණන් සමඟ සැසඳීම් සිදු කරමින් ඒ සඳහා අවශ්‍ය තාක්‍ෂණික සහය තොරතුරු තාක්‍ෂණ අංශය විසින් ලබා දෙමින්, මේ වන විට දිස්ත්‍රික් කාර්යාල 23ක ජාලගතකරණ ක්‍රියාවලිය අවසන් කර ඇත.

තවද, මීට සමගාමීව ERP පද්ධතියෙහි HRM මොඩියුලයට අදාළව දිස්ත්‍රික් කාර්යාලවල නිලධාරීන්ගේ පැමිණීමේ හා පිටවීමේ වේලාසටහන් දත්ත ලබා ගැනීමේ ක්‍රියාවලිය සඳහා දිස්ත්‍රික් කාර්යාලවල පවතින ඇඟිලි සලකුණු යන්ත්‍රයන් ප්‍රධාන ජාලයට සම්බන්ධ කිරීමේ කටයුතු කඩිනමින් ආරම්භ කළ අතර 2023 වර්ෂය අවසාන වන විට දිස්ත්‍රික් කාර්යාල 22ක මෙම ක්‍රියාවලිය සිදු කර අවසන් කරන ලදී.

**<u>මණ්ඩලයෙහි ප්‍රවර්ධන කටයුතු සඳහා තාක්‍ෂණික ක්‍රමවේදයන් යොදා ගැනීම.</u>**

- e-SMS සේවාව හඳුන්වා දීම.

තොරතුරු තාක්‍ෂණ අංශය ස්ථාපනය කිරීමත් සමඟ මණ්ඩලයෙහි ප්‍රචාරණ කටයුතු හා දැනුවත් කිරීමේ කටයුතු සිදු කිරීම සඳහා e -SMS සේවාවක් එනම් කෙටි පණිවිඩ සේවාවක් ආරම්භ කරන ලද අතර එමඟින් සියළුම දිස්ත්‍රික් කාර්යාල හා ප්‍රධාන කාර්යාලය තුළ සිදුවන පාරිභෝගික දැනුවත් කිරීම් හා අනෙකුත් ප්‍රවර්ධන වැඩසටහන් මෙම කෙටි පණිවිඩ සේවාව ඔස්සේ සිදු කරමින් පවතී.

තව ද, ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාළ දායකයින් යෝජනා ක්‍රමය තුළ සක්‍රිය ලෙස රඳවා තබා ගැනීම සඳහා මාසික කෙටි පණිවිඩ සේවාවක් ඔස්සේ ඔවුන් දැනුවත් කිරීම හා තෙවන පාර්ශවීය රක්ෂණ යෝජනා ක්‍රමයට අදාළව සිදු කරනු ලබන ගෙවීම් සම්බන්ධයෙන්ද පාරිභෝගිකයින් දැනුවත් කිරීම මෙම කෙටි පණිවිඩ සේවාව ඔස්සේ සිදු කරනු ලැබේ.

- මණ්ඩලීය ප්‍රධාන වෙබ් අඩවිය පවත්වාගෙන යාම.

තොරතුරු තාක්‍ෂණ අංශය ස්ථාපනය කිරීමත් සමඟ මණ්ඩලය සතුව පවතින ප්‍රධාන වෙබ් අඩවියෙහි තොරතුරු යාවත්කාලීන කිරීම, පවත්වාගෙන යාම මෙන්ම වෙබ් අඩවිය හා සම්බන්ධ සංවර්ධන ආයතනය සම්බන්ධීකරණය කිරීම ආදී ක්‍රියාවලීන් සිදු කරන ලදි.

**<u>අංශ හා දිස්ත්‍රික් කාර්යාල අතර සම්බන්ධීකරණය සිදු කිරීම හා බාහිර ආයතන අතර සම්බන්ධීකරණය</u>**

- අංශ හා දිස්ත්‍රික් කාර්යාල අතර සම්බන්ධීකරණය

දිස්ත්‍රික් කාර්යාල හා ප්‍රධාන කාර්යාලය තුළ පවතින දෘඩාංග හා ජාලකරණ ආශ්‍රිත ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා තොරතුරු තාක්‍ෂණ අංශයේ නිලධාරීන් විසින් දුරස්ථ සන්නිවේදන ක්‍රම ඔස්සේ තාක්‍ෂණික සහය නිරන්තරයෙන් ලබා දෙන අතර, අවශ්‍ය අවස්ථාවල දී එම දිස්ත්‍රික් කාර්යාල වෙත ගොස් එහි ඇති වී ඇති ගැටළු සඳහා අවශ්‍ය තාක්‍ෂණික සහය ලබා දීමට කටයුතු සිදු කරන ලදී.

- බාහිර ආයතන අතර සම්බන්ධීකරණය

කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් හා එම අමාත්‍යාංශය යටතේ පවත්වනු ලබන ව්‍යාපෘතීන්ට (IDAT) අදාළ රැස්වීම් හා පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම, ඊට අදාළව ඉල්ලුම් කරන ලද තාක්‍ෂණික වාර්තාවන් සකස් කිරීම හා එම වාර්තාවන් ආයතන ප්‍රධානින් මඟින් අදාළ ආයතන වෙත කඩිනමින් යොමු කිරීමට කටයුතු කරන ලදි.

**<u>පුහුණු වැඩසටහන් පැවැත්වීම</u>**

තොරතුරු තාක්‍ෂණ අංශය මඟින් මණ්ඩලයෙහි නිලධාරීන්ගේ තාක්‍ෂණික සාක්ෂරතාවය තව දුරටත් වර්ධනය කිරීම අරමුණු කරගනිමින් පුහුණු වැඩසටහන් මාලාවක් සංවිධානය කර ඇත.

ඒ යටතේ 2023-08-05 දින හා 2023-08-06 යන දෙදින කොළඹ, කළුතර හා ගම්පහ යන දිස්ත්‍රික් කාර්යාලයන් මූලික කර ගනිමින් එහි සියළුම නිලධාරීන් සඳහා කාර්යාල තුළ භාවිතා වන මූලික තාක්‍ෂණික ක්‍රමවේද, දෘඩාංග හා ජාලකරණ භාවිත පිළිබඳව ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත් පුහුණු වැඩමුළු මාලාවක් පවත්වන ලදි.

## ව්‍යාපෘති හා පර්යේෂණ කටයුතු ක්‍රියාත්මක කිරීම

- ERP පද්ධතිය ක්‍රියාත්මක කිරීම

GIZ (Deutsche Gesellschaft für Internationale Zusammenarbeit) ආයතනයෙහි මූල්‍ය ආධාර යටතේ මණ්ඩලයෙහි අභ්‍යන්තර පරිපාලන හා මෙහෙයුම් ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීම සඳහා ERP (Enterprise Resource Planning) පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තාක්ෂණික ක්‍රියාවලින් සිදු කිරීම හා සැලසුම් සකස් කරන ලදි.

ඒ යටතේ අභ්‍යන්තර පරිපාලන කටයුතු සිදු කිරීම සඳහා HRM මොඩියුලයට අදාළව සකස් කරන ලද වෙබ් හා ජංගම යෙදුම මේ වන විට මණ්ඩලයෙහි සියළුම නිලධාරීන් වෙත හදුන්වා දී ඇති අතර, ඒ සඳහා අවශ්‍ය පුහුණු සැසියන් ද පවත්වා ඇත.

තවද, තෙවන පාර්ශවීය රක්ෂණ යෝජනා ක්‍රමයට අදාළව සකස් කර ඇති වෙබ් යෙදුම ඔස්සේ බස්නාහිර පළාතෙහි පවතින දිස්ත්‍රික් කාර්යාලයන් මූලික කර ගනිමින් රක්ෂණ කටයුතු සිදු කිරීම ආරම්භ කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික සහය තොරතුරු තාක්ෂණ අංශය මගින් ලබා දීමට කටයුතු කර ඇත.

- විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාළ වෙබ් යෙදුම පවත්වාගෙන යාම

නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ආරම්භ කිරීමත් සමගම අපගේ දිස්ත්‍රික් කාර්යාල ජාලය හා සම්බන්ධ වෙමින් යෝජනා ක්‍රමයට දායක කරගන්නා ගොවීන්ගේ තොරතුරු ප්‍රධාන කාර්යාලය වෙත ලබා ගැනීම සඳහා නි ක්‍රම වේදයක් නොතිබුණු අතර, මෙම ගැටළුව නිරාකරණය කිරීම සඳහා දිස්ත්‍රික් කාර්යාල මගින් බඳවා ගන්නා ගොවීන්ගේ සියළු තොරතුරු එම අවස්ථාවේදීම ප්‍රධාන කාර්යාලයට ලබා ගත හැකිවන පරිදි Web Base පද්ධතියක් අප මණ්ඩලය විසින් ම නිර්මාණය කර දීමට සමත් විය. ඒ අනුව 2022 වර්ෂය තුළ මෙම කටයුත්ත ආරම්භ කළ අතර, 2023 වර්ෂය වන විට එහි වැඩිදියුනු කිරීම් රැසක් සමඟින් එහි කටයුතු අවසන් කර ඇත. පද්ධතිය භාවිතයේ දී ඇතිවන ගැටළු සම්බන්ධයෙන් අවශ්‍ය සියළුම තාක්ෂණික සහය තොරතුරු තාක්ෂණ අංශය විසින් නිරන්තරයෙන් ලබා දෙමින් පවතී.

තවද, පවතින ගොවි විශ්‍රාම වැටුප් හා ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාළව භාවිත කරනු ලබන පරිගණක යෙදුම් (Desktop Applications) පවත්වා ගෙන යාම හා එම යෙදුම් ERP පද්ධතිය සමඟ සම්බන්ධ කිරීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවති.

# මුදල් අංශය

## මූල්‍ය සම්පිණ්ඩනය

2023 වර්ෂය තුල මණ්ඩලයේ කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය රුපියල් මිලියන 877ක ශුද්ධ ලාභයක් උපයාගත් අතර, මෙම වර්ෂය තුලදී උපයාගත් මෙහෙයුම් ලාභය රුපියල් මිලියන 1,268 කි.

2018 අය වැය යෝජනා අනුව අනිවාර්ය රක්ෂණ යෝජනා ක්‍රමය, එම භෝග වර්ග හය සඳහා මෙම වර්ෂයේදීද ක්‍රියාත්මක කරන ලද අතර, ඒ තුලින් වී, බඩඉරිඟු, ලොකු ළූණු, අර්තාපල්, සෝයා, මිරිස් යන භෝග සඳහා අක්කරයකට රු. 40,000/- ක උපරිමයකට යටත්ව ආවරණය සැළසීමට කටයුතු කර ඇත.

අඛණ්ඩව පැවති කාලගුණික හා දේශගුණික විපර්යාසයන්ගෙන් සිදුවූ බලපෑම සළකා බලා වර්ෂය තුල ගොවීන්ගෙන් අයකරනු ලබන වාර මුදල ඔවුන්ගෙන් අය නොකර රජය විසින් ලබාදීමට තීරණය කල අතර, එම මුදල රුපියල් මිලියන 1,000 කි.

මීට අමතරව 2023 වර්ෂය තුළදී අතිරේක රක්ෂණ වාර මුදලක් අය කිරීම තුලින් වගාවන්ට සිදුවන සියළු අවදානම් ආවරණය වන පරිදි අවම වාරික මුදල රු. 6,400/- කට යටත්ව, රු. 100,000/- ක් දක්වා අක්කරයකට ලබාදෙන වන්දි මුදල වැඩිකිරීමට කටයුතු කර ඇත.

තවද, රටෙහි පවතින ආර්ථික අර්බුදය යටතේ වුවද, 2023 වර්ෂයේදී මණ්ඩලීය අනෙකුත් රක්ෂණ යෝජනා ක්‍රම වල පෙර වර්ෂයට සාපේක්ෂව 21.06 % ක වර්ධනයක් අත්පත් කරගෙන ඇත.

2023 වර්ෂය තුල මණ්ඩලයේ අනිවාර්ය වගා රක්ෂණ වන්දි වගකීම රුපියල් මිලියන 2,116 ක් පමණ වී ඇත.

2023 වර්ෂය තුලදී, ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය මගින් ගොවීන් 175,006 ක් සඳහා රුපියල් මිලියන 4,488 ක ශුද්ධ මුදලක් විශ්‍රාම වැටුප් වශයෙන් ගෙවා ඇති අතර, ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය තුල ධීවරයින් 5,839 කට රුපියල් මිලියන 83.9 ක මුදලක් විශ්‍රාම වැටුප් වශයෙන් ගෙවන ලදී.

# පෙර වසර පහක මූල්‍ය තොරතුරු

**<u>ලාභදායීත්වය</u>**

- **<u>කෘෂි රක්‍ෂණ යෝජනා ක්‍රමය</u>**




| | 1<br>2019 | 2<br>2020 | 3<br>2021 | 4<br>2022 | 5<br>2023 |
|---|---|---|---|---|---|
| මෙහෙයුම් ලාභය (රු.) | 878 | 1,401.3 | 1,752 | 2,663 | 1,268.2 |
| ශුද්ධ ලාභය (රු.) | 652.3 | 1,153.7 | 1,494.4 | 2,208 | 877 |

2023 වර්ෂය තුල කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය රුපියල් මිලියන 877 ක ශුද්ධ ලාභයක් උපයාගත් අතර, එය 2022 වර්ෂයට සාපේක්ෂව 60.3% ක අඩුවීමක් පෙන්නුම් කරයි.

➢ <u>ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය</u>




| | 1<br>2019 | 2<br>2020 | 3<br>2021 | 4<br>2022 | 5<br>2023 |
|---|---|---|---|---|---|
| ආදායම (රු.) | 233.4 | 209.8 | 224 | 276.9 | 225.9 |
| මෙහෙයුම් වියදම (රු.) | 3,271 | 4,555 | 3,766 | 3,967.9 | 4,539.6 |

2023 වර්ෂය තුලදී ගොවීන් 175,006 කට රුපියල් මිලියන 4,488 ක් වූ ශුද්ධ විශ්‍රාම වැටුප් ගෙවීමක් සිදු කර ඇත. මෙම වර්ෂය තුල ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ මුළු මෙහෙයුම් වියදම රුපියල් මිලියන 4,539.6 ක් වූ අතර, පෙර වර්ෂයේ මෙන්ම මෙම වර්ෂය තුලදීද මහා භාණ්ඩාගාරය මගින් විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ප්‍රතිපාදන වශයෙන් රුපියල් මිලියන 4,395ක් ලබාදීමට කටයුතු කරන ලදී

➤ <u>ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය</u>




| | 1<br>2019 | 2<br>2020 | 3<br>2021 | 4<br>2022 | 5<br>2023 |
|---|---|---|---|---|---|
| ආදායම (රු.) | 53 | 29.6 | 35.2 | 102.5 | 130.7 |
| මෙහෙයුම් වියදම (රු.) | 67.2 | 115.4 | 78.7 | 81.7 | 87.2 |

2023 වර්ෂය තුලදී රුපියල් මිලියන 83.9 ක විශ්‍රාම වැටුපක් ධීවරයින් වෙත ගෙවා ඇති අතර, ඒ සඳහා මණ්ඩලය සතු අරමුදල් යොදා ගන්නා ලදී.

# සමස්ථ යෝජනා ක්‍රම සඳහා

# ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශනය

# හා

# කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය

# 2023

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය**

**<u>මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය</u>**

| | සටහන් | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය (සමූහය) | | කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය | |
|---|---|---|---|---|---|
| | | 31.12.2023 | 31.12.2022 | 31.12.2023 | 31.12.2022 |
| | | රු. | රු. | රු. | රු. |
| **වත්කම්** | | | | | |
| ජංගම නොවන වත්කම් | | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 1 | 234,540,729 | 58,734,565 | 226,825,080 | 53,958,365 |
| අස්පෘශ්‍ය වත්කම්-WIP ERP පද්ධතිය | | 72,002,970 | | 72,002,970 | |
| | | 306,543,699 | 58,734,565 | 298,828,050 | 53,958,365 |
| මූල්‍ය සාධන පත්‍ර | | | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | | 3,352,820,995 | 1,562,157,095 | 1,851,357,619 | 522,795,607 |
| | | 3,352,820,995 | 1,562,157,095 | 1,851,357,619 | 522,795,607 |
| **ජංගම වත්කම්** | | | | | |
| තොග | 2.1 | 38,538,139 | 35,479,124 | 33,271,478 | 31,718,050 |
| ලැබිය යුතු දෑ | 2.2 | 463,394,978 | 176,995,439 | 1,266,364,206 | 959,808,916 |
| ලැබිය යුතු වාරික | 2.3 | 1,288,180 | 4,254,814,019 | 371,734 | 4,252,903,299 |
| තැන්පතු හා පූර්ව ගෙවීම් | 2.4 | 30,537,026 | 6,075,139 | 30,537,026 | 6,075,139 |
| අත්තිකාරම් | 2.5 | 669,348 | 668,883 | 669,348 | 668,883 |
| කල්පිරීම දක්වා රඳවා ගත් මූල්‍ය සාධනපත්‍ර | 2.6 | 5,557,963,798 | 5,170,060,617 | 4,250,427,003 | 4,092,320,982 |
| මුදල් හා මුදල් සමාන දෑ | 2.7 | 38,520,272 | 88,918,257 | 32,364,702 | 84,816,800 |
| **මුළු ජංගම වත්කම්** | | 6,130,911,740 | 9,733,011,477 | 5,614,005,497 | 9,428,312,070 |
| **මුළු වත්කම්** | | **9,790,276,434** | **11,353,903,138** | **7,764,191,166** | **10,005,066,042** |
| **ස්කන්ධ හා බැරකම්** | | | | | |
| **ප්‍රාග්ධන හා සංචිත** | | | | | |
| භාණ්ඩාගාරය විසින් දායක කළ මූලික | | 50,000,000 | 50,000,000 | 50,000,000 | 50,000,000 |
| කෘ.ගො.ර.ම සමුච්චිත අරමුදල | 3 | (90,041,219,155) | (84,791,312,860) | 3,237,653,337 | 6,796,467,767 |
| රජයේ ප්‍රාග්ධන ප්‍රදානය | 4 | 17,330,189 | 12,128,064 | 17,330,189 | 12,128,064 |
| කෘ.ගො.ර.ම. සංචිත අරමුදල | 5 | 498,536,253 | 435,124,725 | 498,536,253 | 435,124,725 |
| ගොවි මරණ පාරිතෝෂිත අරමුදල | 6 | 1,427,193,842 | 1,292,310,847 | 1,391,994,627 | 1,258,775,352 |
| කාර්ය මණ්ඩල වෛද්‍ය රක්ෂණ අරමුදල | | 27,313,478 | 18,812,989 | 27,313,478 | 18,812,989 |
| කෙතට අරුණ අනිවාර්ය රක්ෂණ අරමුදල | | 706,503,600 | 706,503,600 | 706,503,600 | 706,503,600 |
| ප්‍රත්‍යාගණන සංචිත | | 172,530,347 | 60,979,167 | 165,680,347 | 58,129,167 |
| නිෂ්පාදන ප්‍රවර්ධන හා දිරි දීමනා අරමුදල | | 30,686,023 | 31,660,458 | 30,686,023 | 31,660,458 |
| ගොවි විශ්‍රාම වැටුප සඳහා රජයේ ප්‍රදානය | | 1,081,488,000 | 1,081,488,000 | - | - |
| ප්‍රාග්ධන ප්‍රදානය-GIZ | | 65,792,100 | 65,792,100 | 65,792,100 | 65,792,100 |
| | | (85,963,845,323) | (81,036,512,911) | 6,191,489,954 | 9,433,394,222 |
| **ජංගම නොවන බැරකම්** | | | | | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනය | | 55,462,953 | 61,124,642 | 22,103,553 | 24,842,727 |
| විශ්‍රාම වැටුප් බැරකම | | 92,430,794,402 | 87,503,204,014 | - | - |
| | | 92,486,257,355 | 87,564,328,656 | 22,103,553 | 24,842,727 |
| ජංගම බැරකම් | | | | | |
| මුද්‍රණ කටයුතු සඳහා ප්‍රතිපාදනය | | 1,922,699 | 1,742,199 | 600,000 | 500,000 |
| පූර්ව වාරික ලැබීම් | 7.1 | 115,686,318 | 45,942,713 | 115,686,318 | 45,942,713 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 7.2 | 2,137,472,315 | 4,464,350,957 | 425,556,787 | 188,859,992 |
| උපචිත වියදම් | 7.3 | 39,414,416 | 16,784,421 | 35,385,901 | 14,259,286 |
| හානිපූරණය සඳහා ප්‍රතිපාදනය | 7.4 | 973,368,653 | 297,267,103 | 973,368,653 | 297,267,103 |
| **මුළු ජංගම බැරකම්** | | 3,267,864,401 | 4,826,087,393 | 1,550,597,659 | 546,829,093 |
| **මුළු ස්කන්ධ හා බැරකම්** | | **9,790,276,434** | **11,353,903,138** | **7,764,191,166** | **10,005,066,042** |

මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල අවශ්‍යතා සමග අනුකූල වේ.

…………………………….. ………………………………….

මූල්‍ය ප්‍රධානී අධ්‍යක්ෂ මණ්ඩල

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබන ලද්දේ:

…………………………………….. …………………………………..

අධ්‍යක්ෂ මණ්ඩල සමාජික
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩල සමාජික
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය**
**විස්තීරණ ආදායම් ප්‍රකාශය**

| | | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය (සමූහය) | | කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය | |
|---|---|---|---|---|---|
| | | **31.12.2023** | **31.12.2022** | **31.12.2023** | **31.12.2022** |
| **ආදායම** | **සටහන්** | රු. | රු. | රු. | රු. |
| වාරික හා දායක මුදල් | 8.1 | 502,154,945 | 390,675,454 | 502,033,477 | 390,559,060 |
| රක්ෂණ වාරිකය- භාණ්ඩාගාර දායක මුදල | | 1,000,000,000 | 1,950,000,000 | 1,000,000,000 | 1,950,000,000 |
| හානිපූරණ සඳහා ප්‍රදාන - ජා.ර.හා.අ. - බෝග බද්ද | | 975,718,383 | 378,504,692 | 975,718,383 | 378,504,692 |
| පොළිය | 8.2 | 1,370,543,232 | 957,261,905 | 1,010,497,440 | 713,257,270 |
| **මුළු ආදායම** | | **3,848,416,560** | **3,676,442,051** | **3,488,249,300** | **3,432,321,022** |
| **භාණ්ඩාගාර බැඳුම්කර** | | | | | |
| **මෙහෙයුම් වියදම්** | | | | | |
| හානිපූරණය | 9.1 | (2,138,394,861) | (712,325,511) | (2,138,394,861) | (712,325,511) |
| මෙහෙයුම් වියදම් | 9.2 | (98,281,615) | (72,516,884) | (81,623,872) | (56,858,637) |
| විශ්‍රාම වැටුප් ගෙවීම් | | (4,572,552,593) | (3,997,234,231) | - | - |
| ශුද්ධ දායක මුදල්  හා පොළී ආපසු ගෙවිම | | (19,370,863) | (17,025,847) | - | - |
| සමූහ රක්ෂණ වාරිකය | | (18,322,800) | (18,946,560) | - | - |
| ආබාධිතතා පාරිතෝෂික ගෙවීම් | | (1,081,350) | (1,153,363) | - | - |
| විශ්‍රාම වැටුප් බැරකම වැඩිවීම | | (4,927,590,388) | (4,674,254,455) | - | - |
| | | **(11,775,594,470)** | **(9,493,456,851)** | **(2,220,018,733)** | **(769,184,148)** |
| **මෙහෙයුම් අතිරික්තය/(හිඟය)** | | **(7,927,177,910)** | **(5,817,014,801)** | **1,268,230,567** | **2,663,136,873** |
| විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා රජයේ ප්‍රදානය | | 4,395,000,000 | 3,968,000,000 | - | - |
| පරිපාලන වියදම් සඳහා රජයේ ප්‍රදානය | | 206,225,000 | 190,000,000 | - | - |
| වෙනත් ආදායම් | 10 | 18,223,887 | 9,820,858 | 14,348,633 | 6,745,479 |
| | | **4,619,448,887** | **4,167,820,858** | **14,348,633** | **6,745,479** |
| | | **(3,307,729,023)** | **(1,649,193,943)** | **1,282,579,200** | **2,669,882,353** |
| **වියදම්** | | | | | |
| පරිපාලන වියදම් | 11 | (513,935,624) | (417,450,417) | (299,864,500) | (229,100,720) |
| මූල්‍ය සහ වෙනත් වියදම් | 12 | (62,884,014) | (69,324,491) | (214,664) | (100,879) |
| **මුළු වියදම්** | | **(576,819,639)** | **(486,774,908)** | **(300,079,164)** | **(229,201,599)** |
| **ශුද්ධ අතිරික්තය /(හිඟය)** | | **(3,884,548,662)** | **(2,135,968,851)** | **982,500,036** | **2,440,680,754** |
| ආදායම් බදු වියදම | | (150,084,498) | (111,214,555) | (150,084,498) | (111,214,555) |
| **බදුවලින් පසු ලාභය** | | **(4,034,633,160)** | **(2,247,183,406)** | **832,415,538** | **2,329,466,199** |
| කෘෂොරම සංචිත අරමුදල සඳහා ප්‍රතිපාදන | | (63,411,528) | (133,156,844) | (63,411,528) | (133,156,844) |
| **ප්‍රතිපාදනවලින් පසු ශුද්ධ අතිරික්තය (හිඟය)** | | **(4,098,044,688)** | **(2,380,340,250)** | **769,004,009** | **2,196,309,355** |
| **වෙනත් විස්තිරණ ආදායම** | | | | | |
| පාරිතෝෂික ලාභ/(අලාභ) | | (3,372,120) | 37,127,258 | 725,417 | 11,488,992 |
| | | (3,372,120) | 37,127,258 | 725,417 | 11,488,992 |
| දේපළ, පිරියත හා උපකරණවල ප්‍රත්‍යාගණන අතිරික්තය | | 111,551,180 | - | 107,551,180 | - |
| **වෙනත් විස්තිරණ ආදායමෙන් පසු ශුද්ධ අතිරික්තය/(හිඟය)** | | **(3,989,865,628)** | **(2,343,212,992)** | **877,280,606** | **2,207,798,347** |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය**

**සමූහය**

| විස්තරය | ප්‍රාග්ධනය සඳහා රජයේ ප්‍රදානය රු. | සමුච්චිත අතිරික්තය / හිඟය රු. | ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන රු. | කෘ.ගො.ර.ම සංචිත අරමුදල රු. | ගොවි මරණ පාරිතෝෂිකය අරමුදල රු. | කාර්ය මණ්ඩල වෛද්‍ය රක්ෂණ අරමුදල රු. | කෙතට අරුණ අනිවාර්ය රක්ෂණ අරමුදල රු. | ප්‍රත්‍යාගණන සංචිතය රු. | නිෂ්පාදන ප්‍රවර්ධන සහ දිරි දීමනා අරමුදල රු. | භාණ්ඩාගාර බැඳුම්කර සඳහා රජයේ ප්‍රදානය රු. | ප්‍රාග්ධන ප්‍රදානය-GIZ රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **2022 ජනවාරි 01 දිනට ශේෂය** | **50,000,000** | **(82,567,401,019)** | **17,915,567** | **301,967,881** | **1,178,731,261** | **13,572,359** | **706,503,600** | **60,979,167** | **24,545,950** | **1,081,488,000** | **-** | **(79,131,697,234)** |
| පෙර වසර ගැලපීම | | 6,741,310 | | | | | | | | | | 6,741,310 |
| වර්ෂය තුළ එකතු කිරීම: | - | 112,559,841 | - | 133,156,844 | 18,946,560 | 5,503,200 | - | - | 15,552,007 | - | 65,792,100 | 351,510,551 |
| පොලී ආදායම | - | | | | 95,985,651 | 1,821,998 | - | - | - | - | | 97,807,649 |
| ක්‍රමක්ෂය- රජයේ ප්‍රදානය | - | - | (5,787,503) | - | - | - | - | - | - | - | | (5,787,503) |
| භාණ්ඩාගාර බැඳුම්කර | - | | | | (1,352,625) | (2,084,568) | - | - | (8,437,499) | | | (11,874,692) |
| ශුද්ධ අතිරික්තය /(හිඟය) | - | (2,343,212,992) | - | - | - | | | - | - | - | | (2,343,212,992) |
| **2022 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **50,000,000** | **(84,791,312,860)** | **12,128,064** | **435,124,725** | **1,292,310,847** | **18,812,989** | **706,503,600** | **60,979,167** | **31,660,458** | **1,081,488,000** | **65,792,100** | **(81,036,512,911)** |
| | | | | | | | | | | | | |
| වර්ෂය තුළ එකතු කිරීම: | - | 133,810,610 | 17,800,000 | 63,411,528 | 18,322,800 | 5,503,200 | | - | 7,740,142 | - | - | 246,588,280 |
| පෙර වසර ගැලපීම | | (1,282,300,096) | | | | | | | | | | (1,282,300,096) |
| පොලී ආදායම | | | | | 118,209,835 | 5,402,615 | | | | | | 123,612,450 |
| ක්‍රමක්ෂය- ගොවි විශ්‍රාම වැටුප් රජයේ ප්‍රදානය | - | - | (12,597,874) | - | - | - | | - | | | | (12,597,874) |
| ප්‍රතිලාභ ගෙවීම | | | | | (1,649,640) | (2,405,326) | | | (8,714,577) | | | (12,769,543) |
| ශුද්ධ අතිරික්තය /(හිඟය) | - | (4,101,416,809) | - | - | - | - | | 111,551,180 | | | | (3,989,865,628) |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **50,000,000** | **(90,041,219,155)** | **17,330,189** | **498,536,253** | **1,427,193,842** | **27,313,478** | **706,503,600** | **172,530,347** | **30,686,023** | **1,081,488,000** | **65,792,100** | **(85,963,845,323)** |

**ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය**
**කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය**

| විස්තරය | ප්‍රාග්ධනය සඳහා රජයේ ප්‍රදානය රු. | සමුච්චිත අතිරික්තය / හිඟය රු. | ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන රු. | කෘ.ගො.ර.ම සංචිත අරමුදල රු. | ගොවි මරණ පාරිතෝෂිකය අරමුදල රු. | කාර්ය මණ්ඩල වෛද්‍ය රක්ෂණ අරමුදල රු. | කෙතට අරුණ අනිවාර්ය රක්ෂණ අරමුදල රු. | ප්‍රත්‍යාගණන සංචිතය රු. | නිෂ්පාදන ප්‍රවර්ධන සහ දිරි දීමනා අරමුදල රු. | භාණ්ඩාගාර බැඳුම්කර සඳහා රජයේ ප්‍රදානය රු. | ප්‍රාග්ධන ප්‍රදානය-GIZ රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **2022 ජනවාරි 01 දිනට ශේෂය** | **50,000,000** | **4,588,669,420** | **17,915,567** | **301,967,881** | **1,146,766,066** | **13,572,359** | **706,503,600** | **58,129,167** | **24,545,950** | | **-** | **6,908,070,010** |
| වර්ෂය තුළ එකතු කිරීම: | - | | | 133,156,844 | 17,197,260 | 5,503,200 | - | - | 15,552,007 | - | 65,792,100 | 237,201,410 |
| පොලී ආදායම | - | | | | 95,985,651 | 1,821,998 | - | - | - | - | - | 97,807,649 |
| ක්‍රමක්ෂය- රජයේ ප්‍රදානය | - | - | (5,787,503) | - | - | - | - | - | - | - | - | (5,787,503) |
| ප්‍රතිලාභ ගෙවීම | - | | | | (1,173,625) | (2,084,568) | - | - | (8,437,499) | - | - | (11,695,692) |
| ශුද්ධ අතිරික්තය /(හිඟය) | - | 2,207,798,347 | - | - | - | | | - | - | - | - | 2,207,798,347 |
| **2022 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **50,000,000** | **6,796,467,767** | **12,128,064** | **435,124,725** | **1,258,775,352** | **18,812,989** | **706,503,600** | **58,129,167** | **31,660,458** | **-** | **65,792,100** | **9,433,394,222** |
| | | | | | | | | | | | | |
| වර්ෂය තුළ එකතු කිරීම: | - | - | 17,800,000 | 63,411,528 | 16,576,080 | 5,279,700 | | - | 7,740,142 | - | | 110,807,450 |
| පෙර වසර ගැලපීම | | (4,328,543,856) | | | | | | | | | | (4,328,543,856) |
| පොලී ආදායම | | | | | 118,209,835 | 5,402,615 | | | | - | | 123,612,450 |
| ක්‍රමක්ෂය- ගොවි විශ්‍රාම වැටුප් රජයේ ප්‍රදානය | - | - | (12,597,874) | - | - | - | | - | | - | | (12,597,874) |
| ප්‍රතිලාභ ගෙවීම | | | | | (1,566,640) | (2,181,826) | | | (8,714,577) | - | - | (12,463,043) |
| ශුද්ධ අතිරික්තය /(හිඟය) | - | 769,729,426 | - | - | - | - | | 107,551,180 | | - | | 877,280,606 |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **50,000,000** | **3,237,653,337** | **17,330,189** | **498,536,253** | **1,391,994,627** | **27,313,478** | **706,503,600** | **165,680,347** | **30,686,023** | **-** | **65,792,100** | **6,191,489,954** |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**<u>මුදල් ප්‍රවාහ ප්‍රකාශනය</u>**

| | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය (සමූහය) | | කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය | |
|---|---|---|---|---|
| | **31.12.2023** | **31.12.2022** | **31.12.2023** | **31.12.2022** |
| | රු. | රු. | රු. | රු. |
| **<u>මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ</u>** | | | | |
| ශුද්ධ අතිරික්තය/ (හිඟය) | (4,034,633,160) | (2,247,183,406) | 832,415,538 | 2,329,466,199 |
| **පහත දෑ සඳහා ගැලපුම්** | | | | |
| ක්ෂයවීම් | 27,335,936 | 20,284,691 | 25,683,272 | 19,098,611 |
| ක්‍රමක්ෂය- රජයේ ප්‍රදානය | (13,662,896) | (5,787,503) | (12,597,874) | (5,787,503) |
| පෙර වසර සම්බන්ධයෙන් ගැලපීම් | 111,116,357 | 17,000 | 111,214,357 | - |
| විශ්‍රාම වැටුප් බැරකම | 4,927,590,388 | 4,674,254,455 | - | - |
| හානිපූරණය සඳහා වෙන් කිරීම | | 256,165,108 | 882,188,483 | 256,165,108 |
| ආදායම් බදු සඳහා වෙන් කිරීම. | 150,084,498 | 111,214,555 | 150,084,498 | 111,214,555 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 7,740,142 | 15,552,007 | 7,740,142 | 15,552,007 |
| මරණ පාරිතෝෂිත වාරිකය | (1,746,720) | (1,749,300) | - | - |
| | **6,090,646,188** | **5,069,951,013** | **1,164,312,877** | **396,242,778** |
| දේපල, පිරියත, උපකරණ බැහැර කිරීම මත ලාභය/ අලාභය | (256,473) | - | (205,913) | - |
| විශ්‍රාමික පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන | 8,700,946 | 14,280,737 | 4,059,133 | 5,543,927 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය** | **2,064,457,500** | **2,837,048,344** | **2,000,581,635** | **2,731,252,904** |
| වට්ටෝරු භාණ්ඩවල (වැඩිවීම)/අඩුවීම | (3,059,015) | (25,034,696) | (1,553,427) | (22,731,247) |
| ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | (285,929,219) | 595,088,237 | (306,555,290) | 640,882,473 |
| ලැබිය යුතු වාරික (වැඩිවීම)/අඩුවීම | 3,906,687 | (1,350,541,389) | 2,912,413 | (1,350,454,452) |
| තැන්පතු සහ පූර්ව ගෙවීම් (වැඩිවීම)/අඩුවීම | (24,461,887) | (766,853) | (24,461,887) | (766,853) |
| අත්තිකාරම්හි (වැඩිවීම)/අඩුවීම | (465) | 74,036 | (465) | 74,036 |
| හානි පූරණය සඳහා ප්‍රතිපාදන වැඩිවීම /(අඩුවීම) | (206,086,932) | (1,117,883,393) | (206,086,932) | (1,117,883,393) |
| මුද්‍රණ කටයුතු සඳහා ප්‍රතිපාදන වැඩිවීම /(අඩුවීම) | 180,500 | (892,548) | 100,000 | (616,615) |
| පූර්ව වාරික අත්තිකාරම් වැඩිවීම /(අඩුවීම) | 69,743,604 | 20,111,350 | 69,743,604 | 21,811,701 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ වැඩිවීම /(අඩුවීම) | 379,239,560 | 105,768,423 | (103,526,763) | (97,796,357) |
| උපචිත වියදම් වැඩිවීම /(අඩුවීම) | 22,629,995 | (1,760,108) | 21,126,615 | (2,613,353) |
| | **(43,837,172)** | **(1,775,836,941)** | **(548,302,133)** | **(1,930,094,061)** |
| **<u>මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදිත මුදල්</u>** | **2,020,620,329** | **1,061,211,403** | **1,452,279,502** | **801,158,843** |
| විශ්‍රාමික පාරිතෝෂිකය - ගෙවන ලද | (17,734,755) | (340,755) | (6,072,890) | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | **2,002,885,574** | **1,060,870,648** | **1,446,206,612** | **801,158,843** |
| **<u>ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ</u>** | | | | |
| වෛද්‍ය රක්ෂණ අරමුදල | 8,500,488 | 5,240,630 | 8,500,488 | 5,240,630 |
| ගොවි මරණ පාරිතෝෂික අරමුදල | 136,629,715 | 115,328,886 | 133,219,275 | 112,009,286 |
| නිෂ්පාදන ප්‍රවර්ධන සහ දිරි දීමනා අරමුදල | (8,714,577) | (8,437,499) | (8,714,577) | (8,437,499) |
| වසර තුළ ආයෝජන | (2,178,567,081) | (1,272,411,519) | (1,486,668,033) | (881,605,059) |
| දේපල, පිරියත සහ උපකරණ මිලයට ගැනීම | (145,298,124) | (26,678,403) | (145,298,124) | (23,355,603) |
| දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් උත්පාදන | 355,410 | - | 302,260 | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින්ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(2,187,094,168)** | **(1,186,957,905)** | **(1,498,658,710)** | **(796,148,246)** |
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම් වලින්ජනිත වූ මුදල් ප්‍රවාහ</u>** | | | | |
| ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානය | | - | | - |
| ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රදානය | - | 65,792,100 | - | 65,792,100 |
| නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම අරමුදල | 20,730,787 | 6,741,310 | - | - |
| පැරණි විශ්රාම වැටුප් යෝජනා ක්රමය | 113,079,824 | 112,559,841 | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | **133,810,610** | **185,093,251** | **-** | **65,792,100** |
| **මුදල් හා මුදලට සමාන දෑ ශුද්ධ වැඩිවීම / (අඩුවීම)** | **(50,397,985)** | **59,005,993** | **(52,452,098)** | **70,802,697** |
| **වසර ආරම්භයේදී මුදල් සහ මුදලට සමාන දෑ** | **88,918,257** | **29,912,264** | **84,816,800** | **14,014,103** |
| **වසර අවසානයේදී මුදල් සහ මුදලට සමාන දෑ** | **38,520,272** | **88,918,257** | **32,364,702** | **84,816,800** |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**2023 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා**

## 1. පොදු ප්‍රතිපත්ති

### 1.1 වාර්තාකරණ අස්ථිත්වය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය (මෙහි මින් මතු "මණ්ඩලය" ලෙස සඳහන් කරනු ලබන) 1999 අංක 20 දරන පනතෙන් සංස්ථාගත කරන ලද අතර නුගේගොඩ, ගංගොඩවිල, සුභද්‍රාරාම පාරේ අංක 117 දරණ ස්ථානයේ පිහිටා ඇත.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම්වල ස්වභාවය

කෘෂිකාර්මික සහ උද්‍යාන භෝග සහ ඖෂධීය ශාක, පශු සම්පත්, ධීවර සහ වන විද්‍යාව, කෘෂිකාර්මික උපකරණ සහ මෙවලම් සහ කෘෂිකාර්මික උද්‍යාන විද්‍යාත්මක නිපැයුම් සහ ඖෂධීය ශාක, ධීවර සහ වනාන්තර නිෂ්පාදන ගබඩා කිරීම සහ සංරක්ෂණය ඇතුළුව කෘෂිකාර්මික රක්ෂණයේ මණ්ඩලය මූලිකවම නියැලී සිටියි. එසේම, කෘෂිකාර්මිකයන් සඳහා වෛද්‍ය ප්‍රතිලාභ සැපයීම, සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සහ පොහොර රක්ෂණ කටයුතුවල සහ කෘෂිකාර්මිකයන්ට හිමි රථ වාහන සඳහා තෙවන පාර්ශවිය රක්ෂණ ආවරණ සැපයීමේ මණ්ඩලය නිරතව සිටියි. සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළ මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවයෙහි වෙනසක් සිදු නොවුණි.

### 1.3 පිළියෙල කිරීමේ පදනම

#### (අ) අනුකූලතා ප්‍රකාශය

මෙම මූල්‍ය ප්‍රකාශන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය, අරමුදල් සහ සංචිතවල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වලින් සමන්විත වේ. මෙම ගිණුම් ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර/ ශ්‍රී.ල.ගි.ප්‍ර.) අනුකූලව පිළියෙල කර ඇත.

#### (ආ) මැනීම සඳහා පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් යෝග්‍ය අනාවරණ කරනු ලබන අවස්ථාවන් හැරුණු විට මෙම මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනමින් පිළියෙල කර ඇත.

**(ඇ) සංසන්දනාත්මක තොරතුරු**

ප්‍රවර්ථන කාල සීමාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධය ඉහළ නැංවීම පිණිස සහ අන්තර් කාලසීමා සංසන්දනීයභාවය වැඩිදියුණු කිරීම පිණිස, මූල්‍ය ප්‍රකාශනයන්හි වාර්තා කොට ඇති සියලු මුදල් ප්‍රමාණ සඳහා පෙර කාල සීමාවට අදාළ ප්‍රමාණාත්මක, ආඛ්‍යාන සහ විස්තරාත්මක තොරතුරු ඇතුළු සන්සන්දනාත්මක තොරතුරු හෙළිදරව් කර ඇත.

මූල්‍ය ප්‍රකාශනයන්හි අයිතමයන් ඉදිරිපත් කිරීම හෝ වර්ගීකරණය සංශෝධනය කරනු ලැබ ඇති විටිදී, වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සැපයීම පිණිස ප්‍රවර්ථන වසර සමග අනුකූල වනසේ සංසන්දනාත්මක මුදල් ප්‍රමාණ ද ප්‍රතිවර්ගීකරණය කර ඇත.

**(ඈ) කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය**

මෙම මුදල් ප්‍රකාශන මණ්ඩලයේ කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත්කර ඇත.

**(ඉ) තක්සේරු සහ තීරණ භාවිතය**

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර /.ශ්‍රී.ල.ගි.ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය වාර්තා සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කරනු ලැබූ වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම් ප්‍රමාණ භාවිතය කෙරෙහි බලපාන්නා වූ තීන්දු ,තක්සේරු සහ උපකල්පන සිදුකිරීමට කළමණාකාරීත්වයට නියම කරයි. යොදා ගනු ලැබූ මෙම ඇස්තමේන්තු සහ තීන්දු සැබෑ ප්‍රතිඵලවට වඩා වෙනස්විය හැක.

ඇස්තමේන්තු සහ පාදක උපකල්පන අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කිරීම අදාළ කාලසීමාවට පමණක් බලපාන්නේ නම්, ඒවා පිළිගනු ලබන්නේ එම ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කර ඇති කාලසීමාව තුළ වන අතර ප්‍රවර්ථන හා යම් අනාගත කාලසීමාවන්ට එම ප්‍රතිශෝධනය බලපාන්නේ නම් ප්‍රතිශෝධන කාලසීමා හා අනාගත කාලසීමාවන් සඳහා ද පිළිගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති ප්‍රමාණ මත වඩාත්ම සැළකිය යුතු බලපෑම් ඇති කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කිරීමේදී තක්සේරු ප්‍රකාශනවල හඳුනාගෙන ඇති ප්‍රමාණ මත වඩාත්ම සැලකිය යුතු බලපෑම් ඇතිකරන ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කිරීමේදී තක්සේරු අවිනිශ්චිතතා සහ තීරණාත්මක තීන්දු පිළිබඳ සැලකියයුතු ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන්වල අඩංගු කර ඇත.

**ඊ) ප්‍රවර්තන ව්‍යාපාරය (අඛණ්ඩ පැවැත්ම)**

ප්‍රවර්ථන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පැවතීමට මණ්ඩලයට ඇති හැකියාව පිළිබඳව කළමනාකාරිත්වය තක්සේරුවක් කර තිබේ. එබැවින්, ප්‍රවර්ථන ව්‍යාපාරයක පදනමින් මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව පිළියෙල කරනු ලැබේ.

## 2. වත්කම් හා ඒවායේ තක්සේරු පදනම

### 2.1 දේපළ, පිරියත හා උපකරණ

### (අ) හඳුනා ගැනීම සහ මැනීම

දේපල, පිරියත හා උපකරණ අයිතම ප්‍රකාශ කර ඇත්තේ පිරිවැයට හෝ එකතු වූ ක්ෂය කිරීම් හා හානිකරණ අලාභ අඩුකොට සාධාරණ වටිනාකමටය.

සියලු දේපළ, පිරියත සහ උපකරණ මුලින්ම වාර්තා කර ඇත්තේ සමුච්චිත ක්ෂයවීම් හෝ වටිනාකමේ සමුච්චිත හානිකරණ අඩුකර පිරිවැයටය. වත්කමක වැදගත් සංරචක වෙනම හඳුනාගනු ලැබ ක්ෂය කරනු ලැබේ. දේපලක, පිරියතක හෝ උපකරණයක සැලකිය යුතු කොටස් යම් කාල අන්තර තුළ ප්‍රතිස්ථාපනය කරනු ලැබීමට අවශ්‍ය වූ විට, ප්‍රතිස්ථාපිත කොටස පිළිගැනීමෙන් ඉවත් කර නව කොටස එය ආශ්‍රිත ප්‍රයෝජ්‍ය ආයු කාලය සහ ක්ෂයවීම සහිතව අස්තිත්වය මගින් පිළිගනු ලැබේ. අනෙකුත් සියලු අළුත්වැඩියා සහ නඩත්තු පිරිවැය දරන ලද වියදම් ලෙස ආදායම් ප්‍රකාශයේ හඳුනා ගනු ලැබේ.

රු. 34,081,97.03 ක මුළු ඓතිහාසික පිරිවැයක් සහිත පූර්ණව ක්ෂයකරන ලද වත්කම් දේපළ, පිරියත හා උපකරණවල ඇතුළත් කොට තිබේ.

### (ආ) පිරිවැය

දේපල, පිරියත හා උපකරණවල පිරිවැය ඒවායේ මිලදී ගැනීමේ මිලෙන් සහ අදාළ වත්කම එහි අපේක්ෂිත භාවිතය සඳහා වැඩකරන තත්ත්වයට ගෙන ඒම සඳහා වූ කිසියම් ඍජුවම ආරෝපණීය වූ පිරිවැයෙන් සමන්විත වේ.

වත්කම්වල ඉපැයුම් ධාරිතාවය දිගටම පවත්වා ගනු හෝ ඉහළ නැංවීම පිණිස ස්ථිර ස්වභාවයේ වත්කම් අත්කර ගැනීම, ව්‍යාප්ත කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා දරණ ලද තදනන්තර වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

ප්‍රධාන පරික්ෂාකිරීම් ඇතුළුව වෙනම ගිණුම් තබා ඇති දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයක සංරචකයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරණ ලද වියදම ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. අනෙකුත් තදනන්තර පිරිවැය ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ එම කොටස තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා ඒමට හැකියාවක් ඇත්නම් සහ අයිතමයේ පිරිවැය විශ්වසනීය ලෙස මැණිය හැකිනම් පමණි.

### (ඇ) ප්‍රත්‍යාගණනය

වත්කමක් ලෙස පිළිගැනීමෙන් පසුව, සාධාරණ වටිනාකම විශ්වසනීය ලෙස මැණිය හැකි ඉඩම් සහ ගොඩනැගිලි, කිසියම් තදනන්තර සමුච්චිත ක්ෂය සහ තදනන්තර සමුච්චිත හානි අලාභ අඩු කොට ප්‍රත්‍යාගණනය සිදුකළ දිනයට ප්‍රත්‍යාගණන වටිනාකමට දක්වා තිබේ. ප්‍රත්‍යාගණනය කරන ලද වත්කමක සාධාරණ වටිනාකම වාර්තාකරණ දිනයේදී එහි ධාරණ වටිනාකමින් ප්‍රමාණාත්මකව වෙනස් නොවන බව සහතික කිරීම පිණිස තක්සේරු කිරීම් සිදුකරනු ලැබේ.

මෝටර් රථ වාහන ප්‍රත්‍යාගණනය කිරීමේදී, ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනාගනු ලැබූ එම වත්කමේ ම කිසියම් පූර්ව අඩුවීමක් හිලව් කරන්නේ නම් හැර ප්‍රත්‍යාගණන වටිනාකමේ කිසියම් වැඩිවීමක් ස්කන්ධයේ ප්‍රත්‍යාගණන සංචිතයට බැර කරනු ලැබේ. වටිනාකමේ අඩුවීමක්, ප්‍රත්‍යාගණන සංචිතයේ කලින් හඳුනාගනු ලැබූ වැඩිවීමක් ඉක්මවා යන විටදී ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ. බැහැර කිරීමේදී, යම් ආශ්‍රිත ප්‍රත්‍යාගණන සංචිතයක් ප්‍රත්‍යාගණන සංචිතයෙන් රඳවාගත් ඉපැයුම්වලට මාරුකරනු ලබන අතර බැහැර කිරීම මත ලාභ හෝ අලාභ තීරණය කිරීමේදී ගිණුම්වලට ගනු නොලැබේ.

**(ඇ) ක්ෂයවීම්**

සරල මාර්ග ක්‍රමය මත පහත දැක්වෙන වාර්ෂික අනුපාතයන්ට එම වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයුකාලය තුළ එම ප්‍රමාණ පොත්වලින් ඉවත්කිරීම පිණිස, ක්ෂයවීම් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ වැය බරක් සේ දක්වනු ලබයි.

| | |
|---|---|
| ගොඩනැගිලි | 4% |
| රථ වාහන | 20% |
| ලීබඩු සහ සවිකිරීම් | 10% |
| ප්‍රචාරක උපකරණ | 10% |
| හානි වැළැක්වීමේ උපකරණ | 10% |
| අස්වනු කැපීමේ උපකරණ | 10% |
| පාපැදි | 20% |
| මිනින්දෝරු උපකරණ | 10% |
| කිරුම් උපකරණ | 10% |
| සුබසාධන උපකරණ | 10% |
| දුරකථන | 20% |
| පරිගණක | 20% |
| යතුරු පැදි | 20% |

## 2.2 අස්පෘශ්‍ය වත්කම්

වත්කමට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒම අපේක්ෂා කරන්නේ නම් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ශ්‍රී.ල.ගි.ප්‍ර. - 38 අස්පෘශ්‍ය වත්කම් ප්‍රකාරව වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස මැණිය හැකි නම් අස්පෘශ්‍ය වත්කමක් පිළිගනු ලැබේ. ඒ අනුව, මෙම වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය සහ කිසියම් සමුච්චිත හානි අලාභ අඩුකර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වනු ලැබේ.

පරිගණක මෘදුකාංග සරල රේඛීය ක්‍රමය මත වසර 5 ක කාල සීමාවක් පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ.

## 2.3 වට්ටෝරු භාණ්ඩ

වට්ටෝරු භාණ්ඩ ප්‍රකාශ කර ඇත්තේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයන්ගෙන් වඩා අඩු අගයටය. ශුද්ධ උපලබ්ධි කළ අගය යනු, තොගයක් සමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී විකිණිය හැකි ඇස්තමේන්තු මිලෙන්

එම තොග වැඩි දුරටත් සම්පූර්ණ කිරීමට දැරිය යුතු ඇස්තමේන්තුගත විකුණුම් වියදම් අඩුකළපසු ලැබෙන අගයයි. මෙම පිරිවැයට තොග භාණ්ඩ අත්කර ගැනීමේ සහ ඒවා දැනට තිබෙන ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒමට දරණ ලද වියදම ද ඇතුළත්ය.

## 2.4 මූල්‍ය වත්කම්

ශ්‍රී.ල.ගි.ප්‍ර. 39 හි විෂය පථය තුළ මූල්‍ය වත්කම් ලෙස ලාභ හෝ අලාභ තුලින් පැන නගින සාධාරණ වටිනාකමක් ඇති මූල්‍ය වත්කම්, ණය සහ ලැබිය යුතු දෑ, කල් පිරීම තෙක් රඳවා ගත් ආයෝජන, විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් හෝ සඵල ඉදිරි රැකුමක, ඉදිරි රැකුම් සාධන පත්‍ර ලෙස නම් කරනු ලැබූ සාධාරණ වටිනාකමට ඇති ව්‍යුත්පන්න උපකරණ මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

මූල්‍ය වත්කම්හි මූලික පිළිගැනීම මත අධ්‍යක්ෂ මණ්ඩලය ඒවායේ වර්ගීකරණය තීරණය කරයි.

සියලු මූල්‍ය වත්කම් ආරම්භයේදී සාධාරණ වටිනාකමට, ලාභ හෝ අලාභ තුලින් පැන නගින සාධාරණ වටිනාකමට නොවන අවස්ථාවන්හිදී සෘජුව ආරෝපණීය ගනුදෙනු පිරිවැයටත් පිළිගනු ලැබේ.

මූලිකවම ණය සහ ලැබිය යුතු දෑ සහ තැන්පත් ඒවා ආරම්භ කරනු ලබන දිනයේදී හඳුනාගනු ලැබේ. අනෙකුත් සියලු මූල්‍ය වත්කම් (ලාභ සහ පාඩු තුලින් පැන නගින සාධාරණ වටිනාකමට නියම කල වත්කම් ඇතුළුව) ආරම්භයේදී හඳුනාගනු ලබන්නේ සාධන පත්‍රයේ ගිවිසුම්කර ප්‍රතිපාදනයන්ට මණ්ඩලය පාර්ශවකරුවකු වූ වෙළඳ දිනයටය.

යම් වත්කමකින් මුදල් ප්‍රවාහයන් කෙරෙහි ඇති ගිවිසුම්කර හිමිකම් අවසානවීමේදී හෝ මූල්‍ය වත්කමෙහි හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ පරිදාන සැලකිය යුතු ලෙස පවරනු ලබන විටකදී, ගනුදෙනුවක මූල්‍ය වත්කම් මත ගිවිසුම්කර මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය එය පවරන විටදී මණ්ඩලය මූල්‍ය වත්කම හඳුනා ගැනීම ඉවත් කරනු ලැබේ. පවරනු ලැබූ මූල්‍ය වත්කමක් මණ්ඩලය විසින් නිර්මාණය කරනු ලැබූ හෝ රඳවා ගනු ලැබූ යම් බැඳියාවක්, වෙනම වත්කමක් හෝ බැරකමක් ලෙස හඳුනාගනු ලැබේ.

මූල්‍ය වත්කම් සහ බැරකම් හිලව් කරනු ලබන අතර මුදල් ප්‍රමාණ හිලව් කිරීමට මණ්ඩලයට නෛතික අයිතිවාසිකමක් ඇති විටකදී සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම උපලබ්ධිකර වත්කම සමගාමීව පියවීමට අදහස් කරන්නේ නම් පමණක් ශුද්ධ මුදල් ප්‍රමාණ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඉදිරිපත් කරනු ලැබේ.

මණ්ඩලයේ මූල්‍ය වත්කම්වලට මුදල් හා කෙටිකාලීන ආයෝජන සහ වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ ඇතුළත් වේ.

### (අ) ලාභ හෝ පාඩු තුලින් පැන නගින සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්

ලාභ හෝ පාඩු තුලින් පැන නගින සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්වලට වෙළඳාම සඳහා රඳවාගෙන සිටිනු ලබන මූල්‍ය වත්කම් සහ ලාභ සහ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මුල් පිළිගැනීම මත නම්කළ මූල්‍ය වත්කම් ඇතුළත් වේ. මූල්‍ය වත්කම් ආසන්න කාලීනව විකිණීමේ හෝ ප්‍රතිමිලදීගැනීමේ කාර්යය සඳහා අත්කරගෙන ඇත්නම් ඒවා වෙළඳාම සඳහා රඳවාගෙන ඇති සේ වර්ගීකරණය කරනු ලැබේ.

**(ආ)ණය සහ ලැබිය යුතු දෑ**

ණය සහ ලැබිය යුතු දෑ සක්‍රීය වෙළඳපොළක මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික ගණනය කිරීමෙන් පසුව එබඳු මූල්‍ය වත්කම් හානි අඩුකොට සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් තදනන්තරව ක්‍රමක්ෂිත පිරිවැය අනුව ගණනය කරනු ලැබේ. ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්කර ගැනීමේදී කිසියම් වට්ටමක් හෝ ආධිකාය්‍යක් සහ සඵල පොළී ක්‍රමවේදයේ අනුකලක කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමිනි. සඵල පොළී ක්‍රමවේද ක්‍රමක්ෂය විස්තීරණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ අන්තර්ගත කරනු ලැබේ. හානි හේතුකොට ගෙන ඇතිවන අලාභ මූල්‍ය පිරිවැයේ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

ණය සහ ලැබියයුතු දෑ සමන්විත වනුයේ වෙළඳ ලැබියයුතු දෑ, සේවක ණය, තැන්පතු අත්තිකාරම්, අනෙකුත් ලැබියයුතු දෑ සහ මුදල් සහ මුදලට සමාන දෑ ආදියෙනි.

**(ඇ) කල්පිරීම දක්වා රඳවාගනු ලැබූ ආයෝජන**

ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් සහ ස්ථාවර කල්පිරීම්, මණ්ඩලයට කල්පිරීම දක්වා රඳවා ගැනීමේ ධනාත්මක චේතනාවක් සහ හැකියාවක් ඇතිවිටදී, කල්පිරීම දක්වා රඳවා ගැනීම ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මූලික මැනීමෙන් පසුව කල්පිරීම දක්වා රඳවාගනු ලැබූ ආයෝජන හානි අඩුකොට සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂිත පිරිවැය අනුව මනිනු ලැබේ. සඵල පොළී ක්‍රමවේද ක්‍රමක්ෂය විස්තීරණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ අන්තර්ගත කරනු ලැබේ. හානි හේතු කොට ගෙන ඇතිවන අලාභ මූල්‍ය පිරිවැයේ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ. සඵල පොළී ක්‍රමවේද ක්‍රමක්ෂය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ අන්තර්ගත කරනු ලැබේ.

රජයේ සුරැකුම්පත්වල සහ ස්ථාවර තැන්පතුවල ආයෝජන කල්පිරීම දක්වා රඳවාගත් ආයෝජන යටතේ වර්ගීකරණය කර ඇත.

**(ඇ) විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන**

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් යනු විකිණීමට ඇති වත්කම් ලෙස නම් කර ඇති හෝ ඉහත සඳහන් කවර හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයකට වර්ගීකරණය කර නොමැති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික පිළිගැනීමට පසුව, ඒවා සාධාරණ වටිනාකමට ගණනය කරනු ලබන අතර හානි අලාභ හැර එහි වෙනස්කම් අනෙකුත් විස්තීර්ණ ආදායමේ හඳුනාගනු ලබන අතර, අරමුදල් සහ සංචිතවල වෙන්කර ඇති සාධාරණ වටිනාකමේ ඉදිරිපත් කරනු ලැබේ. විකිණීම සඳහා ඇති ණය සුරැකුම් මත පොළී ආදායම සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ගණනය කරනු ලබන අතර ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනාගනු ලැබේ. ආයෝජනයක් පිළිගැනීම ඉවත් කළ විට, අරමුදල් සහ සංචිතවල එකතු වූ ලාභය හෝ පාඩුව ලාභ හෝ අලාභවල ප්‍රතිවර්ගීකරණය කරනු ලැබේ.

මූලික හඳුනා ගැනීම මත විකිණීම සඳහා ඇති මූල්‍ය අයෝජනයක් ලෙස මණ්ඩලය කවර හෝ මූල්‍ය වත්කමක් නම් කර නොමැත.

### 2.5 මූල්‍ය වත්කම් හානිවීම

එක් එක් වාර්තාකරණ දිනයේදී මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවීමේ වාස්තවික සාක්ෂි ඇත්දැයි මණ්ඩලය තක්සේරු කරන අතර එවැනි හානිවීමක් සිදුව ඇත්නම්, වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ වත්මන් වටිනාකම අතර වෙනස ලබා ගැනීම මගින් හානියේ ප්‍රමාණය ගණනය කරනු ලැබේ.

## 3. බැරකම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය මත ජංගම බැරකම් ලෙස වර්ගීකරණය කර ඇති බැරකම් වනුයේ ඉල්ලුම මත හෝ වාර්තාකරණ දිනයේ සිට වසරක් තුළ ගෙවීමට නියමිතව ඇති දේය. ජංගම නොවන බැරකම් වනුයේ වාර්තාකරණ දිනයේ සිට වසරකට පසුව ගෙවීමට නියමිත ශේෂ වේ.

මෙම මූල්‍ය වාර්තා පිළියෙළ කිරීමේදී, දන්නා සියලු බැරකම් සඳහා හේතු දක්වා ඇත. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලයට නෛතික හෝ සම්මුතික බැඳීමක් ඇති විටදී සහ බැඳීම නිරාකරණය සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමටත් අවශ්‍ය කරනු ලැබීමට ඉඩ ඇති විටදී ප්‍රතිපාදන සහ බැරකම් පිළිගනු ලැබේ.

### 3.1 හිමිකම් පෑම් සඳහා ප්‍රතිපාදන

ගෙවීමට ඇති ඉල්ලුම් කර ඇති මුදල් සඳහා බැරකම භෝගයේ අවදානම් සාධක සහ රක්ෂිතයාගේ විෂය කරුණු මත පදනම්ව හඳුනාගනු ලැබේ. 2023 මූල්‍ය වසර සඳහා වන්දි ප්‍රතිපාදනය පහත වගුවෙන් පෙන්නුම් කෙරේ.

| **රක්ෂිත විෂයය** | **හානිපූරණ සඳහා ප්‍රතිපාදන(රු.)** |
|---|---:|
| කෙතට අරුණ | 908,154,690 |
| පශු සම්පත් | 4,000,000 |
| සුවසෙත රක්ෂණය/ පුද්ගල අනතුරු | 8,000,000 |
| අතිරේක භෝග | 4,020,400 |
| චංචල දේපළ | 49,193,563 |
| | **973,368,653** |

### 3.2 තෙවන පාර්ශවීය රක්ෂණ වන්දි සඳහා ප්‍රතිපාදන

තෙවන පාර්ශවීය ප්‍රතිපාදනය හඳුනාගනු ලබන්නේ අනුගාමී වසර තුනක ආදායමින් 15% ක හරිත සාමාන්‍ය අනුපාතයටය. එම 15% අනුපාතයෙන් පිළිවෙලින් 7% ක්, 5% ක් සහ 3% ක් වත්මන් වසරේ ආදායම, පෙර වසරේ ආදායම සහ පෙර වසරට පෙර වසරේ ආදායම සඳහා සමානුපාතිකව වෙන් කරනු ලැබේ.

### 3.3 බොල් ණය සඳහා ප්‍රතිපාදන

අඩමාන ණය සඳහා ප්‍රතිපාදන ලෙස මුළු කාර්යය මණ්ඩල ණයෙන් 5% ක ප්‍රතිපාදනයක් සලසා ඇත.

### 3.4 ආදායම් බදු සඳහා ප්‍රතිපාදනය

2017 අංක 17 දරන දේශීය ආදායම් බදු පනතට අනුව ආදායම් බදු ගෙවීම සඳහා ප්‍රතිපාදනයක් ගණනය කිරීමේ දී හා ලිවීමේ දී, බදු බැඳීම ආවරණය සඳහා වෙන් කරන ලද රු. 340,223,559 ක වටිනාකම නිරූපණය කරමින් ගෙවිය යුතු ආදායම් බද්ද (බැරකම) අනෙකුත් ගෙවිය යුතු දෑ යටතේ ශේෂ පත්‍රයේ පෙන්නුම් කරනු ලැබේ.

### 3.5 විශ්‍රාම ප්‍රතිලාභ

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - 19 ‘විශ්‍රාමික ප්‍රතිලාභ පිරිවැය’ අනුකූල වන පරිදි සියලු ස්ථිර සේවකයන් සඳහා සේවයේ පළමු වසර සම්පූරණ කිරීමේ සිට විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත. කෙසේ වෙතත්, 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත සමග සේවකයකු සඳහා වන වගකීම ඇති වනුයේ පස් වසරක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමේදී පමණි. බැරකම් සඳහා බාහිරින් අරමුදල් සපයනු නොලැබේ.

### 3.6 ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍ය බැරකම්

අසම්භාව්‍ය බැරකම් වනුයේ, ආර්ථික ප්‍රතිලාභ පැවරුම සිදු වීමට ඉඩක් නොමැති හෝ විශ්වාසනීය ලෙස මිණීමට නොහැකි අවස්ථාවන්හිදී අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වත්මන් බැඳීම් මගින් පමණක් පැවැත්ම තහවුරු කරන භාව්‍ය බැඳීම් වේ.

මණ්ඩලයේ ප්‍රාග්ධන වෙන්කිරීම් සහ අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනයන්හි අදාළ සටහන්වල හෙළිදරව් කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේදී සියලු දන්නා බැරකම් සඳහා හේතු දක්වා ඇත. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස නෛතික හෝ සම්මුතික බැඳීමක් මණ්ඩලයට ඇති විට දී සහ බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමක් සිදුවීමට ඉඩ ඇති විටදී ප්‍රතිපාදන හා බැරකම් හඳුනාගනු ලැබේ.

### 3.7 විශ්‍රාම බැරකම

විකුණුම් වියදම් අඩුකිරීමෙන් පසු ඇස්තමේන්තුගත විකුණුම් මිලය.මෙම පිරිවැයට තොග භාණ්ඩ අත්කර ගැනීමේ සහ ඒවා දැනට තිබෙන ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒමට දරන ලද වියදම ද ඇතුළත්ය.

## 2.4 මූල්‍ය වත්කම්

ශ්‍රී.ල.ගි.ප්‍ර. 39 හි විෂය පථය තුළ මූල්‍ය වත්කම් යෝග්‍ය පරිදි ලාභය හෝ පාඩුව, ණය සහ ලැබිය යුතු දෑ, කල් පිරීම තෙක් රඳවා ගත් ආයෝජන, විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් හෝ ඉදිරි රැකුම් සාධන පත්‍ර ලෙස නම් කරනු ලැබූ ව්‍යුත්පන්න හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

සිය මුල්‍ය වත්කම්හි මූලික පිළිගැන්ම මත අධ්‍යක්ෂ මණ්ඩලය ඒවායේ වර්ගීකරණය තීරණය කරයි.

සියලු මුල්‍ය වත්කම් ආරම්භයේදී සාධාරණ වටිනාකම ධන ලෙසත් ලාභ හෝ පාඩු මගින් වත්කම් සාධාරණ වටිනාකමට නොවන අවස්ථාවන්හිදී සෘජුව ආරෝපණීය ගනුදෙනු පිරිවැයටත් ආරම්භයේදී හඳුනාගනු ලැබේ.

ණය සහ ලැබිය යුතු දෑ සහ තැන්පත් ආරම්භයේදී ඒවා ආරම්භ කරනු ලබන දිනයේදී හඳුනාගනු ලැබේ. අනෙකුත් සියලු මූල්‍ය වත්කම් (ලාභ සහ පාඩු හරහා සාධාරණ වටිනාකමට අගය කළ වත්කම් ඇතුළුව) ආරම්භයේදී හඳුනාගනු ලබන්නේ සාධන පත්‍රයේ ගිවිසුම් ප්‍රතිපාදනයන්ට මණ්ඩලය පාර්ශවකරුවකු වූ වෙළඳ දිනයටය.

යම් වත්කමකින් මුදල් ප්‍රවාහයන් කෙරෙහි ඇති ගිවිසුම්කර හිමිකම් අවසානවීමේදී හෝ මූල්‍ය වත්කම හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ පරිදාන සැලකිය යුතු ලෙස පවරනු ලබන විටකදී ගනුදෙනුවක මූල්‍ය වත්කම් මත ගිවිසුම්කර මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය එය පවරන විටදී මණ්ඩලය මූල්‍ය වත්කම පිළිගැනීම ඉවත් කරනු ලැබේ. පවරනු ලැබූ මූල්‍ය වත්කමක් මණ්ඩලය විසින් නිර්මාණය කරනු ලැබූ හෝ රඳවා ගනු ලැබූ යම් බැඳියාවක්, වෙනම වත්කමක් හෝ බැරකමක් ලෙස හඳුනාගනු ලැබේ.

මූල්‍ය වත්කම් සහ බැරකම් හිලව් කරනු ලබන අතර, මුදල් ප්‍රමාණ හිලව් කිරීමට මණ්ඩලයට නෛතික අයිතිවාසිකමක් ඇති විටකදී සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම උපලබ්ධිකර වත්කම සමගාමීව පියවීමට අදහස් කරන්නේ නම් පමණක් ශුද්ධ මුදල් ප්‍රමාණ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඉදිරිපත් කරනු ලැබේ.

මණ්ඩලයේ මූල්‍ය වත්කම්වලට මුදල් සහ කෙටිකාලීන ආයෝජන සහ වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ ඇතුළත් වේ.

### (අ) ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්

ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්වලට වෙළඳාම සඳහා රඳවාගෙන සිටිනු ලබන මූල්‍ය වත්කම් සහ ලාභ සහ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මුල් පිළිගැනීම මත නම් කළ

මූල්‍ය වත්කම් ඇතුළත් වේ. මූල්‍ය වත්කම් ආසන්න කාලීනව විකිණීමේ හෝ ප්‍රතිමිලදී ගැනීමේ කාර්යය සඳහා අත්කර ගෙන ඇත්නම් ඒවා වෙළඳාම සඳහා රඳාවගෙන ඇති සේ වර්ගීකරණය කරනු ලැබේ.

ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්, විස්තිරණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමට හෝ මූල්‍ය වියදමට පිළිගනු ලැබූ සාධාරණ වටිනාකමේ වෙනස්කම් සහිතව සාධාරණ වටිනාකමට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වනු ලැබේ.

**(ආ) ණය සහ ලැබිය යුතු දෑ**

ණය සහ ලැබියයුතු දෑ සක්‍රීය වෙළඳපොළක මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික ගණනය කිරීමෙන් පසුව එබඳු මූල්‍ය වත්කම් හානි අඩුකොට සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් තදනන්තරව ක්‍රමක්ෂිත පිරිවැය අනුව ගණනය කරනු ලැබේ.ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්කර ගැනීමේදී කිසියම් වට්ටමක් හෝ ආධික්‍යයක් සහ සඵල පොළී ක්‍රමවේදයේ අනුකලක කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමිනි. සඵල පොළී ක්‍රමවේද ක්‍රමක්ෂය විස්තිරණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ අන්තර්ගත කරනු ලැබේ. හානිකරණ හේතුකොට ගෙන ඇතිවන අලාභ මූල්‍ය පිරිවැයේ විස්තිරණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

ණය සහ ලැබිය යුතු දෑ සමන්විත වනුයේ වෙළඳ ලැබීය යුතු දෑ, සේවක ණය, තැන්පතු අත්තිකාරම්, අනෙකුත් ලැබිය යුතු දෑ සහ මුදල් සහ මුදලට සමාන දෑ ආදියෙනි.

**(ඇ) කල්පිරීම දක්වා රඳවාගනු ලැබූ ආයෝජන**

ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් සහ ස්ථාවර කල්පිරීම්, මණ්ඩලයට කල්පිරීම දක්වා රඳවා ගැනීමේ ධනාත්මක අභිප්‍රායක් සහ හැකියාවක් ඇතිවිටදී, කල්පිරීම දක්වා රඳවා ගැනීම ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මූලික මනීමෙන් පසුව කල්පිරීම දක්වා රඳවාගනු ලැබූ ආයෝජන හානි අඩුකොට සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂිත පිරිවැය අනුව මනිනු ලැබේ. සඵල පොළී ක්‍රමවේද ක්‍රමක්ෂය විස්තිරණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ අන්තර්ගත කරනු ලැබේ. හානිකරණ හේතු කොට ගෙන ඇතිවන අලාභ මූල්‍ය පිරිවැයේ විස්තිරණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ. සඵල පොළී ක්‍රමවේද ක්‍රමක්ෂය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ අන්තර්ගත කරනු ලැබේ.

රජයේ සුරැකුම්පත් සහ ස්ථාවර තැන්පතුවල ආයෝජන, කල්පිරීම දක්වා රඳවා ගනු ලැබූ ආයෝජන යටතේ වර්ගීකරණය කර තිබේ.

**(ඈ) විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන**

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් යනු විකුණුම සඳහා ඇති ලෙස නම් කර ඇති හෝ ඉහත සඳහන් කවර හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයකට වර්ගීකරණය කර නොමැති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්

වේ .මූලික පිළිගැනීමට පසුව ,ඒවා සාධාරණ වටිනාකමට ගණනය කරනු ලබන අතර හානි අලාභ හැර එහි වෙනස්කම් අනෙකුත් විස්තීර්ණ ආදායමේ පිළිගනු ලබන අතර අරමුදල් සහ සංචිතවල වෙන්කර ඇති සාධාරණ වටිනාකමේ ඉදිරිපත් කරනු ලැබේ .විකිණීම සඳහා ඇති ණය සුරැකුම් මත පොළී ආදායම සඵල පොළී අනුපාතය භාවිතා කරමින් ගණනය කරනු ලබන අතර ලාභයෙහි හෝ අලාභයෙහි පිළිගනු ලැබේ .ආයෝජනයක් පිළිගැනීම ඉවත් කළ විට ,අරමුදල් සහ සංචිතවල එකතුවූ ලාභය හෝ පාඩුව ලාභ හෝ අලාභවල ප්‍රතිවර්ගීකරණය කරනු ලැබේ.

මූලික පිළිගැනුම මත විකිණීම සඳහා ඇති මූල්‍ය අයෝජනයක් ලෙස මණ්ඩලය කවර හෝ මූල්‍ය වත්කමක් නම් කර නොමැත.

**2.5 මූල්‍ය වත්කම් හානිකරණය**

සෑම වාර්තාකරණ දිනයකදීම මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවීමේ වාස්තවික සාක්ෂි ඇත්දැයි මණ්ඩලය තක්සේරු කරයන අතර එවැනි හානිකරණයක් සිදුව ඇත්නම්, වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ වත්මන් වටිනාකම අතර වෙනස ලබා ගැනීම මගින් හානියේ ප්‍රමාණය ගණනය කරනු ලැබේ.

## 3. බැරකම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය මත ජංගම බැරකම් ලෙස වර්ගීකරණය කර ඇති බැරකම් වනුයේ ඉල්ලුම මත හෝ වාර්තාකරණ දිනයේ සිට වසරක් තුළ ගෙවීමට නියමිතව ඇති දේය. ජංගම නොවන බැරකම් වනුයේ වාර්තාකරණ දිනයේ සිට වසරකට පසුව ගෙවීමට නියමිත ශේෂ වේ.

### 3.1 ගොවි විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ

මෙම මූල්‍ය වාර්තා සකස් කිරීමේදී, දන්නා සියලු බැරකම් සඳහා හේතු දක්වා ඇත .අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලයට නෛතික හෝ සම්මුතික බැඳීමක් ඇති විටදී සහ බැඳීම නිරාකරණය සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමත් අවශ්‍ය කරනු ලැබීමට ඉඩ ඇති විටදී ප්‍රතිපාදන සහ බැරකම් හඳුනාගනු ලැබේ .

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 4 හි 15 වැනි ඡේදයේ ප්‍රකාශ කර ඇති පරිදි, රක්ෂණ ගිවිසුම්වල දී, රක්ෂණ සමාගම එක් එක් වාර්තාකරණ කාල සීමාව අවසානයේදී, සිය රක්ෂණ ගිවිසුම් යටතේ අනාගත මුදල් ප්‍රවාහවල වත්මන් ඇස්තමේන්තු භාවිතා කරමින් සිය හඳුනාගත් රක්ෂණ බැරකම් ප්‍රමාණවත් ද යන්න තක්සේරු කළ යුතුය. අනාගත මුදල් ප්‍රවාහ සැලකිල්ලට ගත් විට සිය රක්ෂණ බැරකම්වල ධාරණ අගය (ආශ්‍රිත විලම්බිත අත්කර ගැනීමේ පිරිවැය සහ ආශ්‍රිත අස්පෘශ්‍ය වත්කම් අඩු කොට) ප්‍රමාණවත් නොවන බව එම තක්සේරුවෙන් පෙන්නුම් කරන්නේ නම්, සමස්ත ඌනතාවය ලාභ හෝ අලාභවල හඳුනා ගත යුතුය.

වෙළඳපොළ පොළී අනුපාතවල වෙනස්කම් සැලකිල්ලට ගනිමින් විශ්‍රාම වැටුප් බැරකම වැඩි කරනු ලැබ ඇති අතර ලාභ හා අලාභ ප්‍රකාශයේ වෙනත් විස්තීරණ ආදායමේ සහ සහ මූල්‍ය ප්‍රකාශනවල වෙනත් විස්තීරණ ආදායමේ ඌනතාවක් හඳුනා ගෙන තිබේ.

එබැවින්, වෙනත් විස්තීරණ ආදායම යටතේ ධීවර විශ්‍රාම වැටුප් බැරකමේ එකී වැඩිවීම ඉහත ප්‍රමිතියේ අවශ්‍යතා සමග අනුකූල වේ.

### 3.1 විශ්‍රාම ප්‍රතිලාභ

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 'විශ්‍රාමික ප්‍රතිලාභ පිරිවැය' අනුකූල වන පරිදි සියලු ස්ථිර සේවකයන් සඳහා සේවයේ පළමු වසර සම්පූරණ කිරීමේ සිට විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත . කෙසේවෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත සමග සේවකයකු සඳහා වන වගකීම ඇති වනුයේ පස් වසරක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමේදී පමණි. බැරකම් සඳහා බාහිරින් අරමුදල් සපයනු නොලැබේ.

### 3.2 ප්‍රාග්ධන වෙන්කිරීම් සහ අසම්භාව්‍ය බැරකම්

අසම්භාව්‍ය බැරකම් වනුයේ ආර්ථික ප්‍රතිලාභ පැවරුම සිදු වීමට ඉඩක් නොමැති හෝ විශ්වාසනීය ලෙස මිණීමට නොහැකි අවස්ථාවන්හිදී අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වත්මන් බැඳීම් මගින් පමණක් පැවැත්ම තහවුරු කරන භව්‍ය බැඳීම් වේ .

මණ්ඩලයේ ප්‍රාග්ධන වෙන්කිරීම් සහ අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනයන්හි අදාළ සටහන්වල හෙළිදරව් කර ඇත.

### 3.4 ගොවි විශ්‍රාම අරමුදලේ බැරකම්

ගොවි විශ්‍රාම අරමුදලේ බැරකම් 2007 දී සිදුකරන ලද ආයුගණක ගණනය කිරීම මත වත්මන් වටිනාකම පාදකව මූල්‍ය ප්‍රකාශනයන්හි ගිණුම් ගත කර ඇත. ගොවීන් විසින් නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට සිදු කරන ලද රු. මිලියන 20.7ක දායක මුදල සමගින් අරමුදලින් ඉපැයූ පොළිය ගොවි විශ්‍රාම වැටුපට වෙන් කර තිබේ. වයස අවුරුදු 60 සම්පූර්ණ වීමේදී ගොවීන්ට විශ්‍රාම වැටුප් ගෙවීම පිණිස අරමුදල ගොඩ නැගීම සඳහා මෙම ප්‍රතිපාදනය අවශ්‍ය වේ. සටහන් අංක 07 යටතේ මෙය හෙළිදරව් කර ඇත.

## 4. විස්තීරණ අදායම් ප්‍රකාශනය

### 4.1 ආදායම

අ) මණ්ඩලයේ ආදායම විශ්‍රාම වාරික ආදායම, භාණ්ඩාගාර බිල්පත්වල පොළී ආදායම සහ වෙනත් විවිධ ආදායම් නියෝජනය කරයි.

ආ) වාරික එකතුකිරීමෙන් ලත් සියලු ආදායම් මුදල් පදනමකින් පිළිගනු ලැබේ.

## 4.2 ආදායම පිළිගැනීම

අ) විශ්‍රාම වැටුප් වාරික ආදායම රක්ෂිත කාලය සඳහා පිළිගනු ලැබේ .

ආ) ඉහත ආදායම උපචිත පදනමකින් වන අතර අදාළ වියදම් සමග ගලපනු ලැබේ.

ඇ) පොළී ආදායම කාල පදනමකින් උපචිත වේ .

## 4.3 රජයේ ප්‍රදාන සඳහා ගිණුම්කරණය

දරන ලද වියදම් වෙනුවෙන් මණ්ඩලයට ගෙවනු ලබන ප්‍රදාන එම වියදම් පිළිගනු ලැබූ කාල සීමාව තුළ ආදායම් ලෙස විස්තීර්ණ ආදායමේ හඳුනාගනු ලැබේ. වත්කමක පිරිවැය සඳහා මණ්ඩලයට ගෙවනු ලබන ප්‍රදාන ආශ්‍රිත වත්කමේ ප්‍රයෝජ්‍ය ආයු කාලය පුරා ක්‍රමික පදනමකින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

## 4.4 වියදම

දරන ලද පිරිවැය සහ නිශ්චිත වියදම් අයිතම ඉපැයුම අතර ඍජු සම්බන්ධතාවයේ පදනමින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වියදම් හඳුනාගනු ලැබේ. මණ්ඩලය පවත්වාගෙන යාම සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂම තත්වයෙන් පවත්වාගෙන යාම සඳහා දරන ලද සියලු වියදම්, වසර සඳහා අතිරික්තය සකස් කිරීමේදී ආදායමට බැර කර ඇත.

අංක 401/4 දරන 15.10.2008 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් පහත දැක්වෙන අනුපාත මත වෙන්කරනු ලැබූ මණ්ඩලයේ වක්‍ර වියදම් පහත දැක්වෙන පරිදි වේ.

| **වියදම** | **අනුපාත** |
|---|---|
| වැටුප් .සේ.අ.අ,සේ.භා.අ , | 50% |
| වෛද්‍ය වියදම් | 50% |
| උපදේශන ගාස්තු | 40% |
| සුබසාධනය | 50% |
| නිල ඇඳුම් | 48% |
| සංග්‍රහ | 40% |
| මුද්‍රණ | 40% |
| නෛතික ගාස්තු | 60% |
| දැනුවත්කිරීම් හා පුහුණු | 20% |
| අධ්‍යක්ෂ මණ්ඩල දීමනා | 40% |
| කුලී, දුරකථන | 40% |
| තැපැල් ගාස්තු | 55% |
| විදුලි | 40% |

| | |
|---|---|
| ගමන්අතිකාල | 50% |
| ජල බිල්පත් | 40% |
| දෛනික වේතන | 50% |
| ආරක්ෂක කටයුතු | 20% |
| කාර්යාලීයඋපකරණ නඩත්තුව | 20% |
| වාහන නඩත්තුව | 40% |
| පරිගණක නඩත්තුව | 25% |
| ඉන්ධන වියදම් | 30% |
| ගොඩනැගිලි නඩත්තුව | 40% |
| ලිපි ද්‍රව්‍ය | 48% |

**5. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ "වක්‍ර ක්‍රමය " යොදා ගනිමිනි.

**6. වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම්**

වාර්තාකරණ දිනයෙන් පසු සිදුවන සිදුවීම්වල ප්‍රමාණවත් බව සලකා බලා ඇති අතර අවශ්‍ය තැන්හිදී ගිණුම්වල යෝග්‍ය ගැලපීම් සිදුකර ඇත.

**7. සම්බන්ධිත පාර්ශව ගනුදෙනු**

කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය හා ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ සම්බන්ධිත පාර්ශව ලෙස සලකනු ලැබේ. මෙම ආශ්‍රිත පාර්ශව සමග සිදුකළ ගනුදෙනු සාධාරණ වටිනාකම මත පදනම්ව හෙළිදරව් කරනු ලැබේ. ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමයෙන් රු. 295,230,441.79 ක ණයක් ලබා ගෙන ඇත.

**8. පෙර වසරේ ගැලපීම**

**8.1 ගෙවිය යුතු විශ්‍රාම වැටුප**

2012 සිට 2013 දක්වා කාල සීමාව සඳහා ගෙවිය යුතු රු. 3,046,341,760 ක් වන විශ්‍රාම වැටුප් මෙම වසර සඳහා මූල්‍ය වාර්තාවන්හි ගොවි විශ්‍රාම වැටුපට ගලපනු ලැබ ඇත.

**9. අවිනිශ්චිත අවස්ථා**

මාවිල්ආරු අමුණ වසා දැමීමෙන් පීඩාවට පත් ගොවීන්ට වන්දි ගෙවීමේදී රුපියල් මිලියන 7කට ආසන්න මුදලක් සාවද්‍ය පරිහරණය සම්බන්ධයෙන් මණ්ඩලයේ නිලධාරීන් 3 දෙනෙකුට එරෙහිව නඩුවක් කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ විභාග වෙමින් පවතින අතර සාවද්‍ය මුදල් පරිහරණය සම්බන්ධයෙන් ඔවුනට එරෙහිව මහාධිකරණයේදී අධිචෝදනා ගොනු කිරීමට නියමිතය.

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය**

**<u>2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්</u>**

**<u>සටහන - 01</u>**

| විස්තරය | 2023.01.01 දිනට පිරිවැය/තක්සේරුව | බැහැර කිරීම | එකතු කිරීම | ප්‍රත්‍යාගණනය වෙත පැවරීම | ප්‍රත්‍යාගණනය | එකතුව | 2023.01.01 දිනට සමුච්චිත ක්ෂය | බැහැර කිරීම | වර්ෂය සඳහා ක්ෂය | ප්‍රත්‍යාගණනය වෙත පැවරීම | මුළු ක්ෂය | ශුද්ධ පොත් වටිනාකම 31-12-2023 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| රථ වාහන | 2,850,000 | | - | (2,850,000) | 4,000,000 | 4,000,000 | 2,280,000 | | 570,000 | (2,850,000) | - | 4,000,000 |
| කාර්යාල උපකරණ | 1,371,880 | (117,294) | - | - | - | 1,254,586 | 1,284,124 | (117,294) | 11,690 | - | 1,178,521 | 76,065 |
| සුබසාධන උපකරණ | 32,851 | (12,873) | - | - | - | 19,978 | 25,848 | (10,283) | 1,009 | - | 16,574 | 3,404 |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 1,414,380 | (136,385) | 107,302 | - | - | 1,385,296 | 1,177,325 | (136,385) | 74,298 | - | 1,115,238 | 270,058 |
| වායු සමන යන්ත්‍ර | 1,051,273 | - | - | - | - | 1,051,273 | 907,903 | - | 43,011 | - | 950,914 | 100,359 |
| පරිගණක | 27,390,557 | (2,440,222) | 487,400 | - | - | 25,437,735 | 23,731,880 | (2,440,222) | 935,013 | - | 22,226,670 | 3,211,065 |
| ප්‍රචාරණ උපකරණ | 422,837 | - | - | - | - | 422,837 | 422,837 | - | - | - | 422,837 | - |
| පරිගණක මෘදුකාංග | 1,475,000 | - | - | - | - | 1,475,000 | 1,475,000 | - | - | - | 1,475,000 | - |
| | **36,008,777** | **(2,706,773)** | **594,702** | **(2,850,000)** | **4,000,000** | **35,046,705** | **31,304,916** | **(2,704,183)** | **1,635,021** | **(2,850,000)** | **27,385,754** | **7,660,951** |

දේපළ, පිරියත හා උපකරණවලට **2023** දෙසැම්බර් **31** දිනට රු. **28,232,649.22**ක දළ වටිනාකමකින් යුතු පූර්ණව ක්ෂය කරන ලද තවමත් භාවිතා කරනු ලබන වත්කම් ඇතුළත් වේ .

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය**

**2023 දෙසැම්බර් 31 දිනෙන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

| | 31.12.2023 | 31.12.2022 |
|---|---|---|
| | රු. | රු. |
| **සටහන 02 -තොග** | | |
| මුද්‍රණ ද්‍රව්‍ය | 4,604,565 | 2,844,053 |
| - පෙර වසරේ ගැලපීම | 574,666 | 824,802 |
| | **5,179,231** | **3,668,854** |
| **සටහන 03 - ලැබිය යුතු දෑ** | | |
| එකතු කිරීමේ නියෝජිතයන්ගෙන් ලැබිය යුතු | 686,979 | 686,979 |
| තැපැල් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු | 81,000,602 | 47,102,835 |
| ධීවර ජංගම ගිණුම | 86,866,223 | - |
| | **168,553,804** | **47,789,814** |
| **සටහන 04 -කල්පිරීම දක්වා රඳවාගත් ආයෝජන** | | |
| භාණ්ඩාගාර බිල්පත් | 391,325,158 | 415,197,735 |
| ස්ථාවර තැන්පතු | 521,782,651 | |
| | **913,107,809** | **415,197,735** |
| **සටහන 05- ලැබිය යුතු ආදායම** | | |
| ගොවීන්ගේ දායක මුදල | 720,651 | 1,496,090 |
| ජීවිත රක්ෂණ වාරිකය සඳහා ගොවි දායක මුදල | 130,530 | 276,420 |
| පරිපාලන ආදායම සඳහා ගොවි දායක මුදල | 65,265 | 138,210 |
| | **916,446** | **1,910,720** |
| **සටහන 06 - බැංකුවේ ඇති මුදල්** | | |
| ගිණුම් අංකය.100150112345 - ම.බැ. යුනියන් පෙදෙස | 562,268 | 481,006 |
| ගිණුම් අංකය. 100180112344 - ම.බැ. යුනියන් පෙදෙස | 85,807 | 720,210 |
| ගිණුම් අංකය. 100130112351 - ම.බැ. යුනියන් පෙදෙස | 354,120 | 334,317 |
| ගිණුම් අංකය. 100110112347 - ම.බැ. යුනියන් පෙදෙස | 2,917,336 | 209,324 |
| ගිණුම් අංකය. 8403704 - ලංකා බැංකුව යුනියන් පෙදෙස | 266,636 | 44,374 |
| ගිණුම් අංකය. 87144457 - ලංකා බැංකුව යුනියන් පෙදෙස | 32,100 | 32,900 |
| ගිණුම් අංකය. 87649201 - ලංකා බැංකුව නුගේගොඩ | 144,082 | 282,701 |
| ගිණුම් අංකය. 335100370008791-මහජන බැංකුව නුගේගොඩ | 290,610 | 67,467 |
| ගිණුම් අංකය. 100440112349 -ම.බැ. යුනියන් පෙදෙස | 93,280 | 1,228,556 |
| | **4,746,239** | **3,400,855** |
| **සටහන 07- ගොවි විශ්‍රාම වැටුප් අරමුදල** | | |
| ඉදිරියට ගෙනා ශේෂය | (87,078,028,306) | (83,052,378,765) |
| පෙර වසරේ ගැලපීම | 3,046,341,760 | - |
| ගොවීන්ගේ දායක මුදල හා තදනන්තර දායක මුදල් | 113,079,824 | 112,559,841 |
| නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | 20,730,787 | 6,741,310 |
| | **(83,897,875,936)** | **(82,933,077,614)** |
| එකතු කළා/(අඩු) | | |
| වියදම ඉක්මවූ මුළු ආදායම | (4,446,041,403) | (4,144,950,692) |
| | **(88,343,917,339)** | **(87,078,028,306)** |

## 2023 දෙසැම්බර් 31 දිනෙන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| | 31.12.2023 | 31.12.2022 |
|---|---|---|
| | රු. | රු. |
| **සටහන 8 - ප්‍රාග්ධන වියදම සඳහා රජයේ ප්‍රදානය** | | |
| ඉදිරියට ගෙනා ශේෂය | 4,133,861 | 1,409,500 |
| - පෙර වසර ගැලපුම | | |
| එකතු කළා/(අඩු කළා) | | |
| රජයේ ප්‍රදානය ක්‍රමක්ෂය | (1,065,021) | (598,438) |
| වර්ෂය තුළ එකතු කිරීම | 594,702 | 3,322,800 |
| **ඉදිරියට රැගෙන ආ ශේෂය** | **3,663,542** | **4,133,861** |
| **සටහන 9 - ගෙවිය යුතු දෑ** | | |
| නියෝජිතායතන කොමිස් මුදල | 84,410 | 64,498 |
| කාර්ය මණ්ඩල ආරක්ෂක තැන්පතුව | 142,300 | 142,300 |
| විශ්‍රාම වැටුප් ගෙවීම | 1,704,525,804 | 4,254,932,673 |
| විශ්‍රාම වැටුප් කොමිස් මුදල | 1,225,042 | 14,200,747 |
| සමූහ රක්ෂණ වාරිකය | 294,429,817 | 279,420,377 |
| විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ණය | | |
| - කෘ.ගො.ර.ම | 518,782,124 | 484,160,453 |
| | **2,519,189,497** | **5,032,921,048** |
| **සටහන 10 - උපචිත වියදම්** | | |
| මුද්‍රණ ගාස්තු සඳහා ප්‍රතිපාදනය | 800,000 | 700,000 |
| පරිපාලන වියදම් | 146,810 | 241,500 |
| තැපැල් ගාස්තු | 3,184,805 | 1,667,685 |
| විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදනය | 369,900 | 339,900 |
| | **4,501,515** | **2,949,085** |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය**
**2023 දෙසැම්බර් 31 දිනෙන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

| | 31.12.2023 | 31.12.2022 |
|---|---|---|
| | රු. | රු. |
| **සටහන 11 - වෙනත් ආදායම්** | | |
| රජයේ ප්‍රදානය සඳහා ක්‍රමක්ෂය | 1,065,021 | 598,438 |
| වෙනත් ආදායම් | 39,893 | 14,885 |
| වත්කම් බැහැර කිරීම් | 50,560 | - |
| | **1,155,474** | **613,323** |
| **සටහන 10 - පරිපාලන වියදම්** | | |
| වැටුප් සහ වේතන | 103,777,380 | 97,616,721 |
| සේ.අ.අ. | 12,527,325 | 9,392,852 |
| සේ.භා.අ. | 2,541,336 | 2,154,556 |
| ගමන් දීමනා හා යැපීම් දීමනා | 11,268,488 | 7,134,383 |
| අතිකාල | 3,432,367 | 1,745,238 |
| දෛනික වැටුප් | 562,604 | 129,118 |
| වෛද්‍ය වියදම් | 1,759,900 | 1,834,400 |
| පාරිතෝෂික | 4,368,782 | 8,260,446 |
| T.A.C. දීමනා | - | 136,000 |
| කාර්ය මණ්ඩල සුබසාධනය | 1,435,321 | 924,413 |
| නෛතික ගාස්තු | - | 1,348,624 |
| කාර්ය මණ්ඩල නිල ඇඳුම් | - | 245,012 |
| අධ්‍යක්ෂ මණ්ඩල දීමනා | 276,200 | 238,400 |
| උපදේශන ගාස්තු | 68,000 | - |
| කම්කරු ගාස්තු | 62,570 | 137,025 |
| කුලී | 9,902,831 | 7,499,555 |
| දුරකථන | 2,966,819 | 2,664,208 |
| තැපැල් ගාස්තු | 7,523,165 | 4,796,906 |
| ආරක්ෂාව | 738,121 | 487,252 |
| විදුලිය | 2,507,491 | 1,083,984 |
| ජල බිල්පත් | 388,730 | 247,019 |
| විගණන ගාස්තු | 363,000 | 305,700 |
| භාෂා පරිවර්තන ගාස්තු | - | 14,220 |
| ඉන්ධන | 6,914,645 | 6,751,547 |
| දැනුවත් කිරීම සහ පුහුණුව | 4,315,001 | 7,318,274 |
| මුද්‍රණ | 1,206,478 | 33,718 |
| ලිපි ද්‍රව්‍ය හා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය | 7,337,029 | 7,204,824 |
| සංග්‍රහ | 541,126 | 435,132 |
| නඩත්තුව - රථ වාහන | 10,569,477 | 7,365,180 |
| නඩත්තුව - ගොඩනැගිලි | 4,023,958 | 297,659 |
| නඩත්තුව - කාර්යාල උපකරණ | 384,290 | 224,849 |
| පරිගණක හා මෘදුකාංග නඩත්තුව | 1,243,662 | 572,456 |
| ක්ෂයවීම | 1,635,021 | 1,168,438 |
| | **204,641,116** | **179,768,108** |
| **සටහන 12 - මූල්‍ය හා වෙනත්** | | |
| ණය පොලිය | 62,601,947 | 95,406,605 |
| බැංකු ගාස්තු | 61,168 | 78,336 |
| | **62,663,115** | **95,484,941** |

# 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන

## ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය**

**2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | 31.12.2023 | 31.12.2022 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 1 | 54,698 | 72,340 |
| | | **54,698** | **72,340** |
| **මූල්‍ය සාධනපත්‍ර** | | | |
| භාණ්ඩාගාර බිල්පත් | | 398,879,705 | |
| | | **398,879,705** | **-** |
| ***ජංගම වත්කම්*** | | | |
| තොග | 2 | 87,430 | 92,219 |
| ලැබිය යුතු දෑ | 3 | 5,000 | 5,000 |
| කල්පිරීම දක්වා රඳවාගත් ආයෝජන | 4 | 394,428,987 | 662,541,900 |
| බැංකුවේ ඇති මුදල් | 5 | 1,409,330 | 700,601 |
| | | **395,930,747** | **663,339,720** |
| **මුළු වත්කම්** | | **794,865,150** | **663,412,060** |
| **ස්කන්ධ හා බැරකම්** | | | |
| ***ප්‍රාග්ධන හා සංචිත*** | | | |
| ධීවර විශ්‍රාම වැටුප් සමුච්චිත අරමුදල | 6 | (4,934,955,153) | (4,509,752,321) |
| මරණ පාරිතෝෂික අරමුදල | 7 | 34,199,215 | 32,535,495 |
| | | **(4,900,755,938)** | **(4,477,216,826)** |
| ***ජංගම නොවන වත්කම්*** | | | |
| විශ්‍රාම වැටුප් බැරකම | | 5,532,349,026 | 5,068,050,746 |
| කාර්ය මණ්ඩල පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදනය | | 1,831,841 | 2,715,544 |
| | | **5,534,180,867** | **5,070,766,290** |
| ***ජංගම බැරකම්*** | | | |
| මුළු ගෙවිය යුතු දෑ | 8 | 160,590,522 | 69,055,797 |
| උපචිත වියදම් | 9 | 849,699 | 806,799 |
| | | **161,440,221** | **69,862,596** |
| **මුළු ස්කන්ධ හා බැරකම්** | | **794,865,150** | **663,412,060** |
| | | - | - |

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල අවශ්‍යතා හා අනුකූල වේ .

.............................................. .............................

මූල්‍ය ප්‍රධානී අධ්‍යක්ෂ ජනරාල්

මෙම මූල්‍ය වාර්තා පිළියෙල කිරීම සහ ඉදිරිපත්කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ .

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබන ලද්දේ ;

........................... .............................

අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික
කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය

අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික
කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය**
**විස්තීරණ ආදායම් ප්‍රකාශය**

**2023 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා**

| | සටහන | 31.12.2023 | 31.12.2022 |
|---|---|---|---|
| | | රු. | රු. |
| පොළී ආදායම | | 134,109,764 | 105,879,565 |
| ධීවර දායක මුදල | | 121,468 | 116,394 |
| | | 134,231,232 | 105,995,959 |
| අඩුකළා: | | | |
| පරිපාලන වියදම් සඳහා පවරන ලද පොළී ආදායම | | (3,500,000) | (3,500,000) |
| අරමුදල සඳහා මුළු අයභාරය | | **130,731,232** | **102,495,959** |
| **අඩුකළා: වියදම** | | | |
| ශුද්ධ දායක මුදල ආපසු ගෙවීම | | (195,015) | (246,074) |
| ශුද්ධ පොළිය ආපසු ගෙවීම | | (284,602) | (278,234) |
| දිරි දීමනා ගෙවීම | | (7,964) | (11,209) |
| සමූහ රක්ෂණ වාරිකය | | (1,746,720) | (1,749,300) |
| විශ්‍රාම වැටුප් ගෙවීම සහ කොමිස් මුදල | | | |
| - විශ්‍රාම වැටුප් ගෙවීම | | (83,913,258) | (78,353,108) |
| - විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා කොමිස් මුදල | | (1,034,520) | (985,515) |
| විශ්‍රාම වැටුප් බැරකමේ වැඩිවීම | | (464,298,280) | (423,886,155) |
| මුළු වියදම | | **(551,480,359)** | **(505,509,595)** |
| **මෙහෙයුම් අතිරික්තය/හිඟය** | | **(420,749,127)** | **(403,013,636)** |
| **ආදායම - පරිපාලනය සඳහා** | | | |
| පරිපාලන වියදම් සඳහා පොළී ආදායම | | 3,500,000 | 3,500,000 |
| පරිපාලන වියදම් සඳහා රජයේ ප්‍රදානය | | 1,500,000 | 1,500,000 |
| | | 5,000,000 | 5,000,000 |
| විවිධ ආදායම් | | 525 | 275 |
| | | **(415,748,602)** | **(398,013,361)** |
| **අඩුකළා: වියදම්** | | | |
| පරිපාලන හා ආයතනික වියදම් | 10 | 9,430,008 | 8,581,590 |
| මූල්‍ය ගාස්තු | 11 | 6,236 | 400 |
| මුළු පරිපාලන වියදම් | | **9,436,244** | **8,581,990** |
| වර්ෂය සඳහා ලාභය/(අලාභය) | | **(425,184,846)** | **(406,595,351)** |
| **අනෙකුත් විස්තීරණ ආදායම** | | | |
| පාරිතෝෂික ලාභ/(අලාභ) | | 80,014 | 534,705 |
| වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම | | **(425,104,832)** | **(406,060,646)** |

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය

ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය

2023 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා

| | ධීවර විශ්‍රාම වැටුප් අරමුදල | මරණ පාරිතෝෂික අරමුදල | එකතුව |
|---|---|---|---|
| **2022 ජනවාරි 01 දිනට ශේෂය** | **(4,103,691,674)** | **30,965,195** | **(4,072,726,480)** |
| පෙර වසරේ ගැලපුම | (98,000) | | (98,000) |
| වසර තුළ එකතු කිරීම | - | 1,749,300 | 1,749,300 |
| ගෙවන ලද ප්‍රතිලාභ | - | (179,000) | (179,000) |
| ශුද්ධ අතිරික්තය/(හිඟය) | (406,060,646) | - | (406,060,646) |
| **2022 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **(4,509,850,321)** | **32,535,495** | **(4,477,314,826)** |
| වසර තුළ එකතු කිරීම | - | 1,746,720 | 1,746,720 |
| ගෙවන ලද ප්‍රතිලාභ | - | (83,000) | (83,000) |
| ශුද්ධ අතිරික්තය/(හිඟය) | (425,104,832) | - | (425,104,832) |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **(4,934,955,153)** | **34,199,215** | **(4,900,755,938)** |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**
**2023 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා**

| | 31.12.2023 | 31.12.2022 |
|---|---|---|
| | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | | |
| ශුද්ධ අතිරික්තය/(හිඟය) | (425,184,846) | (406,595,351) |
| **ගැලපුම්** | | |
| ක්ෂයවීම | 17,642 | 17,642 |
| පෙර වසරට අදාළ ගැලපුම් | (98,000) | 17,000 |
| විශ්‍රාම වගකීම වැඩිවීම | 464,298,280 | 423,886,155 |
| සමූහ රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා දායකත්වය | (1,746,720) | (1,749,300) |
| විශ්‍රාමික පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන | 273,031 | 476,365 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය** | **37,559,387** | **16,052,511** |
| වට්ටෝරු භාණ්ඩවල (වැඩිවීම)/අඩුවීම | 4,789 | 1,483 |
| ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | - | 248,174,566 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | 91,534,725 | 8,101,001 |
| උපචිත වියදම් (වැඩිවීම)/අඩුවීම | 42,900 | (281,707) |
| | **91,582,415** | **255,995,343** |
| **මෙහෙයුම්වලින් උත්පාදිත මුදල්** | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උත්පාදිත මුදල් | 129,141,801 | 272,047,854 |
| විශ්‍රාම පාරිතෝෂිකය- ගෙවන ලද | (1,076,720) | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | **128,065,081** | **272,047,854** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ** | | |
| මූල්‍ය සාධනපත්‍ර | (130,766,793) | (275,544,688) |
| ගොවි මරණ පාරිතෝෂික අරමුදල | 3,410,440 | 3,319,600 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(127,356,353)** | **(272,225,088)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ** | | |
| | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | **-** | **-** |
| **මුදල් හා මුදලට සමාන දෑ ශුද්ධ වැඩි/(අඩුවීම)** | **708,729** | **(177,234)** |
| වසර ආරම්භයේදී මුදල් සහ මුදලට සමාන දෑ | 700,601 | 877,835 |
| | **1,409,330** | **700,601** |
| **වසර අවසානයේදී මුදල් සහ මුදලට සමාන දෑ** | | |
| **බැංකුවේ ඇති මුදල් - 31.12.2023** | **1,409,330** | **700,601** |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**2023 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා**

**1. පොදු ප්‍රතිපත්ති**

**1.1 වාර්තාකරණ අස්තිත්වය**

ශ්‍රී ලංකා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ලය (මෙහි මින්මතු 'මණ්ඩලය' ලෙස සඳහන් කරනු ලබන) 1990 අංක 20 දරන පනතෙන් සංස්ථාගත කරන ලද අතර නුගේගොඩ, ගංගොඩවිල, සුභද්‍රාරාම පාරේ අංක 20 දරන ස්ථානයේ පිහිටා ඇත. ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ස්ථාපිත කරනු ලැබූයේ 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පනතේ විධිවිධාන ප්‍රකාරවය.

**1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම්වල ස්වභාවය**

ධීවරයන් සඳහා විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.

**1.3 පිළියෙල කිරීමේ පදනම**

**(අ) අනුකූලතා ප්‍රකාශනය**

මෙම මූල්‍ය ප්‍රකාශන මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීරණ ආදායම් ප්‍රකාශය, අරමුදල් සහ සංචිතවල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්වලින් සමන්විත වේ. මෙම ගිණුම් ප්‍රකාශන ශ්‍රීලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර/ ශ්‍රී.ල.ගි.ප්‍ර.) ප්‍රකාරව පිළියෙල කර ඇත.

**(ආ) මැනීම් පදනම**

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් යෝග්‍ය අනාවරණ කරනු ලබන විටදී හැරුණු විට මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනමින් පිළියෙල කර ඇත.

**(ඇ) සංසන්දනාත්මක තොරතුරු**

ප්‍රවර්ථන කාල සීමාවේ මූල්‍ය ප්‍රකාශන අවබෝධ කරගැනීම ඉහළ නැංවීම පිණිස සහ අන්තර් කාලසීමා සංසන්දනීයභාවය වැඩි දියුණු කිරීම පිණිස මූල්‍ය ප්‍රකාශනයන්හි වාර්තාකොට ඇති සියලු මුදල් ප්‍රමාණ සඳහා පෙර කාලසීමාවට අදාළ ප්‍රමාණාත්මක, වෘත්තාන්තමය සහ විස්තරාත්මක ඇතුළු සංසන්දනාත්මක තොරතුරු හෙළිදරව් කර ඇත.

මූල්‍ය ප්‍රකාශනයන්හි අයිතමයන් ඉදිරිපත්කිරිම හෝ වර්ගීකරණය සංශෝධනය කරනු ලැබ ඇති විටදී වඩා හොද ඉදිරිපත් කිරිමක් සැපයීම පිණිස ප්‍රවර්ථන වසර සමග අනුකූලවන සේ සංසන්දනාත්මක මුදල් ප්‍රමාණ ප්‍රතිවර්ගීකරණය කර ඇත.

**(ඈ) ක්‍රෘත්‍යාත්මක සහ ඉදිරිපත්කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය**

මෙම මුදල් ප්‍රකාශ මණ්ඩලයේ ක්‍රෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇත

**(ඉ) තක්සේරු හා තිරණ භාවිතය**

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර /.ශ්‍රී.ල.ගි.ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය වාර්තා සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තාකරනු ලැබූ වත්කම්, බරකම්, ආදායම් සහ වියදම් ප්‍රමාණ භාවිතය කෙරෙහි බලපාන්නා වූ තින්දු, තක්සේරු සහ සහ උපකල්පන සිදුකිරීමට කළමනාකාරිත්වයට නියම කරයි. යොදා ගනු ලැබූ මෙම ඇස්තමේන්තු සහ තීන්දු සැබෑ ප්‍රතිඵලවලට වඩා වෙනස් විය හැක.

ඇස්තමේන්තු සහ පාදක උපකල්පන අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කරනු ලැබේ.ගිණුම්කරන ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කිරීම අදාළ කාලසීමාවට පමණක් බලපාන්නේ නම්,එ්වා පිළිගනු ලබන්නේ එම ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කර ඇති කාලසීමාව තුළ වන අතර ප්‍රවර්තන හා යම් අනාගත කාල සීමාවන්ට එම ප්‍රතිශෝධනය බලපාන්නේ නම් ප්‍රතිශෝධන කාලසීමාව හා අනාගත කාලසීමාවන් සඳහා ද පිළිගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවල පිළිගෙන ඇති ප්‍රමාණ මත වඩාත්ම සැළකිය යුතු බලපෑම් ඇතිකරන ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කිරීමේදී තක්සේරු, අවිනිශ්චිතතා සහ තීරණාත්මක තින්දු පිළිබඳ සැලකිය යුතු ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන්වල අඩංගු කර ඇත.

**ඊ) ප්‍රවර්තන ව්‍යාපාරය (අඛණ්ඩ පැවැත්ම)**

ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පැවැතීමට මණ්ඩලයට ඇති හැකියාව පිළිබඳව කළමනාකාරිත්වය තක්සේරුවක් කර තිබේ. එබැවින් ප්‍රවර්තන ව්‍යාපාරයක පදනමින් මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව පිළියෙල කරනු ලැබේ.

## 2. වත්කම් හා ඒවායේ තක්සේරු පදනම

### 2.1 දේපළ, පිරියත හා උපකරණ

**(අ) හඳුනාගැනීම සහ මැනීම**

දේපල, පිරියත හා උපකරණ අයිතම ප්‍රකාශ කර ඇත්තේ එකතු වූ ක්ෂය කිරීම් හා හානි අලාභ අඩුකොට පිරිවැයට හෝ තක්සේරුවටය.

සියලු දේපළ, පිරියත සහ උපකරණ මුලින්ම වාර්තා කර ඇත්තේ සමුච්චිත ක්ෂයවීම් හෝ වටිනාකමේ සමුච්චිත හානිවීම් අඩුකර පිරිවැයටය. වත්කමක වැදගත් සංරචක වෙනම හඳුනාගනු ලැබ ක්ෂය කරනු ලැබේ. දේපළක, පිරියතක හෝ උපකරණයක සැලකිය යුතු කොටස් යම් කාල අන්තර තුළ ප්‍රතිස්ථාපනය කරනු ලැබීමට අවශ්‍ය වූ විට, ප්‍රතිස්ථාපිත කොටස පිළිගැනීමෙන් ඉවත් කර නව කොටස එය ආශ්‍රිත ප්‍රයෝජ්‍ය ආයු කාලය සහ ක්ෂයවීම සහිතව අස්තිත්තවය මගින් හඳුනාගනු ලැබේ. අනෙකුත් සියලු අළුත්වැඩියා සහ නඩත්තු පිරිවැය දරන ලද වියදම් ලෙස ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

රු. 696,175.42 ක මුළු ඓතිහාසික පිරිවැයක් සහිත සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම් දේපළ, පිරියත හා උපකරණවල ඇතුලත් කර තිබේ.

**(ආ) පිරිවැය**

දේපල, පිරියත හා උපකරණවල පිරිවැය ඒවායේ මිලදී ගැනීමේ මිලෙන් සහ අදාළ වත්කම එහි අපේක්ෂිත භාවිතය සඳහා වැඩකරන තත්ත්වයට ගෙනඒම සඳහාවූ කිසියම් ඍජුවම ආරෝපණීය වූ පිරිවැයෙන් සමන්විත වේ.

වත්කම්වල ඉපැයුම් ධාරිතාවය දිගටම පවත්වා ගනු හෝ ඉහළ නැංවීම පිණිස ස්ථිර ස්වභාවයේ වත්කම් අත්කර ගැනීම, ව්‍යාප්ත කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා දරන ලද තදනන්තර වියදම ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

ප්‍රධාන පරීක්ෂාකිරීම් ඇතුළුව වෙනම ගිණුම් තබා ඇති දේපල, පිරියත හෝ උපකරණ අයිතමයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරන ලද වියදම ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. අනෙකුත් තදනන්තර පිරිවැය ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ එම කොටස තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලාඒමට හැකියාවක් ඇත්නම් සහ අයිතමයේ පිරිවැය විශ්වසනීය ලෙස මැණිය හැකිනම් පමණි.

**(ඇ) ක්ෂයවීම්**

සරල මාර්ග ක්‍රමය මත පහත දැක්වෙන වාර්ෂික අනුපාතයන්ට එම වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයුකාලය තුළ එම ප්‍රමාණ පොත්වලින් ඉවත්කිරීම පිණිස, ක්ෂයවීම් විස්තිරණ ආදායම් ප්‍රකාශයේ වැයබරක් සේ දක්වනු ලබයි.

| | |
|---|---|
| කාර්යාල උපකරණ | 10% |
| ලී බඩු සහ සවිකිරීම් | 10% |
| සුඛසාධන උපකරණ | 10% |
| පරිගණක | 20% |

**2.2 අස්පෘශ්‍ය වත්කම්**

වත්කමට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමේ තත්වයක් තිබෙනම් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ශ්‍රී.ල.ගි.ප්‍ර. -38 අස්පෘශ්‍ය වත්කම් ප්‍රකාරව වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස ගණනය කළ හැකි නම් අස්පෘශ්‍ය වත්කමක් පිළිගනු ලැබේ. ඒ අනුව මෙම වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය සහ කිසියම් සමුච්චිත හානි ආලහය අඩුකර මූල්‍ය ප්‍රකාශනවල දක්වනු ලැබේ.

පරිගණක මෘදුකාංග සරලරේඛීය ක්‍රමය මත වසර 5 ක කාලා සීමාවක් පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ.

**2.3 වට්ටෝරු භාණ්ඩ**

වට්ටෝරු භාණ්ඩ ප්‍රකාශ කර ඇත්තේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි කළ අගයෙන් වඩා අඩු අගයටය. ශුද්ධ උපලබ්ධිකළ අගය යනු සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී ඇස්තමේන්තුගත සම්පූර්ණ කිරීමේ සහ විකුණුම් වියදම් අඩුකිරීමෙන් පසු ඇස්තමේන්තුගත විකුණුම් මිලය. මෙම පිරිවැයට තොග හා භාණ්ඩ අත්කරගැනීමේ සහ ඒවා දැනට තිබෙන ස්ථානයට ගෙන ඒමට දරන ලද වියදම ද ඇතුලත්ය.

**2.4 මූල්‍ය වත්කම්**

ශ්‍රී.ල.ගි.ප්‍ර. 39 හි විෂය පථය තුළ මූල්‍ය වත්කම් යෝග්‍ය පරිදි ලාභය හෝ පාඩුව, ණය සහ ලැබිය යුතු දෑ, කල් පිරීම තෙක් රඳවා ගත් ආයෝජන, විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් හෝ ඉදිරි රැකුම් සාධන පත්‍ර ලෙස නම් කරනු ලැබූ ව්‍යුත්පන්න හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

සිය මූල්‍ය වත්කම්හි මූලික පිළිගැන්ම මත අධ්‍යක්ෂ මණ්ඩලය ඒවායේ වර්ගීකරණය තීරණය කරයි.

සියලුම මූල්‍ය වත්කම් මුලින් සාධාරණ වටිනාකමට සහ ලාභ හෝ පාඩු මඟින් සාධාරණ වටිනාකමට නොවන වත්කම් සම්බන්ධයෙන් ඍජුව ආරෝපණීය ගණුදෙණු පිරිවැයටත් හඳුනා ගැනේ.

ණය සහ ලැබිය යුතු දෑ සහ තැන්පත් ආරම්භයේදී ඒවා ආරම්භ කරනු ලබන දිනයේදී පිළිගනු ලැබේ. අනෙකුත් සියලු මූල්‍ය වත්කම් (ලාභ සහ පාඩු හරහා සාධාරණ වටිනාකමට නිමිත කළ වත්කම් ඇතුළුව)

ආරම්භයේදී පිළිගනු ලබන්නේ සාධන පත්‍රයේ ගිවිසුම් ප්‍රතිපාදනයන්ට මණ්ඩලය පාර්ශවකරුවකු වූ වෙළඳ දිනයටය.

යම් වත්කමකින් මුදල් ප්‍රවාහයන් කෙරෙහි ඇති ගිවිසුම්කර හිමිකම් අවසානවීමේදී හෝ මූල්‍ය වත්කමක හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ පරිදාන සැළකියයුතු ලෙස පවරනු ලබන විටකදී ගනුදෙනුවක මූල්‍ය වත්කම් මත ගිවිසුම්කර මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය එය පවරන විටදී මණ්ඩය මූල්‍ය වත්කම පිළිගැනීම ඉවත්කරනු ලැබේ. පවරනු ලැබූ මූල්‍ය වත්කමක මණ්ඩලය විසින් නිර්මාණය කරනු ලැබූ හෝ රඳවාගනු ලැබූ යම් බැඳියාවක් වෙනම වත්කමක් හෝ බැරකමක් ලෙස හඳුනාගනු ලැබේ.

මූල්‍ය වත්කම් සහ බැරකම් හිලව් කරනු ලබන අතර මුදල් ප්‍රමාණ හිලව් කිරීමට මණ්ඩලයට නෛතික අයිතිවාසිකමක් ඇතිවිටකදී සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම උපලබ්ධිකර බැරකම සමගාමීව පියවීමට අදහස් කරන්නේ නම් පමණක් ශුද්ධ මුදල් ප්‍රමාණය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඉදිරිපත් කරනු ලැබේ.

මණ්ඩලයේ මූල්‍ය වත්කම්වලට මුදල් සහ කෙටිකාලීන ආයෝජන සහ වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ ඇතුලත් වේ .

**(අ) ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්**

ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්වලට වෙළඳාම සඳහා රඳවා ගෙන සිටිනු ලබන මූල්‍ය වත්කම් සහ ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මුල් පිළිගැනීම මත නම් කළ මූල්‍ය වත්කම් ඇතුළත් වේ. මූල්‍ය වත්කම් ආසන්න කාලීනව විකිණීමේ හෝ ප්‍රතිමිලදී ගැනීමේ කාර්යය සඳහා අත්කර ගෙන ඇත්නම්, ඒවා වෙළඳාම සඳහා රඳවාගෙන ඇති සේ වර්ගීකරණය කරනු ලැබේ.

ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්, විස්තිරණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමට හෝ මූල්‍ය වියදමට පිළිගනු ලැබූ සාධාරණ වටිනාකමේ වෙනස්කම් සහිතව සාධාරණ වටිනාකමට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වනු ලැබේ.

**(ආ) ණය සහ ලැබිය යුතු දෑ**

ණය සහ ලැබිය යුතු දෑ සක්‍රීය වෙළඳපොලක මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික ගණනය කිරීමෙන් පසුව එබඳු මූල්‍ය හානි අඩුකොට සඵල පොළී ක්‍රමවේදය භාවිතාකරමින් තදනන්තරව ක්‍රමක්ෂිත පිරිවැය අනුව ගණනය කරනු ලැබේ. ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්කරගැනීමේදී කිසියම් වට්ටමක් හෝ ආධික්‍යයක් සහ සඵල පොළී අනුපාතයේ අනුකලක කොටසක්වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමිනි.සඵල පොළී අනුපාත ක්‍රමක්ෂය විස්තීර්ණ අදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායමේ අන්තර්ගත කරනු ලැබේ . හානිවීම් හේතු කොට ගෙන ඇතිවන අලාභ මූල්‍ය පිරිවැයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

ණය සහ ලැබිය යුතු දෑ සමන්විත වනුයේ වෙළඳ ලැබිය යුතු දෑ, සේවක ණය, තැන්පතු, අත්තිකාරම්, අනෙකුත් ලැබිය යුතු දෑ සහ මුදල් සහ මුදලට සමාන දෑ ආදියෙනි.

**(ඈ) කල්පිරීම දක්වා රඳවාගනු ලැබූ ආයෝජන**

සථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් සහ ස්ථාවර කල්පිරීම් මණ්ඩලටයට කල්පිරීම දක්වා රඳවා ගැනීමේ ධනාත්මක අභිප්‍රායක් සහ හැකියාවක් ඇතිවිටදී ඒවා කල්පිරීම දක්වා රඳවා ගැනීම සේ වර්ගීකරණය කරනු ලැබේ. මූලික ගණනය කිරීමෙන් පසුව කල්පිරීම දක්වා රඳවාගනු ලැබූ ආයෝජන හානි අඩුකොට සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් තදනන්තරව ක්‍රමක්ෂිත පිරිවැය අනුව ගණනය කරනු ලැබේ. සඵල පොළී ක්‍රමවේද ක්‍රමක්ෂය විස්තීර්ණ අදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ අන්තර්ගත කරනු ලැබේ. හානි හේතු කොට ගෙන ඇතිවන අලාභ මූල්‍ය පිරිවැයේ විස්තීර්ණ අදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ

රජයේ සුරැකුම්පත් සහ ස්ථාවර තැන්පතුවල අයෝජන, කල්පිරීම දක්වා රඳවාගනු ලැබූ ආයෝජන යටතේ වර්ගීකරණය කර තිබේ.

**(ඇ) විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන**

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් යනු විකිණීම සඳහා ඇති ලෙස නම් කර ඇති හෝ ඉහත සඳහන් කවර හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයකට වර්ගීකරණය කර නොමැති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ .මූලික පිළිගැනීමට පසුව ,ඒවා සාධාරණ වටිනාකමට ගණනය කරනු ලබන අතර හානි අලාභ හැර එහි වෙනස්කම් අනෙකුත් විස්තීර්ණ ආදායමේ පිළිගනු ලබන අතර අරමුදල් සහ සංචිතවල වෙන්කර ඇති සාධාරණ වටිනාකමේ ඉදිරිපත් කරනු ලැබේ .විකිණීම සඳහා ඇති ණය සුරැකුම් මත පොළි ආදායම සඵල පොළී අනුපාතය භාවිතා කරමින් ගණනය කරනු ලබන අතර ලාභයෙහි හෝ අලාභයෙහි පිළිගනු ලැබේ .ආයෝජනයක් පිළිගැනීම ඉවත් කළ විට ,අරමුදල් සහ සංචිතවල එකතුවූ ලාභය හෝ පාඩුව ලාභ හෝ අලාභවල ප්‍රතිවර්ගීකරණය කරනු ලැබේ.

මූලික පිළිගැනුම මත විකිණීම සඳහා ඇති මූල්‍ය අයෝජනයක් ලෙස මණ්ඩලය කවර හෝ මූල්‍ය වත්කමක් නම් කර නොමැත.

## 2.5 මූල්‍ය වත්කම් හානිකරණය

සෑම වාර්තාකරණ දිනයකදීම මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවීමේ වාස්තවික සාක්ෂි ඇත්දැයි මණ්ඩලය තක්සේරු කරන අතර එවැනි හානිවීමක් සිදුව ඇත්නම්, වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ වත්මන් වටිනාකම අතර වෙනස ලබා ගැනීම මගින් හානියේ ප්‍රමාණය ගණනය කරනු ලැබේ .

## 3. බැරකම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය මත ජංගම බැරකම් ලෙස වර්ගීකරණය කර ඇති බැරකම් වනුයේ ඉල්ලුම මත හෝ වාර්තාකරණ දිනයේ සිට වසරක් තුළ  ගෙවීමට නියමිතව ඇති දේය. ජංගම නොවන බැරකම් වනුයේ වාර්තාකරණ දිනයේ සිට වසරකට පසුව ගෙවීමට නියමිත ශේෂ වේ .

මෙම මූල්‍ය වාර්තා සකස් කිරීමේදී,  දන්නා සියලු බැරකම් සඳහා හේතු දක්වා ඇත .අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලයට නෛතික හෝ සම්මුතික බැඳීමක් ඇති විටදී සහ බැඳීම නිරාකරණය සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමත් අවශ්‍ය කරනු ලැබීමට ඉඩ ඇති විටදී ප්‍රතිපාදන සහ බැරකම් පිළිගනු ලැබේ .

### 3.1 විශ්‍රාම ප්‍රතිලාභ

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 'විශ්‍රාමික ප්‍රතිලාභ පිරිවැය' අනුකූල වන පරිදි සියලු ස්ථිර සේවකයන් සඳහා සේවයේ පළමු වසර සම්පූරණ කිරීමේ සිට විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත . කෙසේවෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත සමග සේවකයකු සඳහා වන වගකීම ඇති වනුයේ  පස් වසරක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමේදී පමණි. බැරකම් සඳහා බාහිරින් අරමුදල් සපයනු නොලැබේ.

### 3.2 ප්‍රාග්ධන වෙන්කිරීම් සහ අසම්භාව්‍ය බැරකම්

අසම්භාව්‍ය බැරකම් වනුයේ ආර්ථික ප්‍රතිලාභ පැවරුම සිදු වීමට ඉඩක් නොමැති හෝ විශ්වාසනීය ලෙස මැණීමට නොහැකි අවස්ථාවන්හිදී අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වත්මන් බැඳීම් මගින් පමණක් පැවැත්ම තහවුරු කරන භව්‍ය බැඳීම් වේ .

මණ්ඩලයේ ප්‍රාග්ධන වෙන්කිරීම් සහ අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනයන්හි අදාළ සටහන්වල හෙළිදරව් කර ඇත.

### 3.3 ධීවර විශ්‍රාම අරමුදල

ධීවර විශ්‍රාම අරමුදලේ බැරකම් 2007 දී සිදුකරන ලද ආයුගණක ගණනය කිරීම මත වත්මන් වටිනාකම පාදකව මූල්‍ය ප්‍රකාශනයන්හි ගිණුම් ගත කර ඇත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 4 හි 15 වැනි ඡේදයේ ප්‍රකාශ කර ඇති පරිදි, රක්ෂණ ගිවිසුම්වල දී, රක්ෂණ සමාගම එක් එක් වාර්තාකරණ කාල සීමාව අවසානයේදී, සිය රක්ෂණ ගිවිසුම් යටතේ අනාගත මුදල් ප්‍රවාහවල වත්මන් ඇස්තමේන්තු භාවිතා කරමින් සිය හඳුනාගත් රක්ෂණ බැරකම් ප්‍රමාණවත් ද යන්න තක්සේරු කළ යුතුය. අනාගත මුදල් ප්‍රවාහ සැලකිල්ලට ගත් විට සිය රක්ෂණ බැරකම්වල ධාරණ අගය (ආශ්‍රිත විලම්බිත අත්කර ගැනීමේ පිරිවැය සහ ආශ්‍රිත අස්පෘශ්‍ය වත්කම් අඩු කොට) ප්‍රමාණවත් නොවන බව එම තක්සේරුවෙන් පෙන්නුම් කරන්නේ නම්, සමස්ත ඌනතාවය ලාභ හෝ අලාභවල හඳුනා ගත යුතුය.

වෙළඳපොළ පොළී අනුපාතවල වෙනස්කම් සැලකිල්ලට ගනිමින් ධීවර විශ්‍රාම වැටුප් බැරකම වැඩි කරනු ලැබ ඇති අතර ලාභ හා අලාභ ප්‍රකාශයේ වෙනත් විස්තීරණ ආදායමේ සහ සහ මූල්‍ය ප්‍රකාශනවල වෙනත් විස්තීරණ ආදායමේ ඌනතාවක් හඳුනා ගෙන තිබේ. එබැවින්, වෙනත් විස්තීරණ ආදායම යටතේ ධීවර විශ්‍රාම වැටුප් බැරකමේ එකී වැඩිවීම ඉහත ප්‍රමිතියේ අවශ්‍යතා සමග අනුකූල වේ.

## 4. විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

### 4.1 ආදායම

අ) මණ්ඩලයේ ආදායම විශ්‍රාම වැටුප් වාරික, භාණ්ඩාගාර බිල්පත්වල පොළී ආදායම සහ අනෙකුත් විවිධ ආදායම් නියෝජනය කරයි.

ආ) වාරික එකතු කිරීමෙන් ලත් සියලු ආදායම් මුදල් පදනමකින් පිළිගනු ලැබේ.

### 4.2 ආදායම පිළිගැනීම

අ) විශ්‍රාම වැටුප් වාරික ආදායම බඳවා ගන්නා අවස්ථාවේදී පිළිගනු ලැබේ .

ආ) ඉහත ආදායම උපචිත පදනමකින් වන අතර අදාළ වියදම් සමග ගලපනු ලැබේ.

ඇ) පොළී ආදායම කාල පදනමකින් උපචිත වේ .

### 4.3 රජයේ ප්‍රදාන සඳහා ගිණුම්කරණය

දරන ලද වියදම් වෙනුවෙන් මණ්ඩලයට ගෙවනු ලබන ප්‍රදාන එම වියදම් පිළිගනු ලැබූ කාල සීමාව තුළ ආදායම් ලෙස විස්තීර්ණ ආදායමේ පිළිගනු ලැබේ. වත්කමක පිරිවැය සඳහා මණ්ඩලයට ගෙවනු ලබන ප්‍රදාන ආශ්‍රිත වත්කමේ ප්‍රයෝජ්‍ය ආයු කාලය පුරා ක්‍රමික පදනමකින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

### 4.4 වියදම

ධීවර විශ්‍රාම වැටුප් සහ රක්ෂණ යෝජනා ක්‍රමයේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂම තත්ත්වයකින් පවත්වා ගෙන යාමේදී දරන ලද සියලු වියදම්හි අතිරික්තය හෝ හිඟය තීරණය කිරීමේදී උපචිත පදනමකින් ආදායමට වැය බරක් සේ දක්වා ඇත.

අංක 401/4 – 2008.10.15 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් පහත දැක්වෙන අනුපාත මත වෙන්කරනු ලැබූ මණ්ඩලයේ වක්‍ර වියදම් පහත දැක්වෙන පරිදි වේ.

| වියදම | අනුපාත |
| --- | --- |
| කුලී, දුරකථන | 5% |
| තැපැල් ගාස්තු, ජල ගාස්තු | 5% |
| විදුලිය | 5% |
| ප්‍රධාන කාර්යාල උපකරණ | 5% |
| ගොඩනැගිලි නඩත්තුව | 5% |
| වාහන නඩත්තුව | 3% |
| ඉන්ධන | 2% |
| ලිපි ද්‍රව්‍ය | 2% |
| නිල ඇඳුම් | 2% |
| ආරක්ෂක | 5% |
| පරිගණක වියදම් | 5% |

**5. මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කර ඇත්තේ "වක්‍ර ක්‍රමය "යොදා ගනිමිනි.

**6. වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම්**

වාර්තාකරණ දිනයෙන් පසු සිදුවන සිදුවීම්වල ප්‍රමාණවත් බව සලකා බලා ඇති අතර අවශ්‍ය තැන්හිදී ගිණුම්වල යෝග්‍ය ගැලපීම් සිදුකර ඇත.

**7. සම්බන්ධිත පාර්ශව ගනුදෙනු**

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හා කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය, ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ සම්බන්ධිත පාර්ශව ලෙස සලකනු ලැබේ. මෙම සම්බන්ධිත පාර්ශව සමග සිදුකළ ගනුදෙනු සාධාරණ වටිනාකම මත පදනම්ව හෙළිදරව් කරනු ලැබේ.

**8. පෙර වසරේ ගැලපුම්**

2020 වසරේ මූල්‍ය ප්‍රකාශනවල සමුච්චිත අරමුදල රු.98,000 කින් අධිගණනය වී ඇත. මෙම විෂමතාව 2023 වසරේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරැදි කර ඇත.

**9. අවිනිශ්චිත අවස්ථා**

**ලැබිය යුතු පොළී**

1996 දී භාණ්ඩාගාර බිල්පත්හි ආයෝජනය මත පොළී අහිමිවීම සම්බන්ධයෙන් මණ්ඩලය ලංකා බැංකුවට එරෙහිව කොළඹ දිසා අධිකරණයේ නඩුවක් පවරා ඇත.

එහි විස්තර පහත පරිදිය.

| නඩු අංකය | මුදල (රු.) |
|---|---|
| MR 21843 | 1,454,670.84 |
| MR 21844 | 1,172,602.46 |
| MR 21845 | 2,784,657.55 |

පැමිණිල්ලේ ආභියාචනා අනුව දිසා විනිසුරුවරයා තීන්දුව ලබා දී ඇති අතර පෙත්සම්වල සඳහන් නොවූ අතිරේක සහන ලබා දීම ප්‍රතික්ෂේප කළේය. එබැවින් කෘ.ගො.ර.ම. අධ්‍යක්ෂ මණ්ඩල තීන්දුව ලබා ගනිමින් දිස්ත්‍රික් අධිකරණ තීන්දුවට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කර ඇත.

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය**

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

**<u>සටහන - 01</u>**

**2023.12.31 දිනට දේපළ, පිරියත හා උපකරණ**

| වත්කම් | 2023.01.01 දිනට පිරිවැය/තක්සේරුව | බැහැර කිරීම | ිරිවැය එකතු කිරීම | 2023 .12.31 දිනට ශේෂය | 2023.01.01 දිනට සමුච්චිත ක්ෂය | බැහැර කිරීම | වර්ෂය සඳහා ක්ෂය | මුළු ක්ෂයවීම | 2023.12.31 දිනට ලියා හළ අගය |
|---|---|---|---|---|---|---|---|---|---|
| කාර්යාල උපකරණ | 528,649 | - | - | 528,649 | 462,721 | - | 14,792 | 477,513 | 51,136 |
| සුඛසාධන උපකරණ | 1,325 | - | - | 1,325 | 1,325 | - | - | 1,325 | - |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 77,677 | - | - | 77,677 | 71,264 | - | 2,850 | 74,114 | 3,563 |
| පරිගණක | 264,945 | - | - | 264,945 | 264,945 | - | - | 264,945 | - |
| | **872,595** | **-** | **-** | **872,595** | **800,255** | **-** | **17,642** | **817,897** | **54,698** |

දේපළ, පිරියත හා උපකරණවලට 2023 දෙසැම්බර් 31 දිනට රු.696,175.42 ක ඓතිහාසික පිරිවැයක් සහිත මුළුමණින්ම ක්ෂය කරන ලද තවමත් භාවිතයේ පවතින වත්කම් අන්තර්ගත වේ .

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**
**2023 දෙසැම්බර් 31 දිනට**

| | 31.12.2023 | 31.12.2022 |
|---|---|---|
| **සටහන 02 -තොග** | රු. | රු. |
| මුද්‍රණ ද්‍රව්‍ය | 87,430 | 92,219 |
| | **87,430** | **92,219** |
| **සටහන 03 - ලැබිය යුතු දෑ** | | |
| මරණ පාරිතෝෂික අත්තිකාරම | 5,000 | 5,000 |
| | **5,000** | **5,000** |
| **සටහන 04 - කල්පිරීම දක්වා රඳවාගත් මූල්‍ය සාධනපත්‍ර** | | |
| භාණ්ඩාගාර බිල්පත් - ලංකා බැංකුව | 110,070,126 | - |
| ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | 284,358,861 | 662,541,900 |
| | **394,428,987** | **662,541,900** |
| **සටහන 05 - බැංකුවේ ඇති මුදල්** | | |
| ගිණුම් අංකය 164790 ලංකා බැංකුව යුනියන් පෙදෙස | 332,905 | 118,693 |
| ගිණුම් අංකය164795 ලංකා බැංකුව යුනියන් පෙදෙස | 948,429 | 513,051 |
| ගිණුම් අංකය 91071672 ලංකා බැංකුව නුගේගොඩ | 25,000 | |
| එකතු කිරීමේ ගිණුම් | 102,996 | 68,857 |
| | **1,409,330** | **700,601** |
| **සටහන 06 - ධීවර විශ්‍රාම වැටුප් සමුච්චිත අරමුදල** | | |
| ඉදිරියට ගෙනා ශේෂය | (4,509,752,321) | (4,103,708,674) |
| පෙර වසරේ ගැලපීම | (98,000) | 17,000 |
| | (4,509,850,321) | (4,103,691,674) |
| වර්ෂය තුළ එකතු කිරීම් | | |
| වර්ෂය සඳහා මුළු අතිරික්තය/ (හිඟය) | (425,104,832) | (406,060,646) |
| | **(4,934,955,153)** | **(4,509,752,321)** |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**
**2023 දෙසැම්බර් 31 දිනට**

| | 31.12.2023<br>රු. | 31.12.2022<br>රු. |
|---|---|---|
| **සටහන 7 - මරණ පාරිතෝෂික අරමුදල** | | |
| ඉදිරියට ගෙනා ශේෂය | 32,535,495 | 30,965,195 |
| එකතු කළා: | | |
| වර්ෂය සඳහා දායක මුදල | 1,746,720 | 1,749,300 |
| අඩුකළා: | | |
| මරණ පාරිතෝෂික ගෙවීම් | (83,000) | (179,000) |
| | (83,000) | (179,000) |
| | **1,663,720** | **1,570,300** |
| | **34,199,215** | **32,535,495** |
| **සටහන 08 - ගෙවිය යුතු දෑ** | | |
| විශ්‍රාම වැටුප් ගෙවිම | 5,537,581 | 5,738,914 |
| කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය | 67,786,327 | 62,893,600 |
| ආපසු ගෙවනු ලබන දායක මුදල | 82,940 | 106,702 |
| මරණ පාරිතෝෂිකය | 167,000 | 159,000 |
| දායක මුදල් මත ආපසු ගෙවූ පොළිය | 150,451 | 146,131 |
| පරිගණක නඩත්තුව | - | 11,450 |
| ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම | 86,866,223 | |
| | **160,590,522** | **69,055,797** |
| **සටහන 9 - උපචිත වියදම්** | | |
| මුද්‍රණ කටයුතු සඳහා ප්‍රතිපාදනය | 522,699 | 542,199 |
| විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදනය | 327,000 | 264,600 |
| | **849,699** | **806,799** |

**යීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**
**2023 දෙසැම්බර් 31 දිනට**

| | **31.12.2023** | **31.12.2022** |
|---|---:|---:|
| | රු. | රු. |
| **සටහන 10 - පරිපාලන වියදම්** | | |
| වැටුප් සහ වේතන | 2,283,133 | 3,352,383 |
| සේ.අ.අ. දායක මුදල් | 302,868 | 362,231 |
| සේ.භා.අ. දායක මුදල් | 68,543 | 90,558 |
| විශේෂ දීමනා | 557,736 | 497,736 |
| පාරිතෝෂික | 273,031 | 476,365 |
| ඉන්ධන | 460,976 | 427,930 |
| ලිපි ද්‍රව්‍ය | 314,066 | 249,691 |
| මුද්‍රණ | 267,539 | 121,433 |
| කාර්ය මණ්ඩල නිල ඇඳුම් | - | 10,209 |
| කුලී | 1,237,854 | 937,444 |
| දුරකථන | 370,852 | 333,026 |
| තැපැල් ගාස්තු | 694,102 | 351,051 |
| ජල බිල්පත් | 48,591 | 30,877 |
| ආරක්ෂාව | 184,530 | 121,813 |
| විදුලිය | 313,436 | 135,498 |
| නඩත්තුව - රථ වාහන | 792,711 | 552,388 |
| නඩත්තුව - ගොඩනැගිලි | 491,215 | 35,051 |
| නඩත්තුව - කාර්යාල උපකරණ | 96,073 | 56,212 |
| පරිගණක වියදම් | 331,109 | 182,651 |
| ක්ෂයවීම | 17,642 | 17,642 |
| විගණන ගාස්තු | 324,000 | 239,400 |
| | **9,430,008** | **8,581,590** |
| **සටහන 12 - මූල්‍ය ගාස්තු** | | |
| බැංකු ගාස්තු | 6,236 | 400 |
| | **6,236** | **400** |

# විගණකාධිපති වාර්තා

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ARI/C/AAIB/01/23/56/FA | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2024 ඔක්තෝබර් 08 දින |

සභාපති

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සහ එහි ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමය සහ ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමවල 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් :-

1. ලේකම් - කෘෂිකර්ම අමාත්‍යාංශය
2. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය




අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. ARI/C/AAIB/1/23/56/FA | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2024 ඔක්තෝබර් 08 දින |

සභාපති

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සහ එහි ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමය සහ ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමවල 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ("මණ්ඩලය") සහ එහි ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමය සහ ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමවල ("සමූහය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මණ්ඩලයේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1999 අංක 20 දරන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

සමූහය

වියාවනය කළ මතය

සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. සමූහයේ මතය වියාවනය සඳහා පදනම කොටසේ (1.2) සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ මණ්ඩලයේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ (1.2.1) විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වියාවනය කළ මතය සඳහා පදනම

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1.2.1. හි සඳහන් කරුණු මත පදනම්ව මා විසින් තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කරමි.
සමූහය තුළ ඇති ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමය සඳහා 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1.2.2. හි සඳහන් කරුණු මත පදනම්ව මා විසින් වියාවනය කරන ලද මතයක් ප්‍රකාශ කර තිබුණි.
සමූහය තුළ ඇති ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමය සඳහා 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1.2.3 හි සඳහන් කරුණු මත පදනම්ව මා විසින් තත්ත්වාගණනය කරන ලද මතයක් ප්‍රකාශ කර තිබුණි.

### 1.2.1. මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) පරීක්ෂා කරන ලද දිස්ත්‍රික් කාර්යාල 14 ක 2023 මාර්තු මස තෙවන පාර්ශව රක්ෂණ ආදායම ලෙස මූල්‍ය ප්‍රකාශන අනුව හඳුනාගෙන ඇති අගය සහ දිස්ත්‍රික් කාර්යාලවල පරිගණක ගත දත්ත අනුව ආදායම අතර රු.8,119,818 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වගාහානි රක්ෂණ වන්දි ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ලෙස මණ්ඩලයේ අවසන් ගිණුම් තුළ දක්වා තිබුණු රු.4,249,619,152 ක ලැබිය යුතු ආදායම 2023 වර්ෂයේදී කපා හැර තිබුණි. 1999 අංක 20 දරණ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩල පනත අනුව මෙහෙයුම් ආදායමින් සියයට 5 ක් ගොවිජන රක්ෂණ අරමුදලට මාරුකරන බැවින් ඉහත මුදලට අදාළව එලෙස මෙහෙයුම් අදායමින් මාරුකළ රු.212,480,957 ක මුදල ගොවිජන රක්ෂණ අරමුදලින් ඉවත් කර සමුච්චිත අරමුදලට ගලපා නොතිබුණි.

(ඇ) මහියංගනය, ඇඹිලිපිටිය සහ අනුරාධපුරය යන නගරවල පිහිටි මණ්ඩලයට අයත් නිල නිවාස 3 පිහිටි පර්චස් 76.6 ක් වූ ඉඩම් වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඈ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07හි 04 වන ඡේදයට පටහැනිව,

(i) සම්බන්ධිත පාර්ශව ගනුදෙනු ශේෂ අතර වෙනස රු.54,053,519 ක් ලැබිය යුතු ගිණුම් ශේෂ තුළ ගැලපීම සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම සඳහා පවත්වාගෙන යන ජංගම ගිණුම් වල සත්‍ය මුදල් ගලා ඒම රු.206,225,000 ක් සහ සත්‍ය මුදල් ගලා යාම රු.205,665,309 ක් මෙහෙයුම් මුදල් ප්‍රවාහය තුළ හඳුනා ගෙන නොතිබීම නිසා මෙහෙයුම් මුදල් ප්‍රවාහය රු.54,613,210 කින් ඌණගණනය වී තිබුණි.

(ii) මුදලින් ගෙවන ලද සේවක වෛද්‍ය රක්ෂණ ගාස්තු ගෙවීම රු.2,181,826 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම වටිනාකමෙන් මෙහෙයුම් මුදල් ප්‍රවාහය අධි ගණනය වී තිබුණි.

(iii) ගොවීන්ගේ මරණ පාරිතෝෂික අරමුදල් ගිණුමෙහි සත්‍ය මුදල් ප්‍රවාහය රු.49,281,460 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයක් ලෙස නොදක්වා ගොවීන්ගේ මරණ පාරිතෝෂික අරමුදල් ගිණුමෙහි ශේෂ වෙනස රු.133,219,275 ක් ආයෝජන ක්‍රියාකාකම්වලින් වූ මුදල් ප්‍රවාහයක් ලෙස වාර්තා කිරීම හේතුවෙන් රු.49,281,460 කින් මෙහෙයුම් මුදල් ප්‍රවාහය අවතක්සේරු වී රු.133,219,275 කින් ආයෝජන මුදල් ප්‍රවාහය අධි ගණනය වී තිබුණි.

(iv) ගොවි විශ්‍රාම වැටුප් යොජනාක්‍රමයෙහි ණය ගිණුමෙහි රු.20,000,000 ක ණය පියවීම ආයෝජන මුදල් ගලා ඒමක් ලෙස සටහන් නොකිරීම නිසා අයෝජන මුදල් ප්‍රවාහය එම වටිනාකමින් ඌණ ගණනය වී තිබුණි.

(v) සේවක වෛද්‍ය රක්ෂණ අරමුදලට අදාලව රු.2,430,248 ක සහ ගොවීන්ගේ මරණ පාරිතෝෂික අරමුදලට අදාළව රු.6,326,428 ක ලැබිය යුතු ආයෝජන පොලී ආදායම් ගිණුම්වල ශේෂ වෙනස ආයෝජන ක්‍රියාකාරකම් මත වූ මුදල් ප්‍රවාහය ලෙස සැලකීම නිසා අයෝජන මුදල් ප්‍රවාහය රු. 8,756,676 කින් ඌණ ගණනය වී තිබුණි.

(vi) සේවක වෛද්‍ය රක්ෂණ අරමුදල් ගිණුමේ ශේෂ වෙනස රු.8,500,488 ක වැඩි වීම ආයෝජන මුදල් ප්‍රවාහය තුළ වාර්තා කිරීම නිසා ආයෝජන මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයෙන් අධි ගණනය වී තිබුණි.

(vii) සේවක වෛද්‍ය රක්ෂණ අරමුදලේ ආයෝජන මත ලද පොලිය රු.2,972,367 ක් ආයෝජන මුදල් ප්‍රවාහය තුළ ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ආයෝජන මුදල් ප්‍රවාහය ඌණ ගණනය වී තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.2.2 ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමය

**වියාචනය කළ මතය සඳහා පදනම**

(අ) යෝජනාක්‍රමයේ මුළු වත්කම් රු.2,202,748,150 ක් සහ මුළු වගකීම් රු.89,457,327,488 ක් වූයෙන් වත්කම් ඉක්මවූ වගකීම් රු.87,254,579,339 ක් ද, මුළු ජංගම වත්කම රු.1,092,503,529 ක් සහ මුළු ජංගම වගකීම් රු.2,527,354,554 ක් වූයෙන් ජංගම වත්කම් ඉක්මවූ ජංගම වගකීම රු.1,434,851,025 ක් ද වන අතර භාණ්ඩාගාරයේ දායකත්වයක් නොමැතිව යෝජනා ක්‍රමය පවත්වාගෙන යා නොහැකි තත්ත්වයක පවතින නිසා යෝජනාක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම ගැටළු සහගතවේ.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 88 ඡේදයට පටහැනිව සමාලෝචිත වර්ෂයේ දී ගොවීන්ගෙන් ලැබුණු වාරික ආදායම හා ආයෝජන පොලිය ඇතුළුව ලැබුණු රු.133,810,611 ක මුදල කාලපරිච්ඡේදයේ ආදායමක් ලෙස ගිණුම්ගත නොකර සමුච්චිත අරමුදලට ගලපා තිබුණු බැවින් එම ප්‍රමාණයෙන් ලාභය අඩු වී තිබුණි.

(ඇ) මණ්ඩලය විසින් යෝජනාක්‍රමයට අදාළව ගෙවූ රු.10,585,145 ක මුදල, මුදල් ගලායාමක් ලෙසද රු.3,046,341,760 ක් වූ පෙර වර්ෂ ගැලපීම් කාරක ප්‍රාග්ධනයේ මුදල් ගලා ඒමක් ලෙස ද මණ්ඩලය වෙනුවෙන් පවත්වා ගෙන තිබූ ජංගම ගිණුමේ රු.470,320 ක වෙනස දෙවරක් ද වශයෙන් මුදල් ප්‍රවාහයට වැරදි සහගත ලෙස ගළපා

තිබුණි. තව ද අලුතින් අරමුදල සඳහා දායක වූ ගොවීන්ගෙන් ලද රු.20,730,787 ක ලැබූ මුදල ද මුදල් ගලා ඒමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගළපා නොතිබුණ අතර මුදලින් පියවන ලද රු.20,000,000 ක ණය වාරිකය මුදල් ප්‍රවාහය තුළ මුදල් ගලා යාමක් ලෙස සටහන් කර ද නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37 හි 59 වන ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයට රු.86,898,445,376 ක විශ්‍රාම වැටුප් වගකීම සඳහා වූ ආයුගණක තක්සේරුව කර නොතිබූ බැවින් නිරවද්‍යතාව තහවුරු නොවිය.

(ඉ) ගොවීන්ගේ නිවැරදි ජීව දත්ත තොරතුරු යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදයක් නොමැති වීම හේතුවෙන් මියගිය සහ වෙනත් හේතූන් මත හිමිකම් නොපාන ගොවීන්ගේ විශ්‍රාම වැටුප දිගින් දිගටම තැපැල් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර තිබුණි. මෙ හේතුවෙන් 2023 වර්ෂයේ දී ගොවීන් විසින් භාර නොගැනීම නිසා තැපැල් දෙපාර්තමේන්තුව විසින් ආපසු එවූ විශ්‍රාම වැටුප රු.259,373,191 ක් වූ අතර සමාලෝචිත වසර අවසානයට එම දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු ශේෂය රු.81,000,602 ක් විය. විශ්‍රාම වැටුප් ලබා නොගත් ගොවීන් පිළිබඳ විස්තර නඩත්තු කර නොතිබීම නිසා වර්ෂ අවසාන ශේෂයෙහි සහ ලද මුදලෙහි නිරවද්‍යතාව තහවුරු නොවිය.

### 1.2.3 ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමය

**තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 7 හි 4 වන ඡේදයට පටහැනිව පෙර වර්ෂ ගැලපුම් රු.98,000 ක් අඩුකිරීමක් ද මරණ පාරිතෝෂික අරමුදල සඳහා වෙන් කළ රු.1,746,720 ක මුදල එකතු කළ යුතු වුවත් අඩුකර දැක්වීමත්, මරණ පාරිතෝෂික අරමුදලින් කළ ගෙවීම රු.173,000 ක් අනාවරණය නොකිරීමත්, ගෙවිය යුතු මරණ පාරිතෝෂික ශේෂයෙහි වෙනස වූ රු.8,000 ක් කාරක ප්‍රාග්ධනය වෙනස්වීම් තුළ එකතු කිරීම ලෙස අන්තර්ගත කිරීම හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් රු.3,410,440 කින් අවතක්සේරු වී තිබුණි. මරණ පාරිතෝෂික අරමුදල් ගිණුමේ ශේෂයෙහි වෙනස හා වෙන්කිරීම්වල එකතුව වූ රු.3,410,440 ක මුදල ආයෝජන ක්‍රියාකාරකම්වලට එකතු කිරීම හේතුවෙන් ආයෝජන මුදල් ප්‍රවාහය අධි ගණනය වී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37 හි 59 වන ඡේදය ප්‍රකාරව රු.5,532,349,026 ක් වූ විශ්‍රාම වැටුප් වගකීම සඳහා වූ ආයු ගණක තක්සේරුව 2007 වර්ෂයෙන් පසුව සිදු කර නොතිබුණි.

(ඇ) විශ්‍රාම වැටුප් වගකීම රු.5,532,349,026 ක් වුවද අදාළ ආයෝජන වටිනාකම රු.793,308,692 ක් වූයෙන් මෙම බැඳීම පියවීමට ප්‍රමාණවත් ආයෝජනයක් සිදුකර නොතිබුණි.

(ඈ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් කාර්ය මණ්ඩලයක් අනුමත කර නොතිබියදී අදාළ කාර්ය සඳහා සෘජුවම සම්බන්ධ නොමැති නිලධාරීන් දෙදෙනෙකු සඳහා ගෙවූ එකතුව රු.1,332,218 ක් වූ වැටුප් වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) යෝජනාක්‍රමයේ මුළු ශුද්ධ වත්කම් දිගින් දිගටම සෘණ අගයක් වීම මත යෝජනාක්‍රමයේ මුළු වත්කම් උපලබ්ධි කිරීමෙන් මුළු වගකීම් පියවීමට නොහැකි වීමත් මත යෝජනාක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම මතභේදාත්මක වේ.

ඉහත විස්තර කර ඇති පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන්, සමූහයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන් වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

## 1.3 මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැළපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ සහ සමූහයේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

**1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙමහයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ සහ සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මණ්ඩලයේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් සමූහයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මණ්ඩලය පිළිබඳ මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණු නමුත් සමූහය විගණනය සඳහා අවශ්‍ය යැයි සැලකෙන සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා ලබාගෙන නොමැති අතර නිසි ගිණුම් වාර්තා සමූහය තබා තිබේද යන්න තීරණය කිරීමට මට නොහැකි විය.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2.1 (ඇ) න ඡේදයෙහි දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූළ නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | **නීති රීති / විධානයට යොමුව** | **නිරීක්ෂණ** |
|---|---|---|
| | ------------------------------ | ---------- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ 381 | මණ්ඩලයේ බැංකු ගිණුම් 45 ක්ද ඇතුළු සමූහයේ බැංකු ගිණුම් 57 ක් භාණ්ඩාගාර අනුමැතිය නොමැතිව ආරම්භ කර පවත්වාගෙන යනු ලබයි. |
| (ආ) | 2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/29 දරන කාර්ය පටිපාටික රීති සඳහා වන අති විශේෂ ගැසට් පත්‍රයේ IX පරිච්ඡේදයේ 131 වගන්තිය | වැඩ බැලීමේ පත් කිරීමක් කළ යුත්තේ අනුමත කාර්ය මණ්ඩලය තුළ ඇති තනතුරක සේවයේ නියුතු නිත්‍ය රජයේ නිලධරයකු, විධිමත් අනුමැතියක් ලබාගෙන කිසියම් කාලසීමාවක් එම තනතුරෙහි සේවයෙන් බැහැරව සිටින අවස්ථාවක හෝ අනුමත කාර්ය මණ්ඩලය තුළ ඇති තනතුරක පුරප්පාඩුවක් පවත්නා අවස්ථාවක එම තනතුරට ස්ථිර පත් කිරීමක් කරනු ලබන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් වන නමුත්, තනතුරු 07 ක් සඳහා නිලධාරීන් 26 ක් මාස 08 සිට අවුරුදු 12 දක්වා දීර්ඝ |

| | |
|---|---|
| | කාලීනව වැඩ බැලීමේ පදනමට සේවයේ යොදවා තිබුණි. |
| (ඇ) 2015 මැයි 25 දිනැති PED අංක 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2 ඡේදය | චක්‍රලේඛයට පටහැනිව MM 1-1 සේවා ගණයට අයත් නිලධාරීන් 19 දෙනෙකු සඳහා 2022 වර්ෂය තුළදී රු.1,380,533 ක් සහ සමාලෝචිත වර්ෂය තුළදී රු.1,837,960 ක් ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි. |
| (ඈ) 2022 ඔක්තෝබර් 06 දිනැති හා අංක 06/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | වයස අවුරුදු 60 ඉක්මවා සේවයේ යෙදී සිටින සහ 2022 දෙසැම්බර් 31 දින හෝ එදිනට පෙර වයස අවුරුදු 60 සම්පූර්ණ වන රජය සතු ව්‍යවසායන් හි සේවකයන් 2022 දෙසැම්බර් 31 දිනට හෝ ඊට ප්‍රථම අනිවාර්යයෙන්ම විශ්‍රාම ගත යුතු වුවත් සහ කොන්ත්‍රාත් පදනම මත බඳවාගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියක් ලබා ගත යුතු වුවත් එදිනට වයස අවුරුදු 60 සම්පූර්ණ කරන සහ වයස අවුරුදු 60 ඉක්ම වූ නිලධාරීන් 5 ක් සේවයේ යොදවා අනුමැතියක් නොමැතිව වැටුප් හා දීමනා ලෙස රු.4,389,535.62 ක් ගෙවීම කර තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර මණ්ඩලයේ, බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

| බලතල, කර්තව්‍ය, කාර්යයන් | නිරීක්ෂණ |
|---|---|
| (අ)1999 අංක 20 දරන කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ පනතේ 7(අ) උප වගන්තිය | ගොවීන් 8,185 කට 2017 සහ 2018 වර්ෂවල දී ගෙවන ලද රු.70,800,200 ක වන්දි මුදල්, ගිණුම් අංක, ගොවීන්ගේ නම් හා හැඳුනුම්පත් අංක නොගැලපීම හේතුවෙන් වාණිජ බැංකු මගින් ආපසු එවා ඇතත් අදාළ ගොවීන් හඳුනාගෙන එම මුදල නිරවුල් කිරීමට හෝ නැවත භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමට වසර 6 ක් තිස්සේ කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ)2019 සැප්තැම්බර් 02 දිනැති අංක 07/2017 (සංශෝධන II) දරන කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශ චක්‍රලේඛය | තොරතුරු වාර්තා කරන ලද කාර්යාල 17 හි 2021/2022 මහ කන්නයට අදාළව හදිසි අනතුරු රක්ෂණ ආවරණය සඳහා ගොවීන් 23,351 හා ගෙවූ රු.9,244,450 ක මුදලක් මණ්ඩලයේ ආදායම ලෙස හඳුනාගෙන තිබුණු නමුත් ඉන් ගොවීන් 15,491 ක් වෙත ඔප්පු ලබාදී නොතිබුණු අතර ගොවීන් 7,851 ක් වෙත ඔප්පු ලබා දී තිබෙනුයේ වසරක රක්ෂිත කාලයෙන් මාස 07 සිට මාස 10 ක කාලයක් ගත වීමෙන් පසුව බව නිරීක්ෂණය විය. |

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

රු.79,000,000 ක වටිනාකමකට ගිවිසුම්ගත වූ, මණ්ඩලයේ කළමනාකරණ තොරතුරු පද්ධතිය සඳහා ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධති(ERP) System හා දෘඩාංග මිලදී ගැනීමේ කටයුතු 2023 මාර්තු 01 දින ආරම්භ කර 2023 අගෝස්තු 20 දින වන විට අවසන් කළ යුතු වුවත් 2024 ජූලි 31 දින වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි.

2.3 **වෙනත් කරුණු**

(අ) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහය ඇතිව වගාහානි සඳහා මාස 2ක් ඇතුළත වන්දි මුදල් ගෙවිය යුතු වුවත් 2023 මාර්තු මාසයෙන් අවසන් වන 2022/2023 මහ කන්නය සඳහා නිර්දේශ වී ලැබුණු අයදුම්පත් 39,455 ක් වෙනුවෙන් රු.914,574,064 ක් 2023 ජුනි 09 දින ආරම්භ කර 2024 සැප්තැම්බර් 02 දින දක්වා ගෙවීම කර තිබුණි.

(ආ) 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනතෙහි 6(1) වගන්තිය ප්‍රකාරව, යොජනා ක්‍රමයට දායකව විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම ඇති වයස අවුරුදු 60 සම්පූර්ණ වූ ගොවීන් හඳුනා ගෙන විශ්‍රාම වැටුප් නොගෙවීම,15(1) වගන්තිය ප්‍රකාරව පිළිවෙලින් වාරික 5 ක් ගෙවීම පැහැර හැර ඇති බව දායකයෙකුට නොදැන්වීම සහ ප්‍රතිලාභී පාර්ශවය විසින් පිළිවෙලින් වාරික 5 ක් ගෙවීම පැහැර හරිනු නොලබන නමුත් කඩින් කඩ හෝ වාරික 5 ක් නොගෙවූ ප්‍රතිලාභීන් ද ඔප්පුව කඩකළා සේ සලකා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අහිමි කිරීම කර තිබුණි.

(ඇ) දායකයා වෙත ලබා දී තිබෙන සහතික ඔප්පුවේ 6 වගන්තිය ප්‍රකාරව ගෙවා ඇති අර්ධ වාර්ෂික දායක මුදල් ප්‍රමාණයෙන් සියයට 75 ක් ලැබී තිබේ නම් මණ්ඩලය විසින් තීරණය කරන පරිදි නියමිත විශ්‍රාම වැටුපට වඩා අඩු විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ඇතත් එසේ සිදු නොකර විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ සම්පූර්ණයෙන් අහිමිකර තිබුණි.

(ඈ) ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය තුළ ලියාපදිංචි 871,425 ක්වූ ගොවීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට අවුරුදු 61 සිට අවුරුදු 93 දක්වා වයස් ගතවූ ගොවීන් 474,803 ක් වුවත් ඉන් 264,227 දෙනෙකුට විශ්‍රාම වැටුප් ගෙවා නොතිබුණි.

(ඉ) 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනතේ 5 (1) වගන්තිය ප්‍රකාරව වයස අවුරුදු 18 සහ 59 අතර ධීවරයෙකුට මෙම යෝජනා ක්‍රමයට බැඳීමට හිමිකම් ඇතත් 2018 වර්ෂයෙන් පසු සාමාජිකයන් බඳවා නොගැනීම, පනතේ 7 වන වගන්තිය ප්‍රකාරව යෝජනා ක්‍රමයට දායක වී සිටින ධීවරයින් සඳහා වයස අවුරුදු 60 සම්පූර්ණ වන විටම විශ්‍රාම වැටුප් ප්‍රදානය නොකිරීම නිසා 2007 ජනවාරි සිට 2016 දෙසැම්බර් දක්වා කාලයට අදාළව ධීවරයන් 139 ක් සඳහා රු.4,159,063 ක් සහ 2022 සහ 2023 වර්ෂවලට අදාළව ධීවරයින් 45 ක් සඳහා රු.1,378,518 ක් ලෙස එකතුව රු.5,537,581 ක් හිඟ විශ්‍රාම වැටුප් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනය කර තිබුණු නමුත් ධීවරයන් වෙත ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) යෝජනා ක්‍රමයට දායක වී සිටින ධීවරයින් සංඛ්‍යාව 64,117 ක් වූ අතර ධීවරයින්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 60 ඉක්මවා විශ්‍රාම වයසට පැමිණ සිටි 31,146 ක් වූ ධීවර දායකයින්ගෙන් 24,187 ක් (එකවර දායක මුදල් ගෙවා දායකත්වය ලබාගත් දායකයින් 5,549 ක් ඇතුළුව) වෙත ධීවර විශ්‍රාම වැටුප් ප්‍රතිලාභය ප්‍රදානය කර නොතිබුණි.

(උ) ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව (IFC) සමඟ ඒකාබද්ධව කෘෂිකාර්මික කළමනාකරණ තොරතුරු පද්ධතිය ගොඩනැගීම සඳහා එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයෙන් 2022 වර්ෂයේදී රු.20,391,089 ක මුදලක් මණ්ඩලය වෙත ලබාදී තිබුණු අතර එම වර්ෂයේදී ඒ සඳහා රු.23,009,698 ක් වැයකර තිබුණද 2024 වර්ෂය වන විටත් වන්දි ගණනය කිරීම සහ වන්දි ගෙවීමේ ක්‍රියාවලිය සඳහා තොරතුරු පද්ධතිය භාවිතා කර නොතිබුණි.

(ඖ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත ප්‍රකාරව ආදායම් බදු සඳහා ලියාපදිංචි නොවීම හේතුවෙන් 2018 අප්‍රේල් 01 සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා ගෙවිය යුතු බදු මුදල රු.299,354,489 ක් නියමිත දිනයන්හිදී ගෙවා නොතිබීම හේතුවෙන් ප්‍රමාද පොළිය රු.40,869,072 ක පාඩුවක් මණ්ඩලයට දැරීමට සිදු ව තිබුණි.

(එ) 1990 අංක 20 දරන කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ පනතෙහි 24 වගන්තියෙහි 4 වගන්තිය ප්‍රකාරව අනපේක්ෂිත සිදුවීම්වලින් පැන නඟින හිමිකම් දැක්වීම් වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා ස්වකීය අභිමතය පරිදි යොදා ගත යුතු සංචිත අරමුදලක් 2002 වර්ෂයේ සිට ගොඩනඟා ගෙන තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට එහි ශේෂය රු.498,536,253 ක් විය. එම අරමුදල භාවිත කළ යුතු අනපේක්ෂිත සිදුවීම් පිළිබඳව නිර්වචනය කර රීති ගොඩනගාගෙන නොතිබුණු නිසා 2002 වර්ෂයේ සිට මේ දක්වා වසර 21 ක කාලය තුළ මෙම අරමුදල භාවිතා කර නොතිබුණි.

(ඒ) තෙවැනි පාර්ශව රක්ෂණ ආදායමින් සියයට 5 ක් වෙන් කර තෙවන පාර්ශවීය හා සෙසු සාමාන්‍ය රක්ෂණ කටයුතු ප්‍රවර්ධනය උදෙසා නිලධාරීන් දිරි ගැන්වීම අරමුණු කරගෙන දිරි දීමනා ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව දිරි දීමනා අරමුදලක් ගොඩනගාගෙන තිබුණි. 2023 වර්ෂයේ අරමුදල සඳහා වෙන් කිරීම රු.17,672,531 ක් වූ අතර 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.30,686,023 ක් විය. 2022 වර්ෂයේ දී රු.8,437,499 ක් සහ 2023 වර්ෂයේ දී රු.8,714,577 ක් දිරි දීමනා ගෙවීම් කර තිබුණු අතර මෙම අරමුදල පිහිටුවීමට සහ දිරි දීමනා ගෙවීම සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඔ) අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සේවකයින්ට රක්ෂණ ආවරණයක් ලබාදීම සඳහා සේවක වෛද්‍ය රක්ෂණ අරමුදලක් ගොඩනගාගෙන තිබුණු අතර 2023 වර්ෂයේ සමූහයේ දායකත්වය රු.3,519,800 ක් සහ 2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ ශේෂය රු.27,313,478 ක් විය. මෙම අරමුදල පිහිටුවීම සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

ඩබ්ලිව්. පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. ARI/C/FPS/1/23/41/FA | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2024 ජූනි 18 දින |

සභාපති

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මෙ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් :- 1. ලේකම් - කෘෂිකර්ම අමාත්‍යාංශය

2. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ARI/C/FPS/1/23/41/FA　　ඔබේ අංකය / உமது இல. / Your No.　　දිනය / திகதி / Date 2024 ජුනි 18 දින

සභාපති

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

**ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය වියාචනය

ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය වියාචනය සඳහා පදනම

(අ) යෝජනාක්‍රමයේ මුළු වත්කම් රු.2,202,748,150 ක් සහ මුළු වගකීම් රු.89,457,327,488 ක් වූයෙන් වත්කම් ඉක්මවූ වගකීම් රු.87,254,579,339 ක් ද, මුළු ජංගම වත්කම් රු.1,092,503,529 ක් සහ මුළු ජංගම වගකීම් රු.2,527,354,554 ක් වූයෙන් ජංගම වත්කම් ඉක්මවූ ජංගම වගකීම් රු.1,434,851,025 ක් ද වන අතර භාණ්ඩාගාරයේ දායකත්වයක් නොමැතිව යෝජනා ක්‍රමය පවත්වාගෙන යා නොහැකි තත්ත්වයක පවතින නිසා යෝජනාක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම ගැටළු සහගතවේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව　இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.　No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34　+94 11 2 88 72 23　ag@auditorgeneral.gov.lk　www.naosl.gov.lk

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 88 ඡේදයට පටහැනිව සමාලෝචිත වර්ෂයේ දී ගොවීන්ගෙන් ලැබුණු වාරික ආදායම හා ආයෝජන පොලිය ඇතුළුව ලැබුණු රු.133,810,611 ක මුදල, කාලපරිච්ඡේදයේ ආදායමක් ලෙස ගිණුම්ගත නොකර සමුච්චිත අරමුදලට ගලපා තිබුණු බැවින් එම ප්‍රමාණයෙන් ලාභය අඩු වී තිබුණි.

(ඇ) මණ්ඩලය විසින් යෝජනාක්‍රමයට අදාළව ගෙවූ රු10,585,145 ක මුදල, මුදල් ගලායාමක් ලෙසද රු.3,046,341,760 ක් වූ පෙර වර්ෂ ගැලපීම් කාරක ප්‍රාග්ධනයේ මුදල් ගලා ඒමක් ලෙස ද මණ්ඩලය වෙනුවෙන් පවත්වා ගෙන තිබූ ජංගම ගිණුමේ රු.470,320 ක වෙනස දෙවරක් ද වශයෙන් මුදල් ප්‍රවාහයට වැරදි සහගත ලෙස ගළපා තිබුණි. තව ද අළුතින් අරමුදල සඳහා දායක වූ ගොවීන්ගෙන් ලද රු.20,730,787 ක ලැබූ මුදල ද මුදල් ගලා ඒමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගළපා නොතිබුණ අතර මුදලින් පියවන ලද රු.20,000,000 ක ණය වාරිකය මුදල් ප්‍රවාහය තුළ මුදල් ගලා යාමක් ලෙස සටහන් කර ද නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37 හි 59 වන ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයට රු.86,898,445,376 ක විශ්‍රාම වැටුප් වගකීම සඳහා වූ ආයු ගණක තක්සේරුව කර නොතිබූ බැවින් නිවැරදිභාවය තහවුරු නොවීය.

(ඉ) ගොවීන්ගේ නිවැරදි ජීව දත්ත තොරතුරු යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදයක් නොමැති වීම හේතුවෙන් මියගිය සහ වෙනත් හේතුන්මත හිමිකම් නොපාන ගොවීන්ගේ විශ්‍රාම වැටුප දිගින් දිගටම තැපැල් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර තිබුණි. මේ හේතුවෙන් 2023 වර්ෂයේ දී ගොවීන් විසින් භාර නොගැනීම නිසා තැපැල් දෙපාර්තමේන්තුව විසින් ආපසු එවූ විශ්‍රාම වැටුප රු.259,373,191 ක් වූ අතර සමාලෝචිත වසර අවසානයට එම දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු ශේෂය රු.81,000,602 ක් විය. විශ්‍රාම වැටුප් ලබා නොගත් ගොවීන් පිළිබඳ විස්තර නඩත්තු කර නොතිබීම නිසා වර්ෂ අවසාන ශේෂයෙහි සහ ලද මුදලෙහි නිරවද්‍යතාව තහවුරු නොවීය.

ඉහත විස්තර කර ඇති පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන් වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

කොටසේ 1.2.(ඇ) සහ (ඉ) දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1. නීති රීති හා රෙගුලාස්විලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|
| (අ) 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනත | |
| (i). 6 (1) වගන්තිය | අවුරුදු 60 සම්පූර්ණ වූ විට විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබිය යුතු වුවත් එම වයස සම්පූර්ණ කළ ගොවීන් හඳුනාගෙන විශ්‍රාම වැටුප ගෙවීම් කර නොතිබුණි. |
| (ii). 12 (ඇ) වගන්තිය | යෝජනාක්‍රමය සම්බන්ධයෙන් ජීව දත්ත ඇතුළත් තොරතුරු පද්ධතියක් පවත්වා තිබුණද යාවත්කාලීනව දත්ත ඇතුළත් කර යාවත්කාලීන නොකිරීම නිසා අවශ්‍ය මූල්‍ය හා මෙහෙයුම් වාර්තා ලබා ගැනීමට නොහැකි විය. |
| (iii 12 (ඈ) වගන්තිය | යෝජනා ක්‍රමය පිළිබඳව සමීක්ෂණ අගැයුම් හා සමාලෝචනය කර මෙහෙයුම් රීතිවල වෙනස්කම් ඇති කිරීම සිදු කළ යුතු වුවත්, ගොඩනගාගන්නා ලද නීතියක් රීතියක් හෝ රෙගුලාසියක් නොමැතිව හිමිකම් නොපෑ විශ්‍රාම වැටුප ආපසු ගෙවීමේ දී අර්ධ වර්ෂයකට සියයට 3.32 ක පොලී ප්‍රතිශතයක් ශුද්ධ වාරික මුදලට අමතරව ගණනය කර තිබුණි. |
| (iv) 15(1) වගන්තිය | පිළිවෙලින් වාරික 5 ක් ගෙවීම පැහැර හැර ඇති දායකයෙකුට සහතිකය යටතේ වූ ප්‍රතිලාභ අහිමි කිරීම දායකයා වෙත දැන්වීමට මණ්ඩලයට බලය ඇතත් ප්‍රතිලාභි පාර්ශවය විසින් පිළිවෙලින් වාරික 5 ක් ගෙවීම පැහැර හරිනු නොලබන නමුත් කඩින් කඩ හෝ වාරික 5 ක් නොගෙවූ ප්‍රතිලාභීන් ද ඔප්පුව කඩකළා සේ සලකා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අහිමි කර තිබුණි. |

(v) 27(1) වගන්තිය — විෂයභාර අමාත්‍යවරයාගේ සහ මුදල් විෂයභාර අමාත්‍යාවරයාගේ එකඟතාවය මත, යෝජනාක්‍රමය විසින් ලබා ගන්නා ණය ප්‍රමාණය තීරණය විය යුතු වුවත් එවැනි එකඟතාවයක් ලබානොගෙන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයෙන් මෙම යෝජනාක්‍රමයට රු.290,800,755 ක ණය මුදලක් ලබාගෙන තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු පොලියද ඇතුළත් මුළු ණය ශේෂය රු.518,782,124 ක් විය.

(ආ) සහතික ඔප්පුවේ 6 වගන්තිය — ගෙවා ඇති අර්ධ වාර්ෂික දායක මුදල් ප්‍රමාණයෙන් සියයට 75 ක් ලැබී තිබේ නම් මණ්ඩලය විසින් තීරණය කරන පරිදි නියමිත විශ්‍රාම වැටුපට වඩා අඩු විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ඇතත් එම දායකයින් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අහිමිකර තිබුණි.

## 3.2 අවිධිමත් ගනුදෙනු

යෝජනා ක්‍රමයට අදාළව අනුමත කාර්ය මණ්ඩලයක් නොසිටින අතර මණ්ඩලයෙහි මුළු සේවක වැටුප් වියදමින් හා අනිකුත් පරිපාලන වියදම් වලින් ද සියයට 50 ක් බැගින් වූ ප්‍රතිශතයක් යෝජනා ක්‍රමයේ වියදම් ලෙස හරකර තිබුණි. හිමිකම් නොපෑ විශ්‍රාම වැටුප් ආපසු ගෙවීමේ දී ප්‍රතිලාභියාගෙන් ලැබෙන සෑම වාරිකයකින්ම රු.15 බැගින් පරිපාලන වියදම් වශයෙන් ද ගොවියා නිසි පරිදි ගෙවූ එක් වාරිකයකට රු.30 බැගින් රක්ෂණ ගාස්තුවක් ද ගොවියාට ආපසු ගෙවන මුදලින් රු.150 ක් යලි රක්ෂණ ගාස්තුවක් ලෙස ද අඩු කර ගොවියාට ආපසු ගෙවන මුදල තීරණය කර තිබුණ ද මේ සඳහා කිසිදු රීතියක් හෝ අනුමත කර ගෙන නොතිබුණි.

## 3.3 කාර්යසාධනය

(අ) යෝජනා ක්‍රමය තුළ ලියාපදිංචි 871,425 ක්වූ ගොවීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට අවුරුදු 61 සිට අවුරුදු 93 දක්වා වයස් ගතවූ ගොවීන් 474,803 ක් වුවත් ඉන් 264,227 දෙනෙකුට විශ්‍රාම වැටුප් ගෙවා නොතිබුණි. 2022 දී අවුරුදු 60 සම්පූර්ණ කළ විශ්‍රාම වැටුප හිමිවිය යුතු ඉල්ලුම්පත්‍ර එවා නොමැති, දායකයින් සොයා විශ්‍රාම වැටුප් ලබාදීමට අවශ්‍ය කටයුතු කරන ලෙස සියලුම දිස්ත්‍රික් නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරුන් වෙත 2023 ජුනි 23 යොමු කරන ලද අංක 6/FPS/පා/2 දරන ලිපිය මගින් දැනුම් දී තිබුණද, දිස්ත්‍රික් කාර්යාල 12 ක නියැදියක් පරීක්ෂා කිරීමේදී ඉන් 6 ක් මේ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) අනුගාමී වාරික 5 ක් කඩ කර ඇති විට ඒ බව දැනුවත් කර ඔප්පුව සක්‍රිය කිරීම සඳහා අවශ්‍ය පහසුව සලසා නොමැති නිසා නියමිත වයස සම්පූර්ණ වූ පසු විශ්‍රාම වැටුප් සඳහා අයදුම් කළ දායකයින්ගෙන් 2021 වර්ෂයේදී දායකයින් 1127 දෙනෙකුටද 2022 වර්ෂයේදී දායකයින් 2226 දෙනෙකුටද සමාලෝචිත වර්ෂයේ දායකයින් 715 දෙනෙකුටද විශ්‍රාම වැටුප් නොගෙවා ශුද්ධ වාරික මුදල් ගෙවීම් කර තිබුණි.

**3.4 කළමනාකරණ ක්‍රියාකාරකම්**

(අ) තොරතුරු පද්ධතියක් සඳහා දත්ත රැස්කිරීමට 2017 වර්ෂයේදී රු.5,640,925 ක් වියදම් කර ඇතත් අපේක්ෂිත තොරතුරු රැස් නොකිරීම නිසා තොරතුරු පද්ධතිය ගොඩනගා නොතිබුණි.

(ආ) ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ 2007 දෙසැම්බර් 31 දිනට පැවති සමූහ ජීවිත රක්ෂණ අරමුදලේ සහ එයට අදාළ ආයෝජනය වූ රු.251,547,146 ක ශේෂය කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ගිණුමට මාරු කර තිබුණි. යෝජනාක්‍රමයේ මුදල් අවශ්‍යතාව සඳහා 2010, 2011 සහ 2012 වර්ෂවලදී සමූහ ජීවිත රක්ෂණ අරමුදලෙන් රු.295,230,442 ක ණය මුදලක් ලබාගෙන තිබුණු අතර ඒ සඳහා 2023 වර්ෂය දක්වා වූ සමුච්චිත පොලිය රු.422,547,571 ක් විය. සමාලෝචිත වර්ෂයේ යොජනා ක්‍රමයේ පරිපාලන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලද රු.206,225,000 ක මුදලින් රු.7,980,276 ක මුදලක් ද ගොවීන්ගෙන් ලද වාරික ආදායමින් රු. 20,000,000 ක් යොදාගෙන ණය මුදලින් කොටසක් වශයෙන් පියවා තිබුණි. මේ අනුව ජීවිත රක්ෂණ අරමුදලෙහි ආයෝජනය ණය මුදලක් බවට පත් වී තිබුණි.

(ඇ) මාවිල් ආරු සොරොව්ව වැසීම නිසා ගොවීන් වෙත වගා හානි වන්දි ගෙවීම සඳහා රුපියල් මිලියන 7 කට වැඩි මුදලක් පෙර වර්ෂයේ දී ගෙවීම් කර තිබුණු අතර මේ සම්බන්ධව ගොනු කරන ලද නඩුව නීතිපති උපදෙස් සඳහා 2007 නොවැම්බර් 30 දින යොමුකර තිබුණු අතර කිසිදු පසුවිපරමක් සිදුකර නොතිබුණි.

(ඈ) 2012 වර්ෂයේ සිට හිමිකම් නොපෑ ගෙවියයුතු රු.4,254,932,613 ශේෂයෙන් රු.3,033,329,200 ක මුදලක් අදාළ ගොවීන්ට ගෙවීමට කටයුතු නොකර විශ්‍රාම වැටුප් අරමුදලට මාරු කිරීම නිසා අරමුදලේ අවාසිදායක තත්ත්වය අඩුවී තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. ARI/C/FIPS/1/23/48/FA  ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024 මැයි 27 දින

සභාපති

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

CHAIRMAN'S OFFICE
30 MAY 2024
Insurance Board

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් :-
1. ලේකම් - කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
2. ලේකම් - ධීවර අමාත්‍යාංශය
3. ලේකම්- මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34  +94 11 2 88 72 23  ag@auditorgeneral.gov.lk  www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ARI/C/FIPS/1/23/48/FA    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date. 2024 මැයි 27 දින

සභාපති

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව    இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 7 හි 4 වන ඡේදයට පටහැනිව පෙර වර්ෂ ගැලපුම් රු.98,000 ක් අඩුකිරීමක් ද මරණ පාරිතෝෂික අරමුදල සඳහා වෙන් කළ රු.1,746,720 ක මුදල එකතු කළ යුතු වුවත් අඩුකර දැක්වීමත් මරණ පාරිතෝෂික අරමුදලින් කළ ගෙවීම් රු.173,000 ක් අනාවරණය නොකිරීමත්, ගෙවිය යුතු මරණ පාරිතෝෂික ශේෂයෙහි වෙනස වූ රු.8,000 ක් කාරක ප්‍රාග්ධනය වෙනස්වීම් තුළ එකතු කිරීම් ලෙස අන්තර්ගත කිරීම හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් රු.3,410,440 කින් අවතක්සේරු වී තිබුණි. මරණ පාරිතෝෂික අරමුදල් ගිණුමේ ශේෂයෙහි වෙනස හා වෙන්කිරීම්වල එකතුව වූ රු.3,410,440 ක මුදල ආයෝජන ක්‍රියාකාරකම්වලට එකතු කිරීම හේතුවෙන් ආයෝජන මුදල් ප්‍රවාහය අධි ගණනය වී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37 හි 59 වන ඡේදය ප්‍රකාරව රු.5,532,349,026 ක් වූ විශ්‍රාම වැටුප් වගකීම සඳහා වූ ආයු ගණක තක්සේරුව 2007 වර්ෂයෙන් පසුව සිදු කර නොතිබුණි.

(ඇ) විශ්‍රාම වැටුප් වගකීම රු.5,532,349,026 ක් වුවද එදිනට ආයෝජන වටිනාකම රු.793,308,692 ක් වූයෙන් මෙම බැඳීම් පියවීමට ප්‍රමාණවත් ආයෝජනයක් සිදුකර නොතිබුණි.

(ඇ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් කාර්ය මණ්ඩලයක් අනුමත කර නොතිබියදී අදාළ කාර්ය සඳහා සෘජුවම සම්බන්ධ නොමැති නිලධාරීන් දෙදෙනෙකු සඳහා ගෙවූ එකතුව රු.1,332,218 ක් වූ වැටුප් වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) යෝජනාක්‍රමයේ මුළු ශුද්ධ වත්කම් දිගින් දිගටම සෘණ අගයක් වීම මත යෝජනාක්‍රමයේ මුළු වත්කම් උපලබ්ධි කිරීමෙන් මුළු වගකීම් පියවීමට නොහැකි වීමත් මත යෝජනාක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම මතභේදාත්මක වේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, යෝජනා ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය යෝජනා ක්‍රමය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

යෝජනා ක්‍රමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, යෝජනා ක්‍රමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2.** **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ 1.2. (ආ) සහ (ඇ) හි දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් විගණයේදී නිරීක්ෂණය විය.

| **නීති, රීති හා රෙගුලාසි** | **නිරීක්ෂණ** |
|---|---|
| (අ) 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනත | |
| (i) 5 (1) වගන්තිය | වයස අවුරුදු 18 සහ 59 අතර ධීවරයෙකුට මෙම ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට බැඳීමට හිමිකම් ඇතත් 2018 වර්ෂයෙන් පසු කිසිදු සාමාජිකයෙකු බඳවාගෙන නොතිබුණි. |

| | |
|---|---|
| (ii) 7 වගන්තිය | යෝජනා ක්‍රමයට දායක වී සිටින ධීවරයින් සඳහා වයස අවුරුදු 60 සම්පූර්ණ වන විටම විශ්‍රාම වැටුප් ප්‍රදානය කළ යුතු වුවත් 2007 ජනවාරි සිට 2016 දෙසැම්බර් දක්වා කාලයට අදාළව විශ්‍රාම වැටුප් ප්‍රදානය කළ ධීවරයන් 139 ක් සඳහා රු.4,159,063 ක් සහ 2022 සහ 2023 වර්ෂවලදී විශ්‍රාම වැටුප් ප්‍රදානය කළ ධීවරයින් 45 ක් සඳහා රු.1,378,518 ක් ලෙස එකතුව රු.5,537,581 ක් හිඟ විශ්‍රාම වැටුප් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනය කර තිබුණු නමුත් ධීවරයන් වෙත ගෙවීමට කටයුතු කර නොතිබුණි. |
| (iii)16 වන වගන්තිය | දායක මුදල් එකතු කිරීමේ ක්‍රමවේදයක් මණ්ඩලය විසින් හඳුන්වා දී නොමැති බැවින් අනුගාමී වාරික දහයක් සඳහා වාරික මුදල් නිසිපරිදි නොගෙවීම මත දායකයෙකුට ප්‍රතිලාභ අහිමිවීම සම්බන්ධයෙන් දායකයා වෙත දැනුවත් කිරීම් සිදු කළ නොහැකි විය. |
| (v) 20 වන වගන්තිය | යෝජනාක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ස්ථාපිත උපදේශක කාරක සභාව 2016 නොවැම්බර් මාසයෙන් පසු මේ දක්වා රැස්වී නොතිබුණි. |
| (ආ) 2023 ජනවා 27 දිනැති අංක 01/2023 දරන අයවැය චක්‍රලේඛයේ 02 (ඇ) (iii) ඡේදය | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යමණ්ඩල පටිපාටියක් නොමැතිව නිලධාරීන් 4 දෙනෙකු වෙත විශ්‍රාම වැටුප් අංශයේ වැඩ බලන දීමනා ලෙස රු.557,736 ක් ගෙවා තිබුණි. |

**3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

යෝජනා ක්‍රමයට දායක වී සිටින ධීවරයින් සංඛ්‍යාව 64,117 ක් වූ අතර 2018 වර්ෂයෙන් පසු කිසිදු සාමාජිකයෙකු බඳවාගෙන නොතිබුණි. ධීවරයින්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 60 ඉක්මවා විශ්‍රාම වයසට පැමිණ සිටි 31,146 ක් වූ ධීවර දායකයින්ගෙන් 24,187 ක් (එකවර දායක මුදල් ගෙවා දායකත්වය ලබාගත් දායකයින් 5,549 ක් ඇතුළුව) වෙත ධීවර විශ්‍රාම වැටුප් ප්‍රතිලාභය ප්‍රදානය කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

# විගණකාධිපති වාර්තා සඳහා පිළිතුරු

**<u>කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව</u>**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මත**

**1.2 මතය සඳහා පදනම**

**1.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා අදහස් දැක්වීම**

**1.2.1.1.1 ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම**

**1.2.1.2 ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම**

**1.2.2 මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන සඳහා අදහස් දැක්වීම**

**අ)** මහා භාණ්ඩාගාරයෙන් සෘජුව ලබාදෙන ප්‍රතිපාදන පමණක් මහා භාණ්ඩාගාරයෙන් ලැබීම් ලෙස දක්වා ඇත. නමුත් ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා ධීවර දෙපාර්තමේන්තුව මගින් ලැබෙන රු. 1,500,000/- ක මුදල සෘජුව මණ්ඩලය වෙත මහා භාණ්ඩාගාරයෙන් නොලැබෙන නිසා වෙනත් ආදායම් තුල පෙන්වා ඇත.

**ආ)** මහියංගනය, ඇඹිලිපිටිය හා අනුරාධපුරය යන නිල නිවාසයන්හි ඉඩම් වල වටිනාකම හා ඇඹිලිපිටිය නිල නිවාසයේ වටිනාකම තක්සේරු කර ගැනීම සම්බන්ධයෙන් මේ වන විට දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂකවරුන් සමග සාකච්ඡා කර අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇති අතර, කඩිනමින් එම කටයුතු අවසාන කර තක්සේරු වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.

**ඇ)** කෘෂිකාර්මික කළමනාකරණ තොරතුරු පද්ධතිය කෘෂිකර්ම අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් සිදුකරනු ලබන අතර, අදාල වියදම් කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා ප්‍රතිපූරණය කරනු ලබයි. ඊට අදාල සියළුම ගනුදෙනු නිවැරදිව ගිණුම්ගත කර ඇති අතර, ගිණුම් සටහන් මගින්ද අනාවරණය කර ඇත.

**ඈ)** දිස්ත්‍රික් කාර්යාල වෙත 15,000/- ක මුදලක් සෑම දිස්ත්‍රික් කාර්යාලයකම ජංගම ගිණුමේ අවම ශේෂය ලෙස පවත්වා ගෙන යා යුතු බව දක්වා ඇත. දිස්ත්‍රික් කාර්යාලවල මෙම රු.15,000/- ඉක්මවා ඇති මුදල් ප්‍රධාන කාර්යාලය විසින් දිස්ත්‍රික් කාර්යාල වියදම් සඳහා ලබා දී ඇති මුදල් හෝ දිස්ත්‍රික් කාර්යාල විසින් ප්‍රධාන කාර්යාලය වෙත ප්‍රේෂනය කිරිම සඳහා ඇති මුදල් වටිනාකම වේ.
**දිස්ත්‍රික් කාර්යාල බැංකු ගිණුම් තුල පවතින නිවැරදි ශේෂය මූල්‍ය තත්තව ප්‍රකාශනයේ නිවැරදිව හදුනාගෙන ඇති බව පෙන්වා දෙමි.**

**ඉ)** ඇතැම් නියෝජිතයින් මුදල් බැංකුගත කළද අදාල තැන්පතු රිසිට්පත් සහ තාවකාලික ආවරණ පත්‍ර කාර්යාලයට ලබා දීම සිදුවන්වන්නේ ඊළඟ මාසයේ පළමු හෝ දෙවන සතිය තුළ වේ. මෙවැනි අවස්ථාවල අදාල මාසයේ තැන්පතු ප්‍රමාණය පිළිබඳව දිස්ත්‍රික් කාර්යාල යාවත්කාලීන නොවේ. එහෙත් මුදල් අංශය මගින් එම මුදල් තැන්පත් කළ බැංකුව අනුව එක් එක් දිස්ත්‍රික්කයන් ලද ආදායම යාවත්කාලීන කෙරේ. ඒ අනුව, අදාල දිස්ත්‍රික් කාර්යාලයන්ද ඒ සමඟ යාවත්කාලීන වන අතර, මුදල් අංශය මගින් සෑම මසක් අවසානයේ එක් එක් දිස්ත්‍රික්කයන් ඉපයූ ආදායම දක්වන අතර, ඒ අනුව කොමිස් මුදල් ගණනය කිරීම සිදුවේ.

**ඊ) දිස්ත්‍රික් කාර්යාල වලින් අය කරනු ලබන වාර මුදල් අදාල මාසයේදිම ප්‍රධාන කාර්යාලිය ගිණුම් වෙත යෝජනා ක්‍රම අනුව තැන්පත් කරන ලෙස අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.ඉදිරියේදි මෙවැනි තත්ත්වයන් ඇතිවීම වලක්වා කටයුතු කරන බව පෙන්වා දෙමි.**

උ)

**I,II විගණන විමසුමෙහි දක්වා ඇති පරිදි මුදලින් ලද පොලිය, ණය ආපසු ලැබීම්, සේවක වෛද්‍යාධාර අරමුදල් ගිණුම, ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ පරිපාලන වියදම් සඳහා මුදලින් ලැබීම් හා සේවක වෛද්‍යාධාර යෝජනා ක්‍රමය සඳහා ප්‍රතිලාභ ගෙවීම් හා පරිපාලන වියදම් දැරීම්, අදාල ගිණුම් තුලින් නිවැරදිව සිදු කර ගැලපීම් සිදු කර එම ගිණුම්වල පවතින ශුද්ධ ශේෂයන් පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් තුල දක්වා ඇත. ඉදිරියේදී මුදල් ප්‍රවාහ ප්‍රකාශයන් නිවැරදිව ගිණුම්කරන ප්‍රමිත අංක 07 අනුව පිළියෙල කිරිමට අපේක්ෂා කෙරේ. ඉදිරිපත් කිරිමේදී ඇති වී ඇති දෝශ ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරනු ලැබේ.**

**<u>2.2.2 නිති රිති විධානයට යොමුව</u>**

**අ) i. බඳවා ගැනිමේ පරිපාටිය අනුව එක් එක් අංශය සඳහා නම් කොට ඇති සහකාර අධ්‍යක්ෂවරුන් ප්‍රමානවත් පරිදි බඳවා ගැනිමට අනුමැතිය නොලැබිම හා පුරප්පාඩු වූ තනතුරු සඳහා සුදුසුකම් සහිත අයදුම්කරුවන් ඉදිරිපත් නොවිය.බඳවා ගන්නා ලද අයදුම්කරුවන්ගේ සුදුසුකම් හා අදාල අංශවල සේවය කිරිමට ඔවුන් සතිව පැවති විෂයානුබද්ධ දැනුම පරික්ෂා කර කෙටි පුහුණුවකින් පසුව අදාල නිලධාරින් ප්‍රධාන කාර්යාලයේ අදාල අංශවලට අනියුක්ත කිරිමට කටයුතු කර ඇත.**

**<u>ii) 5.2.1 (අ) උප වගන්තිය</u>**

**මණ්ඩලය වෙත ස්ථිර කාර්ය මණ්ඩලය බඳවා ගැනිම සඳහා අනුමැතිය නොලැබි තිබුණු කාල පරිච්ඡේදයේදි මණ්ඩලිය කටයුතු සිදු කර ගෙන යාම සඳහා අදාල පුහුණු පදනමින් නිළධාරින් බඳවා ගත් අතර එම නිළධාරින් විසින් මණ්ඩලිය කටයුතු සඳහා කාර්යක්ෂමව සිදු කර ගෙන යාම සඳහා විශාල දායකත්වයක් දරණ ලදි** අනියම් පදනම මත කටයුතු කරනු ලබන කළමනාකරණ සහකාර නිලධාරීන් හට ඔවුන්ගේ තනතුරට අවශ්‍ය මූලික සුදුසුකම් සපුරාගන්නා ලෙස පෙළඹවීම් සිදු කර ඇති අතර ඉදිරියේ දී එම නිලධාරීන් අදාළ සුදුසුකම් සපුරා ගැනීමෙන් පසුව කළමනාකරණ සහකාර තනතුරේ ස්ථිර කිරීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි.

**ආ) මු.රෙ 381 - මණ්ඩලය විසින් රාජකාරි ගිණුම් ආරම්භ කිරිමේදි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් යොමු කර අදාල අනුමැතිය ලබා ගනු ලබයි.**

**මු.රෙ 395 - මණ්ඩලය විසින් පවත්වා ගෙන යනු ලබන ගිණුම් සඳහා බැංකු ගිණුම් සැසඳුම් පිළියෙල කර ඇති බව පෙන්වා දෙමි.**

ඇ) i) මණ්ඩලයේ පුරප්පාඩුව පැවති තනතුරු සම්පූර්ණ කිරීමට නොහැකි වීම නිසා වැඩ බැලීමේ තනතුරු මඟින් දීප ව්‍යාප්තව සිටින ගොවි ජනතාව වෙනුවෙන් රාජකාරී සහ වගකීම් ඉටු කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන සේවාවන් අඛණ්ඩව පවත්වා ගැනීමට කටයුතු කරන ලදී. ඉදිරියේදී මෙම තත්වය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

ii) මණ්ඩලිය නිළධාරින්ගේ නිවාඩු සම්බන්ධව කටයුතු කිරිමේදි වරින් වර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද චක්‍රලේඛ හා උපදෙස් ලිපි අනුව නිවාඩු ගණනය කිරිම සිදුකරනු ලබන අතර ආයතන සංග්‍රහයේ ඇතුලත් සියළුම වගන්ති හා කොන්දේසි ඒ ආකාරයෙන්ම මණ්ඩලයේ නිළධාරින්ගේ නිවාඩු සඳහා අදාල කර නොගනි.

ඒ අනුව අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන II) විසින් අධ්‍යක්ෂ ජනරාල්ගේ මෙරටින් ගත කරන ලද කාලය සඳහා නිවාඩු අනුමත කර ඇත.

**ඇ)** මේ වන විට වැඩ බැලීමේ තනතුරු 02 ක් සඳහා ස්ථිර බඳවා ගැනීම් සිදු කර ඇති අතර අනෙකුත් පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමට අනුමැතිය සඳහා යොමු කර ඇත. අනුමැතිය ලැබුණු පසු පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

**ඉ) i)** කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය ක්‍රියාත්මක කරනු ලබන්නේ 1990 අංක 20 දරණ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනත යටතේය. එකී පාර්ලිමේන්තු පනත ප්‍රකාරව මණ්ඩලයේ අඛන්ඩ පැවැත්ම සඳහා තීරණ ගැනීමේ නිසි බලය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත. ඒ අනුව පනතේ බලතල ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කර ඇති තීරණයකට චක්‍රලේඛණයක් මගින් පෙන්වා ඇති කරුණක් අනුගමනය කල යුතු බව විගණනය මගින් පෙන්වා දී තිබූ බැවින් අදාල චක්‍රලේඛණය නිකුත් කර ඇති ආයතනයෙන් අනුමැතිය ලබා ගැනීම සඳහා 2019/05/10 දිනැති අංක 3/1/8/1 දරණ ලිපිය මගින් රේඛීය අමාත්‍යාංශයේ ලේඛම්වරයාගෙන් ඉල්ලුම් කර ඇත. මේ සම්බන්ධයෙන් තීරණයක් ලබා දෙන තෙක් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ක්‍රියාත්මක වන අතර, මේ සම්බන්ධයෙන් 2023/03/27 දිනැති අංක 3/1/8/1දරණ ලිපිය මගින් නැවත රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ඉල්ලීමක් කර ඇති බව දන්වා සිටිමි.

**ii)** ) PED 1/2015 හා 2015.05.25 දිනැති චක්‍රලේඛණයේ 3.9 වගන්ති ප්‍රකාරව විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා සිටින නිලධාරියෙකුට අධ්‍යක්ෂ මණ්ඩලයේ විශේෂ අනුමැතියකින් තොරව ප්‍රවාහන දීමනාව ලබා ගැනීම, නිල වාහනය පාවිච්චි කිරීම හෝ රියදුරුගේ සේවය ලබා ගැනීමට හිමිකමක් නොමැති නමුත් නිළධාරියාගේ පාලනයෙන් තොරව රෝගී තත්වයක් හේතුවෙන් මසකට වැඩි කාලයක් වැටුප් රහිත නිවාඩු ලබාගෙන සිටින නිලධාරියෙකුට එම පහසුකම ලබා ගැනීමට හිමිකමක් ඇති බව සඳහන් කර ඇත.අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2022.12.15 සිට 2022.12.31 දක්වා කාලය සඳහා වැටුප් රහිත නිවාඩු ලබා ගෙන විදේශ ගත වී ඇති අතර එහිදී ඇති වූ අසනීප තත්වය හේතුවෙන් සැලසුම් කරන ලද දින (2022.12.31) දිනට නැවත පැමිණිමට නොහැකි වි ඇති අතර 2023.01.30 දක්වා කාලය තුල විදේශ ගතව සිට ඇත.ඒ අනුව නිළධාරියාගේ පාලනයෙන් තොරව සිදුවූ මෙම තත්වය මත ගත කරන ලද වැටුප් රහිත නිවාඩු කාලය වන 2022.12.31 වන දින සිට 2023.01.31 දක්වා වන කාලපරිච්ඡේදය තුල වාහනය හා රියදුරු හා ප්‍රවාහන දිමනාව ලබාගෙන ඇත.

ඊ) මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව 421ක් වුවද දීර්ඝ කාලයක් තිස්සේ මෙම පුරප්පාඩු සම්පූර්ණ නොවීම නිසා සේවක හිඟයක් මණ්ඩලය තුළ පැණ නැගී ඇත. මෑත කාලය තුළ මණ්ඩලය මඟින් සැලකිය යුතු ව්‍යාපෘති සංඛ්‍යාවක් ක්‍රියාවට නැංවීම නිසා රාජකාරී කටයුතු සැලකිය යුතු ලෙස ඉහල යන ලදී. විශේෂයෙන්ම නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ බඳවා ගැනීම් ආරම්භ කරමින් දීප ව්‍යාප්තව ප්‍රචලිත කිරීම ආරම්භ කරන ලදී. තවද මණ්ඩලයට දැඩි අවශ්‍යතාවක්ව පැවති ERP පද්ධතිය මණ්ඩලය තුළ ක්‍රියාවට නංවන ලදී එමෙන්ම නව පුහුණු මධ්‍යස්ථානය , AIMS ව්‍යාපෘතිය, රක්ෂණ ප්‍රවර්ධන කටයුතු, 4000 කට අධික වූ තැපැල් කන්තෝරු, සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පශු රක්ෂණ යෝජනා ක්‍රමයට අදාලව සත්ව රක්ෂණය ව්‍යාප්ත කිරීම ආරම්භ කිරීම, නව බඳවා ගැනීමේ පරිපාටිය සහ කාර්යය පටිපාටිය සැකසීම වැනි ව්‍යාපෘති සකස් කර මේ වන විට ක්‍රියාවට නංවමින් පවතී.
එබැවින් අදාළ පුරප්පාඩු සම්පූර්ණ කරන තෙක් අද්දැකීම් බහුල මෙම නිලධාරීන්ගේ සේවය ලබා ගැනීමට කටයුතු කරන ලදී. ඒ අනුව කොන්ත්‍රාත් පදනම මත සංවර්ධන නිළධාරීන් හා කළමනාකරණ නිළධාරීන් බඳවා ගැනීම සඳහා 531/18 අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මඟින් අනුමැතිය ලබා දී ඇත. මේ වන විට නව බඳවා ගැනීම් සිදු කිරීම සඳහා අදාල අනුමැතිය

ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති අතර ඉදිරියේදී අනුමැතිය ලැබුණු පසු නව බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. පසුව අදාල නිලධාරීන්ගේ සේවය අවසන් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

උ) මෙම ව්‍යාපෘතිය ඇතුළත් GIZ ආයතනය හා ශ්‍රී ලංකා රජය අතර ප්‍රධාන ගිවිසුම 2019 වර්ෂයේදී අත්සන් කර ඇති අතර එය ඇතුළත් SME Sector Develop සඳහා වෙන්කර ඇති යූරෝ මිලියන 3.5 මුදල මඟින් මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් යූරෝ 262,606.47 මුදලක් වෙන්කර ඇත.විදේශ සම්පත් දෙපාර්තුමේන්තුව මඟින් ශ්‍රී ලංකා රජය හා GIZ ආයතනය අතර සම්පූර්ණ එකඟතාවය පළකර ඇති මූල්‍ය ප්‍රතිපාදනය යූරෝ මිලියන 11 කි. ඒ සඳහා ශ්‍රී ලංකා රජය වෙනුවෙන් එවකට මුදල් අමාත්‍යංශ ලේකම් විසින් අත්සන් තබා ඇත.

ඌ) i) ඉඩම් ලේඛනයේ තොරතුරු අනුව පරික්ෂා කිරීම් කලයුතු වන්නේ ගොවිජන සේවා මධ්‍යස්ථානවල නිලධාරීන්ව විසිනි. මණ්ඩලයේ නිලධාරීන්ට එය කිරීමේ හැකියාවක් නොමැත.එබැවින් ලැබෙන තොරතුරු නිවැරදි සේ සලකා මණ්ඩලය විසින් ඉදිරි කටයුතු කර ඇත.

ii.) වගා හානි දැනුම් දුන් අවස්ථාවේදීම නිල මුද්‍රාව තබා අයදුම්පත් නිකුත් කල යුතු වුවද ගොවිජන සේවා මධ්‍යස්ථාන වලින් එය කර නොමැති වුවද එය එම ආයතනයේ කාර්යකි. එම කාර්යයේදී මණ්ඩලයේ නිලධාරීන්ට මැදිහත්විය නොහැකි වුවද එය ගොවියාට වන්දි මුදල් නිදහස් නොකිරීමට හේතුවක් කර ගත නොහැකි බැවින් මණ්ඩලය වෙත ලැබෙන වන්දි ලේඛන සඳහා වන්දි ගණනය කිරීම මණ්ඩලයේ නිලධාරීන් විසින් සිදු කරනු ලැබේ. . හානි වාර්තා කල දිනයේම හානි පරික්ෂාවට තක්සේරු කමිටුවට යා නොහැකිය. ගොවීන් සුළු හානියකදී වුවද හානි වාර්තා කර පවතින වගාවෙන් අස්වනු නෙලීම කරනු ලැබේ. සුළු හානි සඳහා වන්දියක් හිමි නොවන අවස්ථාවලදී තක්සේරු කමිටු අස්වනු නෙලා ඇත යනුවෙන් සඳහන් කර ඇත. අස්වනු නෙලා ඇත්නම් හානියක්ද නොමැත. තක්සේරු කමිටු වල රාජ්‍ය නිලධාරීන් සම්බන්ධ වන අවස්ථා වලදී එකවර කමිටුව රැස් කර ගැනීමේ ප්‍රායෝගික ගැටළුද පවතී. වගා හානි වාර්තා කිරිමේදි අදාල ලේඛණයේ සියළුම තොරතුරු සම්පූර්ණ කරන ලෙස ගොවීන් වෙත අදාල ගොවි රුස්වීම් වලදි ගොවීන් වාචිකව දැනුවත් කරනු ලබන අතර, චක්‍ර ලේඛන උපදෙස් පරිදි ගොවින්ගෙන් සම්පූර්ණ කරන ලද වගා රක්ෂණ අයදුම්පත් ගෙන්වා ගැනිම ගොවිජන සේවා මධ්‍යස්ථාන නිළධාරින්ගේ වගකිම වන අතර, ඉදිරියේදි අදාල නිළදාරින් දැනුවත් කිරිමට පියවර ගනු ලැබේ.

iii) පවතින ප්‍රායෝගික තත්ත්වයන් මත හා නිළධාරින්ගේ කාර්යය බහුලතාවයමත මෙවැනි ප්‍රමාදයන් සිදුවන අතර, ගොවිජන සේවා මධස්ථාන සංවර්ධන නිළධාරින් සමග සාකච්ඡා කර අදාල ප්‍රමාදයන් අවම කර ගැනිමට පියවර ගැනිමට කටයුතු කරන බව පෙන්වා දෙමි.

iv) පවතින ප්‍රායෝගික තත්ත්වයන් මත හා නිළධාරින්ගේ කාර්යය බහුලතාවයමත මෙවැනි ප්‍රමාදයන් සිදුවන අතර, ගොවිජන සේවා මධස්ථාන සංවර්ධන නිළධාරින් සමග සාකච්ඡා කර අදාල ප්‍රමාදයන් අවම කර ගැනිමට පියවර ගැනිමට කටයුතු කරන බව පෙන්වා දෙමි. මණ්ඩලයේ නිලධාරී හිඟයක් පවතී බැවින්ද වෙනත් රක්ෂණ යටතේ රක්ෂණ කටයුතු සිදු කෙරෙන බැවින්ද මෙලෙස කාල පමාවක් සිදු වී ඇත. එසේම අනපේක්ෂිත ලෙස ස්වාභාවික විපත් සිදු වන අවස්ථා වැඩි වී ඇති බැවින්ද වන්දි මුදල් නිදහස් කිරීමේ පමාවීමක් තිබේ. කෙසේ වුවද ඉදිරි කන්න වලදී ප්‍රමාදයකින් තොරව වන්දි මුදල් නිදහස් කිරීමට අපේක්ෂා කෙරේ.

v) වගා හානි තක්සේරු කමිටුව තුන් දෙනෙක් නොමැති නම් වන්දි මුදල් නිදහස් කිරීමක් සිදුනොවේ. කෙසේ වුවද නැවත දිස්ත්‍රික් නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ. තක්සේරු කමිටු වල රාජ්‍ය නිලධාරීන් සම්බන්ධ වන අවස්ථා වලදී එකවර කමිටුව රැස් කර ගැනීමේ ප්‍රායෝගික ගැටළු පවතී. කෙසේ වුවද වගා හානි අධීක්ෂණ කටයුතු වලදී,අදාල නිළධාරින්ට එක්වර වගාහානි පරික්ෂා කිරිම සදහා සහභාගි විම පිළිබදව ගොවිජන සේවා කොමසාරිස්වරයා හරහා උපදෙස් ලබා දිමට අපේක්ෂා කෙරේ.

vi.) දිස්ත්‍රික් කාර්යාල තුල පැවති නිළධාරි හිගය හා නිළධාරින්ගේ කාර්යය බහුලතාවය මේ මේ සඳහා හේතුවි ඇති අතර, ඉදිරියේදි නිකුත් කරනු ලබන වගා රක්ෂණ ඔප්පු සඳහා හදිසි අනතුරු ඔප්පු නිකුත් කිරිමට කටයුතු කරනු ලැබේ.

එ i) ක්ෂේත්‍ර රාජකාරිවල නිරතවන නිලධාරින්ගේ එම දින තුල රාජකාරි කටයුතු කරන ක්ෂේත්‍රය සඳහන් කර කාර්යාලයේ White Board එක තුල මහජනතාවට දැන ගැනීම සඳහා ප්‍රදර්ශනය කිරිම ආරම්භ කරන ලදී.

ii) දිස්ත්‍රික් කාර්යාලය තුල නිළධාරින්ගේ ක්ෂේත්‍ර රාජකාරි පිළිබදව සටහන් කිරිම සඳහා ලොග් සටහන් පොතක් පවත්වා ගෙන යනු ලැබේ.

ඒ) මණ්ඩලය විසින් මේ වන විට මණ්ඩලය සතුව පවතින තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත යවා ඇති අතර, අනුරාධපුරය, මහියංගනය, ඇඹිලිපිටිය යන දිස්ත්‍රික් කාර්යාල වල අදාල තක්සේරු වාර්තා ලබා ගැනිම සඳහා කටයුතු කරමින් සිටින අතර, අදාල නිවැරදි වාර්තා ලබා ගැනිමෙන් පසුව අදාල තොරතුරු කොම්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත යැවිමට කටයුතු කිරිමට අපේක්ෂා කෙරේ.

ඔ) අදාල චක්‍ර ලේඛණ උපදෙස් පරිදි කටයුතු කිරිම සඳහා දිස්ත්‍රික් කාර්යාල වෙත උපදෙස් ලබා දි ඇති අතර,මණ්ඩලයේ ERP පද්ධතිය ස්ථාපිත කිරිමෙන් පසුව අදාල වාර්තා නිවැරදිව ලබා ගැනිමට හැකියාව පවතින බව තව දුරටත් දන්වා සිටිමි.

<u>2.3.3 බලතල, කර්තව්‍යන්, කාර්යයන් - නිරික්ෂණ</u>

<u>7 (අ) උප වගන්තිය</u>

ගෙවීම් ප්‍රතික්ෂේපිත වූ ගොවීන් සඳහා සංශෝධිත ලේඛණ සකස් කර එවන ලෙස ගොවිජන සේවා මධ්‍යස්ථාන හා දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කර ඇති අතර, එසේ ලැබුණු සංශෝධිත ලේඛණ සඳහා ගෙවා ඇත. වන්දි මුදල් නැවත හිමිකම් නොපෑ ගොවීන්ගේ එකී රු. 70,800,200/- ක මුදල දිගින් දිගටම ගොවියන් විසින් හිමිකම් නොපෑම නිසා කෘෂි රක්ෂණ අරමුදල වෙත මාරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කල අතර, එම මුදල් කෘෂිකාර්මික දත්ත කළමනාකරණ පද්ධතිය නිර්මාණය කිරීම සඳහා ලබාදීමට අනුමැතිය හිමි වී ඇත. නමුත්, එම මුදල් එකී අරමුණ සඳහා භාවිතා නොකල බැවින් නැවත අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය.

2.2.4 අ.) තාක්ෂණික කරුණු මත තාක්ෂණික කමිටුව විසින් එම ලංසු ඉදිරිපත් කිරිම් ප්‍රසම්පාදනය ක්‍රියාවලිය සඳහා ප්‍රමාණවත් නොවන බව තිරිණය කිරිම මත,නැවත ලංසු කැදවිම සිදු කරන ලද අතර, එම වියදම නිර්කාර්ය වියදමක් ලෙස අර්ථ දැක්විය නොහැක.ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සඳහන් සියලු අවශ්‍යතා එම ප්‍රසම්පාදනය තුළ අනුගමනය කරඇති අතර ඒ සඳහා ලංසු මිලදී ගත් ආයතනය

ලංසු ඉදිරිපත් නොකිරීම හෝ ඉදිරිපත් වූ ලංසු ලේඛණය ඇතුළත් තාක්ෂණික ප්‍රායෝගිකත්වය ප්‍රමාණවත් නොවීම නිසා මෙය සිදුවී ඇත.

ආ.) ප්‍රසම්පාදන කටයුතු සඳහා විශේෂ සහය ලබා ගැනීම සඳහා ERP පද්ධතියට සම්බන්ධිත දෘඩාංග පිළිබඳ පෙර ලංසු හමු සාකච්ඡාවේදී දීර්ඝව සාකච්ඡා කරන ලද අතර එහිදී පැමිණි සියලු දෙනාගේ අදහස වූයේ ඕනෑම ERP පද්ධති සැකැස්මට අවම අවශ්‍යතා ඇති දෘඩාංග මත කටයුතු කළ හැකි අතර මෙය Web Base මඟින් ක්‍රියාත්මක වන බැවින් ඒ සඳහා ඔවුන්ගේ ලංසු සමඟ අවම වශයෙන් දෘඩාංගවල පැවතිය යුතු අවශ්‍යතා පිළිබඳව සටහන් කරන ලෙසය.

තවද, අදාළ වර්ෂයේදී පරිඝණක උපාංග යටතේ වෙන්කර ඇති මුදල සමඟ කටයුතු කළ යුතු බැවින් ඒ සඳහා GIZ ආයතනය මඟින් දෘඩාංග වෙනුවෙන් අරමුදල් වෙන් නොකර ඇති බැවින් මෙම කටයුත්ත අරමුදල් 02 මඟින් ප්‍රසම්පාදනය කළ යුතු බවත් ඒ සඳහා සුදුසු පිරිවිතරයන් මණ්ඩලයේ අවශ්‍යතාව සලකා බලා කටයුතු කිරීමට අවස්ථාව ලබා දියයුතු බැවින් ERP පද්ධතිය සකස් කරන ආයතන හරහා මෙම සාමාන්‍ය පරිඝණක දෘඩාංග මිලදී ගැනීම තාක්ෂණික හා මූල්‍යමය වශයෙන් අවාසිසහගත විය හැකි බැවින් ප්‍රසම්පාදන ලේඛණවල අතිරේකව සඳහන් තොරතුරු ලෙස මෙම දෘඩාංග මිලදී ගැනීම වෙනම ප්‍රසම්පාදනයක් හරහා සිදුකළ යුතු බැවින් තාක්ෂණික කමිටුවේ නිර්දේශ මත ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය සහිතව එය සිදුකිරීමට අනුමැතිය ලබාගෙන ඇත.

මණ්ඩලයේ ප්‍රසම්පාදන සභාපති අවස්ථා 02 දී එම ප්‍රසම්පාදන සිදුකරන කාලච්ඡේද තුළ වෙනස් වූ අතර ඒ සඳහා නැවත රේඛීය අමාත්‍යංශයේ ලේකම්වරයා හෝ ප්‍රසම්පාදන සභාපති සඳහා නිලධාරියකු නම් කරන තුරු මෙම කාර්යය ඉදිරියට කරගෙන යාමට අපොහොසත් වීම මත දෙපාර්තුමේන්තු ප්‍රසම්පාදනයේදී කටයුතු කළහැකි අවම කාලපරිච්ඡේද තුළ මෙම ප්‍රසම්පාදනය සිදුකර ඇත.

මණ්ඩලයේ ප්‍රසම්පාදන සභාපති වෙනස්වීම මත මෙම ප්‍රසම්පාදනයේදී අවම කාලය මත කටයුතු කර ඇත.

ඇ.) සමාන ස්වාභාවයේ ERP System සඳහා ) ලකුණු ලබා දීමේ නිර්ණායක සලකා බැලීමේ දී සියළුම මොඩියුලයන් සංවර්ධනය කල හැකි සහ සංවර්ධනය කර තිබෙන ආයතන සඳහා අවස්ථාව ලබා දීම මඟින් ආයතනයට වඩා වැඩි වාසියක් ලබා ගත හැකිය. එසේ සිදු කර ඇත.

ඇ) තාක්ෂණික යෝජනා ඇගයීමේදී මූල්‍ය යෝජනා විවෘත නොකර ඇති අතර තාක්ෂණික යෝජනා ඇගයීමෙන් පසු සුදුසුකම්ලත් ආයතන දෙක ඉදිරියේ මූල්‍ය යෝජනා විවෘත කිරීම සිදුකරනු ලැබීය.එහිදී ලංසු ලේඛණවලට වසර 10ක් දක්වා අතිරේක තොරතුරු ලෙස ඇතුළත් කළයුතු අයිතමයන් ප්‍රායෝගිකව ලංසු ඉදිරිපත් කර ඇති ආයතන මඟින් උපරිමය වසර 5 ක් පමණක් පදනම් කරගෙන සකස් කළ හැකි බව පූර්ව ලංසු සාකච්ඡාවේදී දැනුම් දී ඇත.ඒ අනුව අදාළ තාක්ෂණික යෝජනා ලබාගත් සුදුසුකම් ලද ආයතනවල මූල්‍ය යෝජනා විශ්ලේෂණයේදී මෙය අදාළ කරගෙන ඇත.

ඇ) ලකුණු ලබා දී ඇත. තාක්ෂණික ඇගයීම් කමිටුව මගින් මෙම නිර්නායක සකස් කිරීමේ දී වඩා ලාභදායී හා ඵලදායී ඇගයීම් ක්‍රියාත්මක කර ඇති අතර අවම වශයෙන් අපගේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා ඉදිරිපත් වන ආයතන දිරි ගැන්වීමේ අරමුණින් මෙය 30 – 50 , 51 – 80 , 80 යන ලෙස දක්වා ඇති අතර ඒ තුලින් අවම ප්‍රසම්පාදන කර ඇති ආයතන ද මෙම ප්‍රසම්පාදනය සඳහා ඉදිරිපත් වීමේ හැකියාව ඇති බව දැන්වීමට මෙය භාවිතා කර ඇත.

ඉ) ගිවිසුම් කාලය දීර්ඝ කර ගැනීමට මේ වන විට කටයුතු සිදු කර ඇත.

ඊ) ව්‍යාපෘතිය තුලින් අපේක්ෂිත ERP පද්ධතියේ මේ වන විට මණ්ඩලයේ ක්‍රියාකාරි තත්ත්වයේ පවතින බව පෙන්වා දෙමි.2022.12.01 දින වන විට අදාල කඩයිම් සම්පූර්ණ කර ඇති ගෙවීම් පමණක් ගෙවා ඇති අතර 10% ක් රඳවා ගැනීමේ මුදල තවමත් GIZ ව්‍යාපෘතිය වෙනුවෙන් වෙන් කර ඇති ගිණුමේ ශේෂව පවතී.

උ.) මෙම ප්‍රතිපාදන මණ්ඩලව වෙත බාහිර ආයතනයකින් ලද ප්‍රධානයක් වන අතර, අදාල ප්‍රතිපාදන වසර තුනක ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කරන අවස්ථාවේදි අදාල ආයතනය විසින් අරමුදල් ලබා දිම පිළිබඳ නිශ්චිත තහවුරුවක් ලැබී නොමැති බැවින් මෙම ප්‍රතිපාදන ලැබිම ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර නොමැති බව පෙන්වා දෙමි. ව්‍යාපෘතියේ ආරම්භය 2019/07/22 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 499/03 මඟින් අනුමැතිය ලබා ගෙන මෙම කටයුත්ත සිදුකර ඇත.

<u>2.3 වෙනත් කරුණු</u>

අ) අනුරාධපුර දිස්ත්‍රික් ලේඛම් කාර්යාලයේ නිළධාරින්ගේ අධික්ෂණ කටයුතු යටතේ මණ්ඩලිය නිළධාරින් සඳහා නිවාඩු නිකේතනයක් ඉදිකිරිම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට ආරම්භ කිරිම් කර ඇත.

ආ.) 2017/ 07 චක්‍රලේඛය කෘෂිකර්ම අමාත්‍යංශ ලේකම් විසින් ආයතන කිහිපයක් සඳහා නිකුත් කරන ලද චක්‍රලේඛයක් වේ. එහි මණ්ඩලයට පැවරී ඇති ප්‍රධාන කාර්යය වනුයේ මණ්ඩලයට ලැබෙන වගා හානි වන්දි ලේඛන සඳහා වන්දි ගණනය තුලනය හා වන්දි මුදල නිදහස් කිරීම වේ.
ගොවීන් දැනුවත් කිරීමේ කාර්යය සිදුකළ යුතුව පවතිනුයේ ගොවීන්ට වඩාත් සමීප ගොවිජන සේවා මධ්‍යස්ථාන වලිනි. පිළිතුරු එම ආයතනයෙන් ලබා ගතයුතු වේ. එසේ වුවද හැකි සෑම අවස්ථාවකදීම මණ්ඩලයේ නිලධාරීන් විසින් එම කාර්යය කරමින් පවතී. ඉදිරියටද එලෙස සිදු කිරීමට කටයුතු කෙරේ.

ඇ) දිස්ත්‍රික්කයේ කන්නයට අදාල සියළු අවසන් වාර්තා එනම් ගොවීන්ගේ නම් අක්කර ප්‍රමාණය, වන්දි මුදල අමාත්‍යාශයෙන් මුදල් ලබා ගැනීම සඳහා එකවර අමාත්‍යාංශයට ලබා දිය යුතුව පවතින බැවින් එලෙස මුදල් නිදහස් කරනු ලබන අතර වරින් වර ගෙවීම් කිරීම තුල වන්දි මුදල් ප්‍රමාද වන ගොවීන්ගෙන් පැමිණිලි ලැබීම හේතුවෙන්ද එසේ කරනු ලැබේ.

ඇ) වන්දි ගණනය කරනු ලබන නිලධාරීන් විසින් සම්පූර්ණ කලයුතු කොටස් සම්පූර්ණ කිරීම සිදු කලද සමහර අවස්ථාවලදී අත්සන දීම අතපසු වී ඇත. නැවත නිළධාරීන් සඳහා උපදෙස් දීමට කටයුතු කරනු ලැබේ.මේ වන විට මෙම දූර්වලතා නිවැරදි කිරිමට කටයුතු කර ඇති බව පෙන්වා දෙමි.

ඉ) වගාවන්ට සිදුවන ස්වභාවික විපත්, ආවරණය කර ඇති අනෙකුත් වගාවන්ට සිදුවන හානි පිළිබඳ තොරතුරු රැස් කිරීම හා මණ්ඩලයට වගා හානි තහවුරු කර ගැනීම, යන කටයුතු AIMS දත්ත පද්ධතියෙහි Damage Reporting, Crop Monitoring හා Map Engine මොඩියුල භාවිතයෙන් සිදු කර ගැනීමේ හැකියාව දැනටමත් පවතී.
හදිසි අනතුරු රක්ෂණ ආවරණය ලබන ගොවීන්ගේ ජීවිතයට සිදුවන ආපදා සහ සිදුව ඇති හානි පිළිබඳ තොරතුරු රැස් කිරීම, වන්දි මුදල බැංකු ගත කිරීම යන කටයුතු දැනට සංවර්ධනය කරමින් පවතින ERP පද්ධතිය මඟින් ඉදිරියේදී ආවරණය වනු ඇත. හදිසි අනතුරු රක්ෂණ ආවරණයන් සහ විශ්‍රාම වැටුප් වැනි ගොවීන් වෙත ලබා දෙන ප්‍රතිලාභ පිළිබඳ ගොවියා දැනුවත් කිරීම සඳහා මණ්ඩලය මඟින් සකස් කරන ලද sms gateway පද්ධතිය, මේ වනවිට ක්‍රියාත්මක වෙමින් පවතී.

වගා ඉඩම් පිලිබඳ දත්ත (ඉඩමේ නම, ඉඩමේ අංකය, එහි සිතියම සහ ඡායාරූප) සහ ගොවීන්ගේ ජීව දත්ත තොරතුරු ඇතුලත් කර එක් එක් ගොවීන් සඳහා වෙන වෙනම පැතිකඩ (profile) පවත්වාගෙන යාම AIMS පද්ධතිය මඟින් සිදු කර ගැනීමේ හැකියාව දැනටමත් එම පද්ධතිය සතුව පවතින අතර, එම දත්ත ඇතුලත් තොරතුරු පද්ධතියක් AIMS පද්ධතිය යටතේ මණ්ඩලය විසින් මේ වන විටත් පවත්වාගෙන යනු ලබයි.

ඊ) Geo Goviya තොරතුරු පද්ධතිය මඟින් රැස් කරනු ලබන දත්ත හා තොරතුරුද මෙම පද්ධතියට ඇතුලත් කර ගැනීමේ හැකියාව පවතී. ඒ පිලිබඳ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ විවිධ රැස්වීම් වලදී සාකච්ඡා කර ඇති නමුත්, Geo Goviya මඟින් රැස් කරනු ලබන දත්ත අනෙකුත් ආයතන සමඟ හුවමාරු කරගන්නා ආකාරය පිලිබඳ නිශ්චිත ක්‍රමවේදයක් මේ දක්වා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් හඳුන්වා දී නොමැත.කෘෂිකර්මාන්තය හා සම්බන්ධ ආයතන කිහිපයක නිලධාරීන් වගා හානි තක්සේරු කමිටුවෙහි සාමාජිකත්වය දරයි. ඒ සියළු නිලධාරීන් හට ප්‍රවේශ වීමට හැකියාව ලබා දෙමින් කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ AIMS පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා, මීට ඉහත දී මූලික මට්ටමේ සාකච්ඡා පැවති නමුත්, එම කටයුතු අමාත්‍යාංශ මට්ටමින් අඛණ්ඩව සිදු නොවුණු අතර, ඒ සඳහා ප්‍රතිපාදන ද නොලැබිණි.

වන්දි ගෙවීම සඳහා පමණක් නොව සමස්ථ කෘෂිකාර්මික ක්ෂේත්‍රයටම අදාළ දත්ත හා තොරතුරු එක් මධ්‍යගත පද්ධතියකට සම්බන්ධ කරවීමේ අවශ්‍යතාවය පවතින අතර, එය අමාත්‍යාංශ මට්ටමින් සිදුවිය යුතු කටයුත්තක් වේ.ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබන මෙම තොරතුරු පද්ධතියේ තොරතුරු, AIMS පද්ධතිය සමග සම්බන්ධ කර අදාල නටයුතු දිසු කිරිම සඳහා මේ වන විට මුලික සාකච්ඡා ආරම්භ කර ඇති බව දන්වා සිටිමි.

උ) මණ්ඩලයේ ක්‍රියාකාරකම් පිළිබඳව ප්‍රතිලාභින් දැනුවත් කිරිමේදි ඔවුන්ට එම ප්‍රතිලාභ ලබා ගත හැකි ආකාරය පිළිබඳව අදාල ප්‍රතිලාභ ලබා ගත හැකි ආකාරය පිළිබඳවද දැනුවත් කරනු ලබන අතර,දිස්ත්‍රික් කාර්යාල නිළධාරින් විසින් දිස්ත්‍රික්කය තුල පවතින ගොවි රැස්විම් වලදි මෙන්ම,ඔවුන්ට සෘජුවම ප්‍රතිලාභ ලබා දෙනු ලබන ගොවිජන සේවා මධ්‍යස්ථාන, තැපැල් කාර්යාල ආදිය මගින් ගොවින්ට අදාල දැනුවත් විම් ලබා ගත හැකි වේ.එසේම 1918 දුරකථන ඇමතුම් මධස්ථානය මගින්ද ගොවින්ට අදාල තොරතුරු ලබා ගැනිමේ හැකියාව පවති.

ඌ ) මෙම ඉදිකිරිම් සිදුකරන ලද කඩහිමියන්ට මෙම ආයතන ඉවත්කරගන්නා ලෙස උපදෙස් ලබා දි ඇති අතර,මෙම ඉදිකිරිම් සිදුකර ඇත්තේ,දිස්ත්‍රික් කාර්යාලය ඉදිරිපස රජය විසින් වෙන් කරන ලද ඉඩම් කොටසේ වන අතර (Reservation) ,ඉදිරියේදි මේ පිළිබඳ නාගරික සංවර්ධන අධිකාරිය හා පලාත් පාලන ආයතන දැනුවත් කිරිමට අපේක්ෂා කෙරේ.මෙම බිම් කොටස මණ්ඩලයට අදාල බිම් කොටසක් නොවන බැවින් මණ්ඩලයට මේ පිළිබඳ නිතිමය ක්‍රියා මාර්ග ගත නොහැකි බව පෙන්වා දෙමි.

එ) තෙවන පාර්ශවිය රක්ෂණ කටයුතු සිදු කරගෙන යාම සඳහා දිස්ත්‍රික් කාර්යාල විසින් මේ වන විට Access යෙදවුම් පද්ධතිය යොදා ගෙන දත්ත පද්ධතිය පවත්වාගෙන යනු ලබයි. මෙම පද්ධතිය තුල

විශ්ලේෂණය කිරිම තුලින් අදාල තොරතුරු ලබා ගත හැකි අතර, දත්ත පද්ධතිය වෙත අදාල තොරතුරු නිවැරදිව ඇතුලත් කරන ලෙස දිස්ත්‍රික් කාර්යාල නිළධාරින් දැනුවත් කර ඇති බව පෙන්වා දෙමි. මණ්ඩලය විසින් දිස්ත්‍රික් කාඊර්යාල කිහිපයක තෙවන පාර්ශවිය රක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරිම සඳහා ERP පද්ධතිය හඳුන්වා දි ඇති අතර, මෙම දත්ත පද්ධතිය භාවිතයෙන් අදාල තොරතුරු නිවැරදිව ලබා ගැනිමේ හැකියාව පවතින බව පෙන්වා දෙමි.

ඒ) සම්මුඛ පරීක්ෂණයෙන් ඉහළ ලකුණු ලබාගත් අයදුම්කරුවන් සේවයට කැඳවීම සඳහා කටයුතු කරන ලද අතර, එම අයදුම්කරුවන් සේවයට වාර්තා නොකිරීම පිළිබඳ මණ්ඩලයට කරුණු දැක්විය නොහැකිය.

ඔ) මණ්ඩලය විසින් සෑම වර්ෂයකම දෙසැම්බර් මස 31 වන දිනට අවසාන ගිණුම් පිළියෙල කරනු ලබන අතර, එම අවස්ථාව වන විට දිස්ත්‍රික් කාර්යාල මගින් අය කරනු ලබන වාර මුදල් සඳහා චෙක්පත් නිකුත් කර ඇති අතර, එම වටිනාකම ලැබිය යුතු රක්ෂණ වාර මුදල් ලෙස හඳුනාගෙන ඇත.

ඕ) දිස්ත්‍රික් කාර්යාල විසින් වියදම් සිදු කිරිමේදි අදාල වියදම් සඳහා මුදල් ප්‍රධාන කාර්යාලය විසින් දිස්ත්‍රික් කාර්යාල වෙත ප්‍රේෂණය කරනු ලබයි. අදාල දිස්ත්‍රික් කාර්යාල වෙත අදාල වියදම් සඳහා මුදල් ගෙවනු ලබන අවස්ථාවේදිම වියදමක් ලෙස හඳුනා ගැනිමට කටයුතු කර ඇත. දිස්ත්‍රික් කාර්යාල විසින් වියදම් දැරිමේදි අදාල වියදමේ වටිනාකම අනුව පමණක් ප්‍රධාන කාර්යාලය විසින් මුදල් ප්‍රේෂනය කරන බැවින් එම වියදම් සෘජුවම වියදමක් ලෙස හඳුනා ගැනිම දෝශ සහගත නොවන බව පෙන්වා දෙමි.

ක) මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පවතින මෙම ශේෂයන්, මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කිරීමට සඳහා මෙම වර්ෂය තුල කිහිප වතාවක් විගණන කළමනාකරණ කමිටුවට හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කරන ලද අතර,මේ දක්වා අදාල අනුමැතිය ලැබි නොමැති අතර, එම ශේෂයන් මෙම ගිණුම් වර්ෂය තුළදී ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

ග) මෙම ශේෂය දීර්ඝ කාලීනව පවතින ශේෂයක් බැවිනුත්, අදාළ පාර්ශවයන් මෙම මුදල් නැවත ඉල්ලුම් නොකිරීම නිසාත්, එම මුදල් ආදායමට ගැනීමට කටයුතු කර ඇත.

ආචර්යය ඩබ්.එම්.එම්.බී.වීරසේකර,
සභාපති,
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

**ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1මතය**

**1.2මතය සඳහා පදනම**

අ ) මණ්ඩලයේ ගොවි විශ්‍රාම වැටුප් දායකයින්ගෙනන් අය කරගන්නා වාර මුදල් එම දායකයින්ගේ වයස අවුරුදු 60 සම්පූර්ණ විමේදි ඔවුන්ට ප්‍රතිලාභ ලෙස ගෙවිය යුතු බැවින්, අය කරන ලද වාර මුදල් සහ ඊට අදාල පොලි මුදලේ එකතුව මණ්ඩලයේ අරමුදල් ගිණුමට ගැලපිම සිදු කර ඇති අතර,ඒ තුලින් අනාගතයේදි ගෙවිය යුතු වගකිම් සඳහා අරමුදල ශක්තිමත් කිරිම අපේක්ෂා කෙරේ.

ආ) 1) ඉහත (අ) පරිදි දායකයින්ගෙන් අය කරන ලද වාර මුදල් ආදායම අරමුදල් ගිණුමට මාරු කර ඇති බැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරම් යටතේ දක්වා ඇත.

ii.) මරණ පාරිතෝශික ගෙවිමේදි ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයට අදාලව ගෙවනු ලබන පාරිතෝෂික මුදල වන 10,585,145/- මුදල මේ යටතේ ගලපා ඇත.

iii) 2023 වර්ෂයේ මණ්ඩලය තුල පැවති භාණ්ඩ අපහරණය කරන ලද අතර, එහිදි ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාල භාණ්ඩ අපහරණය කිරිම තුලින් අය වු මුදල ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇත.

iv.) ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ පරිපාලන වියදම් සඳහා ලැබෙන මුදල් හා පරිපාලන වියදම් දැරිම මෙහෙයුම් කටයුත්තක් බැවින් මෙහෙයුම් ක්‍රියාකාරකම් තුල නිවැරදිව දක්වා ඇත.

v.) වෙනත් ගෙවිය යුතු මුදල ඇතුලත් වෙනස් විම් මුදල් ප්‍රවාහය තුල කාරක ප්‍රාග්ධන වෙනස් විම් යටතේ ගලපා ඇත.

vi.vii) මණ්ඩලයේ යෝජනා ක්‍රම අතර පවතින ණය ශේෂ හා ගෙවිය යුතු පොලි එකතුව මුළු ණය ශේෂය හා ගෙවිය යුතු පොලි එකතුව මුළු ණය ශේෂය ආයෝජන කරන බැවින් එම ශේෂය වෙනත් ගෙවිම් තුල ඇතුලත් කර ඇති බැවින් එම ණය හා පොලිය ගෙවිමේදි මෙහෙයුම් ක්‍රියාකාරකම් වල ඇතුලත් කාරක ප්‍රාග්ධනය වෙනස්කම් වලින් ගැලපිම් සිදුවන නිසා මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වු මුදල් ප්‍රවාහයට මේ වන විටත් ගැලපිම් සිදු වි ඇති නිසා මෙහෙයුම් මුදල් ප්‍රවාහය අවතක්සේරු වි නැත.

ඇ ) ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ හා මණ්ඩලිය අනෙකුත් යෝජනා ක්‍රම සඳහා 2024 අයවැය අනුව ජිව ගණක තක්සේරු ලබා ගැනිම සඳහා මෙම වසරේදි කටයුතු ආරම්භ කර ඇත .

ඇ ) ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ හා මණ්ඩලිය අනෙකුත් යෝජනා ක්‍රම සඳහා 2024 අයවැය අනුව ජිව ගණක තක්සේරු ලබා ගැනිම සඳහා මෙම වසරේදි කටයුතු ආරම්භ කර ඇත .

ඈ) 1.මුදල් ලැබීම් වලට අදාල තොරතුරු සඳහා නිසි අයුරින් ලෙජර් ගිණුම් පවත්වාගෙන යනු ලබයි. මාසිකව යාවත්කාලින වන විශ්‍රාම වැටුප් නාමලේඛණය පරිගණක පද්ධතිය තුළින් ලබාගත හැක.

යෝජනා ක්‍රමයේ දායකත්වය ලබාගෙන ඇති දායකයින්ගේ තොරතුරු පරිගණක පද්ධතිය තුළින් ලබාගත හැක. පසු වාරික පරිගණක ගත කිරීමේ ප්‍රමාදයන් සිදුවී ඇති බැවින් අවලංගු වූ හා අක්‍රිය වූ දායකයින් පද්ධතිය තුලින් ලබාගැනීමට අපහසු වී ඇත. මෙම තත්වය හමුවේ පසු වාරික ස්වයංක්‍රීයව පරිගණක ගත කිරීම සඳහා රාජ්‍ය වාණිජ බැංකු මගින් පසු වාරික අයකර එම වාරික අප දත්ත පද්ධතියට සම්බන්ධ කරගැනීමේ විශේෂ වැඩපිළිවෙලක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

II. ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාලව ප්‍රධාන කාර්යාලය වෙත ලැබෙන සියලු ලේඛන පරික්ෂා කර බලා නිසි පරිදි ප්‍රධාන කාර්යාලයේ යම් ස්ථානයක හෝ ලේඛනාගාරයේ ගබඩා කිරීමට කටයුතු සිදු කෙරෙමින් පවතින බවද, එම ලේඛනවල තොරතුරු සහිත පරිසනක දත්ත පද්ධතිය යාවත්කාලින කිරීමට අදාල කටයුතු සිදු කෙරෙමින් පවතින බවද වැඩිදුරටත් දන්වා සිටිමි. දිසා ගණකාධිවරුන් විසින් නොගෙවූ විශ්‍රාම වැටුප් ලේඛන අන්තර්ජාලය ඔස්සේ අපවෙත ලබා දෙනු ලබන අතර එය විධිමත්ව පවත්වා ගැනීමට කටයුතු කරනු ලැබේ.

ඉ) 2010 වර්ෂයේ මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති කමිටු වාර්තාව පදනම් කරගෙන ගනුලැබූ තීරණයන්ට අනුව ගොවි විශ්‍රාම වැටුප් ගෙවීමේ අවශ්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා භාණ්ඩාගාරයෙන් ලද මුදල් හා හිඟ මුදල් එවකට මණ්ඩලය සතුව තිබූ ධීවර විශ්‍රාම/ කෘෂි රක්ෂණ අරමුදලෙන් යොදවා ගන්නා ලෙසත්, පසුව එම අරමුදල් පියවා ගන්නා ලෙසත් දැනුම් දී ඇත. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව මණ්ඩලයේ අනෙකුත් අතිරික්ත අරමුදල් ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා යොදාගෙන ඇත. එසේ ලබා ගත් මුදල් නැවත කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය හා ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයන් වෙත ගෙවිය යුතුව ඇත. එසේ ලබාගත් අරමුදල් ක්‍රමිකව ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත.

ඊ) ගොවි විශ්‍රාම වැටුප් වගකීම වාර්ෂිකව වැඩිවන අතර, යෝජනා ක්‍රමය තුල ආයෝජන නොමැතිකමත් මෙම යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ වාරික මුදල් වැඩිකිරීමකින් තොරව අවස්ථා කිහිපයකදී රාජ්‍ය ප්‍රතිපත්ති නිසා වැඩිකිරීම හේතුවෙන් මෙම තත්වය උද්ගත වී ඇති අතර, සෑම වර්ෂයකදීම රජයේ අයවැය මගින් මුදල් වෙන්කර ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සිදුකරගෙන යනු ලබයි.

උ) සමාලෝචිත වර්ෂය තුලදී ආයෝජන පොලි ආයෝජන පොලි ආදායම හඳුනා ගැනිමේදි සම්පූර්ණ පොලි ආදායම හඳුනා ගෙන එය ගිණුම්ගතකර ඇත.වර්ෂය අඩුකරගන්නා ලද රඳවා ගැනිමේ බදු වියදමක් නොවන අතර,කෘෂි කාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සමස්ථ ගිණුම් පිළියෙල කිරිමේදි මණ්ඩලය සඳහා ආදායම් බදු ගණනය කිරිම සිදුකරන අතර එසේ ගණනය කරන ලද ආදායම් බදු සඳහා අඩු කිරිමක් වශයෙන් මෙම රඳවා බදු මුදල් ගිණුම්ගත කර ඇති අතර,ඒ සඳහා වන සම්බන්ධිත පාර්ශව සඳහා ඇති ජංගම ගිණුම තුලින් ගැලපිම් කර ඇත.

ඌ) මණ්ඩලයට ලැබෙන ප්‍රාග්ධන ප්‍රධාන හිමිකමක් ලෙස මණ්ඩලයේ ගිණුම් තුල ගෙවා ඇති අතර යෝජනා ක්‍රමයට අදාලව භාවිතා කැ ඇති ප්‍රමාණය වගකිමක් ලෙස යෝජනා ක්‍රමය තුල ගෙවා ඇති අතර, මෙම ගැලපිම් යෝජනා ක්‍රම අතරඇති ජංගම ගිණුම තුලින් ගැලපිම් සිදු කර ඇත.

ඒ) ශුද්ධ වාර මුදල් ගෙවීම්, මරණ පාරිතෝෂික හා බෙලහීන ප්‍රතිලාභ ගෙවීම් වෙනුවෙන් නිකුත් කරනු ලැබූ, ගෙවීම සඳහා ඉදිරිපත් නොකල චෙක්පත් වල කාලය ඉකුත් වූ විට එම චෙක්පත් ආදායමට ගැනීම සිදු කරනු ලබන අතර, එම චෙක්පත් සඳහා දිස්ත්‍රික් කාර්යාලය හරහා අපවෙත ලැබෙන ඉල්ලීම් අනුව නැවත චෙක්පත් නිකුත් කරනු ලබයි. කාලය ඉකුත්වන චෙක්පත් නියමිත පරිදි ලේඛණ ගතකර තබන අතර ඕනෑම අවස්ථාවක දායකයා විසින් හිමිකම් පෑමක් සිදුකරන අවස්ථාවලදී අදාල දිස්ත්‍රික් ශුද්ධ වාර මුදල් ගෙවීම්, මරණ පාරිතෝෂික හා බෙලහීන ප්‍රතිලාභ ගෙවීම් වෙනුවෙන් නිකුත් කරනු ලැබූ, ගෙවීම සඳහා ඉදිරිපත් නොකල චෙක්පත් වල කාලය ඉකුත් වූ විට එම චෙක්පත් ආදායමට ගැනීම සිදු කරනු ලබන අතර, එම චෙක්පත් සඳහා දිස්ත්‍රික් කාර්යාලය හරහා අපවෙත ලැබෙන ඉල්ලීම් අනුව නැවත

චෙක්පත් නිකුත් කරනු ලබයි. කාලය ඉකුත්වන චෙක්පත් නියමිත පරිදි ලේඛණ ගතකර තබන අතර ඕනෑම අවස්ථාවක දායකයා විසින් හිමිකම් පෑමක් සිදුකරන අවස්ථාවලදී අදාල දිස්ත්‍රික් කාර්යාලයේ නිර්දේශ අනුව නැවත ආදායකයා වෙත චෙක්පත් නිකුත් කරනු ලබයි. මණ්ඩලය විසින් විශාල වශයෙන් චෙක්පත් නිකුත් කරනු ලබන අතර, එම චෙක්පත් වලින් මුදල් කර නොගන්නා චෙක්පත් නිරන්තරයෙන් සැසඳුම් වලට ලක්වේ.

ඔ) 2012 හා 2013 වර්ෂයන් සඳහා ගෙවිය යුතු විශ්‍රාම වැටුප වූ 3,033,329,200 වටිනාකම කපා හැරිම සඳහා අංක 535/04 දරණ අධ්‍යක්ෂ මණ්ඩලය රුස්විමේදි, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමි වි ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 නිති රිති වලට අනුකූල නොවිම

අ ) i,iii,iv අවුරුදු 60 සම්පූර්ණ වූ විශ්‍රාම වැටුප්ලාභින්ගේ අයදුම්පත් හා අදාළ සියලු ලේඛණ නිවැරදිව ප්‍රධාන කාර්යාලය වෙත කඩිනමින් යොමු කරන මෙන් මේවන විටත් දුරකථන මාර්ගයෙන් දිස්ත්‍රික් කාර්යාල වෙත දැනුම් දී ඇති නමුත්, මෙම පිළිතුරු වාර්තාවේ (02) (ඇ) හි සඳහන් පරිදි නැවත වතාවක් ලිඛිත උපදෙස් ලබාදීමට කටයුතු කරනු ලැබේ.වයස 60 සම්පූර්ණ විමෙන් පසු ගොවින්ට අදාල ප්‍රතිලාභ ලබා ගත හැකි බව ගොවින් බඳවා ගැනිමේදි මෙන්ම ගොවින්ගේ ගොවි විශ්‍රාම වැටුප් අය කිරිමේ පාස් පොතෙහි සටහන් කර ඇත.ඒ අනුව ගොවින් අදාල ගොවි විශ්‍රාම වැටුප් ලබා ගැනිම පිළිබඳ දැනුවත් කර ඇති බව පෙන්වා දෙමි.මිට අමතරව වයස අවුරුදු 60 සම්පූර්ණ වන ගොවින්ගේ නාම ලේඛන එම දිස්ත්‍රික් කාර්යාල ලවට යවා ගොවින් දැනුවත් කිරිම සිදු කර ඇත.

V) වයස අවුරුදු 60 සම්පූර්ණ වි මෙතෙක් ගොවි විශ්‍රාම වැටුප් ලබා නොගත් ගොවින් මේ වන විට දැනුවත් කර ඇති අතර, සියළුම දිස්ත්‍රික් කාර්යාල සහකාර අධ්‍යක්ෂවරුන් මෙම කටයුත්ත ප්‍රමුඛ කාර්යයක් සේ සලකා කටයුතු කර ඇත.

ii 12 (ඇ) වගන්තිය

I. වයස අවුරුදු 60 සම්පූර්ණවූ ගොවින් දැනුවත් කිරිම සඳහා මණ්ඩලය විසින් මේ වන විට පියවර ගෙන ඇති අතර, දිස්ත්‍රික් කාර්යාල මගින් අදාල ගොවින් වෙත දැනුවත් කිරිමේ ලිපි යැවිමට කටයුතු කර ඇති බව පෙන්වා දෙමි.මේ වන විට ප්‍රමාදයකින් තොරව අදාල අයදුම්පත්‍ර ලැබෙන බවද දන්වා සිටිමි. නිසි පරිදි දායක මුදල් ගෙවීම් නොකල දායකයන් හට ශුද්ධ වාර මුදල් හා පොලිය ගෙවීම් සිදු කරන බව 2014 අංක 452/12 දරණ ගැසට් පත්‍රයේ 13 වන නියෝග මඟින් දක්වා ඇත. ඒ අනුව අදාල ගොවින් වෙත ශුද්ධ වාරික ගෙවිම සිදු කර ඇති බව පෙන්වා දෙමි.

**II.** පිළිවෙලින් මාස 06ක් විශ්‍රාම වැටුප් ලබා ගනු නොලබන ගොවි මහතුන්ගේ නම් විශ්‍රාම වැටුප් ලේඛණයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලබයි.

III. ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය 1987 වර්ෂයේ ආරම්භ කරන ලද යෝජනා ක්‍රමයක් බැවින් මුල් වකවානුවේදී පරිගණක පද්ධතියක් පවත්වාගෙන ගොස් නොමැත. වාරික සටහන් පොත් පවත්වා ගැනීම තුලින් වාරික ගෙවීම් හඳුනා ගැනීමට හැකිවන පරිදි ක්‍රමවේදයන් සකසා ඇත. වාරික අයවීමේ එෆ්.එස්.බී 5 කුවිතාන්සි වාර්තා දිස්ත්‍රික් කාර්යාලය තුලද පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත. මෙම දුර්වලතාවයන් මඟහරවා ගැනීම සඳහා නව පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරිමට අවශ්‍ය කටයුතු මේ වනවිට ක්‍රියාත්මක කර ඇත. GIZ ආයතනයේ ආධාර මත E.R.P මෘදුකාංගය මිලදි ගෙන ඇති අතර මණ්ඩලයට අවශ්‍ය පරිදි පද්ධතිය නවිකරණය කර ඇත. එම පද්ධතිය ස්ථාපිත කිරීමත් සමඟ බැංකු පද්ධතිය සමඟ සෘජු සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් දත්ත ඇතුලත් කර ගැනීමට හැකියාව උදාවනු ඇත.

IV. පැවති සේවක හිඟය මත පසු වාරික පරිගණකගත කිරීම සිදු කිරීමට නොහැකි වූ අතර 2022 වර්ෂයේ සිට නැවතත් පසු වාරික පරිගණකගත කිරීම ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

(iii) නිසි පරිදි දායක මුදල් ගෙවීම් නොකර දායකයන් හට ශුද්ධ වාර මුදල් හා පොලිය ගෙවීම් සිදු කරන බව 1987 අංක 452/12 දරණ ගැසට් පත්‍රයේ 13 වන නියෝග මඟින් දක්වා ඇත. එම ගණනය කිරීම් ජීවගණිතඥයෙකු විසින් සිදු කර ඇත.

**iv) 15,15(2),15(3),15(4) 15(5) වගන්තිය**

i) දායකයා නොකඩවා වාරික 5 ගෙවීම පැහැර හැරියහොත් දායකත්වය අවලංගු වන බව වාරික සටහන් පොතේ සඳහන් කර ඇත. වාරික 5 ගෙවීම පැහැර හැරියහොත් සහතික ඔප්පුව අවලංගු වන බව 1987 අංක 12 දරණ ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම පනතේ 15(1) වගන්තිය යටතේ සඳහන් කර ඇත. ගොවින් අදාල යෝජනා ක්‍රමයට බඳවා ගන්නා අවස්ථාවේදීම ගොවින් දැනුවත් කර ඇති බව පෙන්වා දෙමි.

(ii) 1987 අංක 12 දරණ ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම පනතේ 15(1) වගන්තිය ප්‍රකාරව වාරික 5 ගෙවීම පැහැර හැර ඇති ගොවි මහතුන්ගේ ප්‍රතිලාභයන් අහිමි වනු ඇත. වාරික ගෙවීමේදී සලකා බලනු ලබන්නේ ඔහු ගෙවනු ලබන වාරිකය කවදා ගෙවිය යුතු වාරිකයක්ද යන්නයි. ඒ අනුව කිසියම් වාරිකයක් කන්න 5ට වඩා එනම් වසර 2 ½ කට වඩා ප්‍රමාද වුවහොත් ඔහුගේ සහතික ඔප්පුවේ සඳහන් ප්‍රතිලාභ අහිමි වනු ඇත.

<u>v.) 27 (1) වගන්තිය</u>

2010 හා 2011 වර්ෂවලදී ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා එම යෝජනා ක්‍රමයේ මුදල් නොමැති වීම නිසා මුදල් අමාත්‍යාංශය විසින් ලබාදී ඇති නිර්දේශ අනුව කෘෂි රක්ෂණ හා ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම තුලින් මුදල් ලබාගෙන ගෙවීම් සිදුකර ඇත. මෙම ණය මුදල් ක්‍රමිකව ප්‍රතිපූරණය කරනු ලැබේ.

<u>ආ.සහතික ඔප්පුවේ 6 වන වගන්තිය</u>

ඕනෑම දායකයෙකු අවලංගු නොවී ගෙවිය යුතු වාරික ප්‍රමාණයෙන් 75% වඩා ගෙවීම් කර ඇත්නම් ඔහුට අඩුකල විශ්‍රාම වැටුපක් සකසනු ලබයි. එසේ අඩුකල විශ්‍රාම වැටුප් සැකසීම සඳහා දායකත්වය අවලංගු නොවී 75% වඩා වාරික ප්‍රමාණයක් ගෙවා තිබිය යුතුවේ.

<u>ඇ.)2014 මාර්තු 14 දිනැති අංක 1853/49 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ 5 (ආ) ඡේදය</u>

ශුද්ධ වාරමුදල් ලබාගැනීම සඳහා නියමිත සියලු ලේඛන සමග ඉල්ලීමේ ලිපිය ඉදිරිපත් කලයුතු වන අතර ශුද්ධ වාරමුදල් ගෙවීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම ලෙස සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග මේ වන විට ගෙන ඇත.

(ඇ) <u>2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 9 (1) වගන්තිය</u>

1987 අංක 12 දරණ ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත මගින් ආරම්භ කර ගොවි හා ධීවර ජනතාවට සේවය සැලසීමේ අරමුණෙන් මෙම යෝජනා ක්‍රමය ආරම්භ කරන ලදි. මෙම යෝජනා ක්‍රමය යටතේ ගොවි හා ධිවර ජනතාවගෙන් වාරික ලෙස අයකරගන්නා ලද මුදල් මගින් අරමුදලක් ගොඩනගන ලද අතර, එම අරමුදල සතු මුදල් මගින් නැවත ඔවුන් වෙත

ගොවි හා ධිවර විශ්‍රාම වැටුප් ගෙවිය යුතු වේ.මෙය සමාජ ආරක්ෂණ දැල (Social Security Network )යටතේ ක්‍රියාත්මක වන යෝජනා ක්‍රමයක් වන අතර අදායම් බදු ගෙවීම සඳහා ලාභ ඉපයීමක් සිදු කරනු නොලැබේ.
මෙම යෝජනා ක්‍රමය ආරම්භයේ සිටම රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් ලෙස බදු අය කිරීම සිදු නොකරන ලද අතර,1979 අංක 28 දරණ දේශීය ආදායම් බදු පනත මගින් හා 2006 අංක 10 දරණ දේශීය ආදයම් බදු පනත මගින් ද මෙම මණ්ඩලය බදු නිදහස් ආයතනයක් ලෙස ප්‍රකාශයට පත් කර තිබූ අතර, සමාජ ආරක්ෂණ පනත යටතේ ගොවි ජනතාවට හා ධිවර ජනතාවට සමාජ ආරක්ෂණය සපයන මෙම ආයතනය 2017 අංක 24 දේශීය ආදායම් බදු පනත යටතේ බදු නිදහස් නොමැති ආයතනයක් ලෙස නම් කර නොමැති බැවින් අදාල බදු නිදහස් කිරීම ලබා ගැනීම සඳහා තව දුරටත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සාකච්ඡා කරමින් පවතී.
මණ්ඩලයේ සියළුම යොජනා ක්‍රම වලට අදාලව ආයු ගණක තක්සේරු ලබා ගැනීමට කටයුතු කරමින් පවතින අතර, අදාල වාර්තා ලබා ගැනීමෙන් පසුව ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

<u>(ඉ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි (177(3)</u>

දිස්ත්‍රික් කාර්යාල,විවිධ සේවා සමුපකාර සමිති,හා එම සමිති යටතේ පවතින ග්‍රාමීය බැංකු මගින් ගොවින්ගෙන් පසු වාරික අයකිරීම වෙනුවෙන් රු.7.00ක කොමිස් මුදලක් ගෙවනු ලැබේ. අදාල නියෝජිත ආයතන වලින් හා දිස්ත්‍රික් කාර්යාලවලින් අය කරන ලද වාර මුදල් බැංකු ගත කිරීමේදි අදාල ආදායම පමණක් බැංකු ගත කරන අතර, පසු වාරික ආදායම ගිණුම් ගත කිරීමේදි අදාල මුළු මුදලම ආදායමට ගිණුම් ගත කර ඇත.කොමිස් වියදම වියදමක් ලෙස ගිණුම් ගත කර ඇති අතර, අදාල ආදායම නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත.

(ඊ) වාහන තක්සේරු කිරීම සඳහා ස්වාධින වෘත්තිමය පලපුරුද්දක් ඇති Auto Mobile Association of Ceylon යන ආයතනය මගින් වාර්තා ලබා ගෙන ඇත.

<u>3.2 අවිධිමත් ගණුදෙනු</u>

අ) ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වන ගොවි මහතුන් හට ගොවි විශ්‍රාම වැටුප් පනතේ 4 ආ, ඇ සහ ඈ වගන්ති අනුව විශ්‍රාම වැටුපට අමතරව මරණ පාරිතෝෂිතයක් හා පූර්ණ අර්ධ බෙලහීන දීමනාවක් ලබා දිය යුතුවේ. ලබා දෙනු ලබන එම රක්ෂණ ආවරණය වෙනුවෙන් කන්නයක් සඳහා රු.30/- රක්ෂණ ගාස්තුවක් අය කරනු ලබයි.

ආ) සහතික ඔප්පුවේ සඳහන් පරිදි වාරික මුදල් ගෙවනු නොලබන දායකයන්ගේ දායකත්වය අවලංගු වන අතර, එම දායකයන්ගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වූ අවස්ථාවේදී ශුද්ධ වාර මුදල් හා පොලිය ගෙවීම සිදු කරනු ලබයි.

<u>3.3 කාර්යය සාධනය</u>

අ) අදාල ගෙවීම් සිදු කිරීම කඩිනමින් සිදු කැ ඇති අතර, මේ වන විට අදාල මාසය තුලදි ලැබෙන අයදුම්පත්‍ර සඳහා ඊලග මාසයේදි ගොවි විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කර ඇත.

ආ) වර්ෂය ආරම්භයේදී ගොවි විශ්‍රාම වැටුප් බෙලහීන මාසික දීමනා ගෙවනු ලබන ගොවීන්ගේ ජීව දත්ත තොරතුරු ලබාගනිමින් ගොවීන් පිළිබඳ විස්තර රැස්කරනු ලැබේ.

ඇ) I,II,III,IV,v

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දායකත්වය ලබා ඇති ගොවි මහතුන් වයස අවුරුදු 60 සම්පූර්ණ වීමට පෙර දැනුවත් කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් සැකසීමට අපේක්ෂා කෙරේ. සියළුම දිස්ත්‍රික්ක වල වයස අවුරුදු 60 සම්පූර්ණ වීමට ආසන්න ගොවි මහතුන්ගේ නාමලේඛණය දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂවරුන් වෙත ලබාදීමට කටයුතු කර ඇත. ඒ අනුව ඔවුන් ගොවිජන සේවා මට්ටමින් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස දැනුම් දී ඇත.

3.4 කළමනාකරණ ක්‍රියාකාරකම්

අ) ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය 1987 වර්ෂයේ ආරම්භ කරන ලද යෝජනා ක්‍රමයක් බැවින් මුල් වකවානුවේදී පරිගණක පද්ධතියක් පවත්වාගෙන ගොස් නොමැත. වාරික සටහන් පොත් පවත්වා ගැනීම තුලින් වාරික ගෙවීම් හඳුනා ගැනීමට හැකිවන පරිදි ක්‍රමවේදයන් සකසා ඇත. වාරික අයවීමේ එෆ්.එස්.බී 5 කුවිතාන්සි වාර්තා දිස්ත්‍රික් කාර්යාලය තුලද පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත. මෙම දූර්වලතාවයන් මඟහරවා ගැනීම සඳහා නව පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු මේ වනවිට ක්‍රියාත්මක කර ඇත. GIZ ආයතනයේ ආධාර මත E.R.P මෘදුකාංගය මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු මේ වනවිට අවසන් කර එම පද්ධතිය ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. එම පද්ධතිය ස්ථාපිත කිරීමත් සමඟ බැංකු පද්ධතිය සමඟ සෘජු සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් දත්ත ඇතුලත් කර ගැනීමට හැකියාව උදාවනු ඇත.

ආ) I) නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් දිස්ත්‍රික් මට්ටමෙන් පුහුණු වැඩසටහන් පවත්වමින් දැනුවත් කිරීම් සිදු කිරීමට කටයුතු කල අතර දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂවරුන් ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් දැනුවත් කිරීමට කටයුතු කර ඇත. ගොවිජන සේවා මඟින් ලැබෙන ඉල්ලුමට අනුව අදාල අයදුම්පත් ලබාදීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.

II) දායකයන්ගේ පසු වාරික අයවීම් පරික්ෂා කිරීම් සම්බන්ධයෙන් පහත ක්‍රියාකාරකම් සිදු කර ඇත.

- බැංකු ස්ථාවර නියෝග මගින් ලැබෙන පසු වාරික වාර්තාවක් තබා ගැනීම සිදු කරනු ලබයි.
- SMS මගින් වාරික ගෙවන ලෙස දායකයන් දැනුවත් කිරීම මේ වන විට ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව 2023 ඔක්තෝම්බර් පලමු කන්නයේදී ඔබගේ ගොවි විශ්‍රාම වැටුප් වාරික ස්තාවර නියෝග මඟින් ගෙවීමේදී ඔප්පු අංකය මණ්ඩලය වෙත යොමු වන බවට බැංකුව මඟින් තහවුරු කරගන්නා ලෙස දායකයින් දැනුවත් කරන ලදී. මෙලෙස SMS පණිවිඩ මගින් වාරික ගෙවීම් පැහැරහැරීම වලක්වා ගැනීම සඳහා දැනුවත් කිරීම් ආරම්භ කරන ලදී.
- ඉදිරියේදී 1918 සේවාව මගින් දායකයන්ට දුරකතනයෙන් දැනුවත් කිරීම් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සකස් කරමින් පවතී.

III.) SMS මඟින් වාරික ගෙවීම දැනුම් දීම සඳහා සහ දායකයින් දැනුවත් කිරීම සඳහා සිදු කල යුතු තාක්ෂණික කටයුතු මේ වන විට සිදු කර අවසන් කර ඇත. ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ පමණක් නොව මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරනු ලබන අනෙකුත් රක්ෂණ යෝජනා ක්‍රම සම්බන්ධයෙන්ද සේවා දායකයන් දැනුවත් කිරීම සඳහා මෙම SMS ක්‍රමවේදය යොදාගත හැක. එහිදී තාක්ෂණික කටයුතු අවසන් කිරීමෙන් පසු තොරතුරු තාක්ෂණ අංශය වෙත ලබා ගනු ලබන SMS පණිවිඩය දායකයන් වෙත යැවීමට කටයුතු කරනු ලැබේ.

IV.) නියෝජිත ජාලය මඟින් දායකයින් දැනුවත් කිරීම අමතර පිරිවැයක් දැරීමට සිදුවන බැවින් SMS පණිවුඩ ක්‍රමය යොදාගැනිමට මණ්ඩලය විසින් කටයුතු කර ඇත.

ඇ) 1987 වර්ෂයේදී ආරම්භ කරන ලද ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ වාරික අයවීම් ගොවියා වෙත ලබා දෙනු ලබන වාරික සටහන් පොත තුල සටහන් කිරීම තුලින් හඳුනාගත හැකි අයුරින් සකසා ඇති මෙම වාරික සටහන් පොත්වල තොරතුරු සමීක්ෂණය මඟින් එක්කොට පිටපත් ලබා ගැනීම සඳහා

කටයුතු සිදු කලද අදාල සමීක්ෂණ කටයුතු මඟින් තොරතුරු ලබා ගැනිම ඉතා දුෂ්කර වීම නිසා අපේක්ෂිත ලෙස තොරතුරු ලබා ගැනීමට නොහැකි විය.

(ඉ) දිස්ත්‍රික් කාර්යාල වෙත ලේඛන ලද දිනයට අදාල දින මුද්‍රා තැබීම ඇතැම් දිස්ත්‍රික්කවල පැවති නිලධාරී හිගය මත ඇතැම් අවස්ථාවල අතපසුවී තිබුනද ඉදිරියේදී ලැබෙන සියලු ලේඛනවල දින මුද්‍රා තැබිය යුතු බව 06/07/2022 දිනැති අභ්‍යන්තර විගණන වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා යොමු කරන ලද උපදෙස් ලිපිය මගින් 2023 වසරේදී දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කර ඇත.

(ඊ) විශ්‍රාම වැටුප් ඉල්ලීමේ ආකෘති පත්‍ර වරින් වර ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත යොමු කරන අතර මෙම විගණන වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා මින් ඉදිරියේදී මසකට (දින 30කට) වරක් ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙතින් එම ආකෘති පත්‍ර පවති දැයි සොයා බලා අවශ්‍යතාවය මත යම් නිශ්චිත ප්‍රමාණයක් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙනු ඇත.

(උ) ගොවින් විසින් දිස්ත්‍රික් කාර්යාල වෙත අයදුම්පත් භාර දීමේදි අදාල වාර්තා නිවැරදිව හා සම්පූර්ණව භාර නොදෙන අවස්ථාවලදි එම තොරතුරු නිවැරදිව භාර දෙන තෙක් දිස්ත්‍රික් කාර්යාල තුල දිස්ගොවි මහතෙකු විශ්‍රාම වැටුප් ලබාගැනීම සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේදී Google drive යාවත්කාලින කර යොමු අංකයක් (Reference Number) ලබා දීමට කටයුතු කරන ලෙස නැවත උපදෙස් ලබාදීමට කටයුතු කරනු ලැබේ.

ඌ.) I මණ්ඩලයට අදාලව ප්‍රධාන වශයෙන් යෝජනා ක්‍රම 3ක් පවතින අතර රක්ෂණ යෝජනා ක්‍රමය තුලින් අනෙකුත් ක්‍රම මෙන්ම ජීවිත රක්ෂණයද ක්‍රියාත්මක කල යුතු බැවින් මෙම රක්ෂණය ක්‍රියාත්මක කිරිම, එනම් වාර මුදල් රැස් කිරිම අරමුදල් ගොඩ නැගිම හා ගෙවීම් සිදු කිරිම කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය මගින් සිදු කරනු ලැබේ.

ii.) මෙම අරමුදල සකසා ඇත්තේ ගොවි විශ්‍රාම වැටුප් ගෙවීමට නොව මරණ හා බෙලහානි දීමනා ගෙවීමට වන නිසා ගොවි විශ්‍රාම වැටුප් ගෙවීමට ලබා දුන් මුදල අහිමි වන ආයෝජන ආදායම ද සහිතව ලබා ගැනිම සඳහා ගිණුම් ගත කරනු ලබයි.

iii.) ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ආරම්භයේදි මෙම ජීවිත රක්ෂණ ආවරණය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මගින් ආවරණය ලබා ගත් අතර, එහිදි ගොවියෙකු සඳහා දායක මුදල රු.60/- බැගින් එම ආයතනයට ගෙවමින් ආවරණය ලබා ගන්නා ලදි.1994 වර්ෂයේදි එම ජීවිත රක්ෂණ අවධානම මණ්ඩලය විසින් දැරිමට භාර ගන්නා ලද අතර, එම අරමුදල මණ්ඩලය තුල ගොඩ නගන ලදි. මෙහි උපරිම ආවරණය රු.50,000/- බැවින් අනපේක්ෂිත තත්ත්වයක් ඇති වුවහොත් විශාල වන්දි මුදලක් නිදහස් කිරිමට සම්භාවිතාවයක් පවති. ආයු ගණක තක්සේරු වාර්තා ලබා ගැනිම සඳහා කටයුතු ආරම්භ කර ඇති අතර, එහිදි ලබා දෙනු ලබන වාර්තාවට අනුව කටයුතු කරනු ලැබේ.

iv.) ආයු ගණක තක්සේරු වාර්තා ලබා ගැනිමේදි මෙම අරමුදල ඇතුලත් කර ඇත. අදාල වාර්තාව ලබා ගැනිමෙන් පසුව ඉදිරි කටයුතු සිදු කිරිමට අපේක්ෂා කෙරේ.

**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මත**

**1.2 මතය සඳහා පදනම**

**(අ)** දීර්ගකාලීන ලී බඩු හා සවි කිරීම් පරිඝණක උපාංග කාර්යාල උපකරණ ආදිය භාවිතා කලද එම උපකරණ අගය කර ඵලදායී ජීවිත කාලය තක්සේරු කල නොහැක. බොහෝමයක් වත්කම් ඉවත් කල යුතු තත්වයේ පවතින අතර පරිඝණක වැනි උපකරණ යාවත්කාලීන කල හැකි තත්වයේ නොපවතියි. මෙම වත්කම් පූර්ණ කාර්යක්ෂමතාවයෙන් භාවිතා කල නොහැකි තත්වයේ පවතින බැවින් ඉදිරියේදී ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

**(ආ)** i. පෙර වර්ෂයට අදාලව ගැලපිමක් ලෙස රු 98000/- ක මුදලක් මෙම වර්ෂයේදි නිවැරදි කිරිම සිදු කරන ලද බැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේද ඇතුලත් කර ඇත.

ii. iii. iv මෙහෙයුම් ක්‍රියාකාරම් සඳහා කරන ලද ගැලපිම හා ආයෝජන ක්‍රියාකාරම් තුලින් සිදු කර ඇති ගැලපිම් නිවැරදි කිරිමට කටයුතු කරනු ලැබේ.

**(ඇ)** මණ්ඩලයේ අළුතින් ආරම්භ කර ඇති අනෙකුත් සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සමග ආයුගණක තක්සේරු සිදුකිරීමට කටයුතු කරනු ලබන අතර, එය 2024 වර්ෂයේ අයවැය ලේඛණය තුළ ඇතුලත් කර ඇති අතර මේ වන විට අදාල කටයුතු සිදු කර ගෙන යන බව පෙන්වා දෙමි.

**(ඈ)** මෙම නිලධාරීන් බඳවාගෙන ඇත්තේ මෙම යෝජනා ක්‍රමයේ රාජකාරී ඉටු කිරීමට වන අතර වර්තමානයේ වෙනත් රාජකාරි කටයුතු සිදු කරනු ලබයි. යෝජනා ක්‍රමයට අයත් රාජකාරි චක්‍රාකාරයෙන් වෙනත් නිලධාරීන්ද සිදු කරනු ලබන නිසා මෙම නිලධාරීන්ගේ වැටුප යෝජනා ක්‍රමයට ඇතුලත් කර ඇත. ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් බඳවා ගැනීමෙන් පසු යෝජනා ක්‍රමයට අදාල සේවකයින්ගේ වැටුප් යෝජනා ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීමට නියමිතය.

**(ඉ)** මෙම යෝජනා ක්‍රමය ස්වයං මූල්‍ය පදනමකින් ක්‍රියාත්මක නොවන අතර, වාරික තීරණය කිරීමේදී රාජ්‍ය සහනාධාරයට අන්තර්ග්‍රහණය කිරීම නිසා මෙම තත්වය උද්ගත වී ඇත. ඒ අනුව වාර්ෂිකව ගෙවිය යුතු විශ්‍රාම වැටුප් වගකීම ඉහළ යනු ලබන අතර එම නිසා ශුද්ධ වත්කම් අගයද අඩු වේ. එම හේතු නිසා මෙම යෝජනා ක්‍රමය සඳහා නව බඳවා ගැනීම් සිදු කිරීම ප්‍රවර්ධනය නොකරයි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුලදී ආයෝජන පොලි ආයෝජන පොලි ආදායම හඳුනා ගැනීමේදී සම්පූර්ණ පොලි ආදායම හඳුනා ගෙන එය ගිණුම්ගතකර ඇත.වර්ෂය අඩුකරගන්නා ලද රඳවා ගැනීමේ බදු වියදමක් නොවන අතර,කෘෂි කාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සමස්ථ ගිණුම් පිළියෙල කිරීමේදී මණ්ඩලය සඳහා ආදායම් බදු ගණනය කිරීම සිදුකරන අතර එසේ ගණනය කරන ලද ආදායම් බදු සඳහා අඩු කිරීමක් වශයෙන් මෙම රඳවා බදු මුදල් ගිණුම්ගත කර ඇති අතර,ඒ සඳහා වන සම්බන්ධිත පාර්ශව සඳහා ඇති ජංගම ගිණුම තුලින් ගැලපීම් කර ඇත.

**1.3 මූල්‍ය ප්‍රකාශණ පිළිබඳ කළමණාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.**

**1.4 මූල්‍ය ප්‍රකාශණ සම්බන්ධයෙන් විගණකගේ වගකීම.**

**2. වෙනත් නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව.**

**3. මෙහෙයුම් සමාලෝචන**

**3.1 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**(අ) i 5 වගන්තිය**

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය මේ වන විට මූල්‍ය ශක්‍යතාවයක් සහිතව ක්‍රියාත්මක කිරීමට කටයුතු සම්පාදනය කර ඇත. එම කටයුතු පරිගණක ගත පරිසරයක් තුල සිදුකිරීම සඳහා මේ වන විට පූර්ණ පරිගණක දත්ත පද්ධතියක් සකස් කරමින් පවතී. ඒ අනුව මෙම යෝජනා ක්‍රමය සඳහා ධීවරයින් ආකර්ශණය කරගැනීමට 2024 වර්ෂය තුළදී ධීවර අමාත්‍යාංශය සමග ඒකාබද්ධව නව ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හඳුන්වාදීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී.

**ii 7 වගන්තිය**

වයස අවුරුදු 60 සම්පූර්ණ වන දායකයින්ගේ ලැයිස්තු දිස්ත්‍රික් කාර්යාල මට්ටමින් ලබාගෙන ඒ ඒ දිස්ත්‍රික් කාර්යාල වෙත යවා ඇති අතර, එම ලැයිස්තු පදනම් කරගෙන විශ්‍රාම වැටුප් හිමි ධීවරයින්ව දැනුවත් කිරීමේ වැඩසටහනක් ආරම්භ කර ඇත.

ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාල මෙහෙයුම් කටයුතු ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් සිදුකරන බැවින් මෙම තත්වය එම දෙපාර්තමේන්තුව වෙත දැනුම්දීමට කටයුතු කර ඇත. තවද, දිස්ත්‍රික් ධීවර කාර්යාල මගින් සිදුකරන දැනුවත් කිරීම් වලට අමතරව පුවත්පත් දැන්වීමක් මගින් ධීවර ජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

ප්‍රමාද වී ලැබී ඇති අයදුම්පත් සඳහා ප්‍රමාදවීමට හේතුවූ කරුණු දන්වන තුරු හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම සිදුනොකරන ලදී. මේ වන විට හිඟ විශ්‍රාම වැටුප් සහිතව විශ්‍රාම වැටුප් ගෙවීම සිදුකරනු ලබයි.

**iii 13 (ඇ) වගන්තිය**

මණ්ඩලය විසින් දැනට දායකයා ගෙවූ වාරික පදනම් කරගනිමින් එම වාරික සඳහා පොළී අනුපාතයක් ගෙවනු ලබන අතර, මෙම ශුද්ධ වාරික ගෙවීම ජීවගණිතඥයෙකුගේ උපදෙස් මත සිදුකරනු ලබයි.

**iv 16 වගන්තිය**

මේ පිළිබඳව දායකයින් විශ්‍රාම වැටුපට දායක කරගැනීමේදී ඔවුන් වෙත ලබාදෙනු ලබන විශ්‍රාම වැටුප් ඔප්පුවේ පැහැදිලිව සටහන් කර ඇති අතර, දායකයින්ගේ වාරික අයකර ගනු ලබන්නේ දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති නිළධාරීන් මගින් වන අතර, එම දායකයා දායකත්වය අවලංගු වූ අයෙක්ද යන වග සොයා බලා වාරික මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් අඛණ්ඩව ඔවුන් වෙත ලබාදීමට මණ්ඩලය විසින් කටයුතු කරනු ලබයි.

**v 20 වගන්තිය**

ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ නව බඳවාගැනීම් 2023 වර්ෂයතුළදී ආරම්භ කිරීමට නියමිත බැවින් ධීවර විශ්‍රාම වැටුප් උපදේශක කාරකසභාව මෙම වර්ෂය තුළ කැඳවීමට කටයුතු කරනු ලැබේ.

(ආ) කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩල පනතට අනුව සේවය කරන මණ්ඩලීය නිලධාරීන් වෙත ධීවර අමාත්‍යාංශයට අයත් ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අතිරේඛ වැඩ කොටසක් පැවරී ඇත.ඒ අනුව ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ මෙම මණ්ඩලීය කාර්යභාරය වෙනුවෙන් වෙනමම කාර්යමණ්ඩලයක් අනුමත නොවීම හේතුවෙන් මෙම වැඩ ආවරණය කිරීම වෙනුවෙන් ගෙවනු ලබන මෙම දීමනා සඳහා වන මුදල් ධීවර අමාත්‍යාංශයෙන් මෙම මණ්ඩලය වෙත ලබා දේ.එය 1991 වර්ෂයේ ධීවර විශ්‍රාම වැටුප ආරම්භ කල දිනයේ සිට ගෙවා ඇත.

මෙම ගෙවීම් සඳහා පහත සඳහන් අනුමැතීන් ලැබී ඇත.

- ධීවර විශ්‍රාම වැටුප් උපදේශන කාරක සභා අනුමැතිය.
- අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය.
- විෂයභාර අමාත්‍ය රාජ්‍ය ලේකම්ගේ අනුමැතිය.

**3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

2022 ජුලි මස සිට මෙම අරමුදල ධිවර අමාත්‍යාංශය යටතට ගැසට් කර ඇත. ධිවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ආරම්භයේ සිටම ධිවර අමාත්‍යාංශයේ ලේකම් වරයෙකු විසින් අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය

කරනු ලබන බැවින් , මේ දක්වා ධීවර අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදි මෙම අරමුදල පිළිබඳ අවධානය යොමු කර නොමැත.

ඩබ්. එම්. එම්. බී. වීරසේකර,

සභාපති,

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය.